# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,491 - 2026 මැයි මස 29 සිකුරාදා - 2026.05.29**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස (II අ) වැනි කොටස - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු ඇබෑර්තු … … | 2240 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය … … … … … | 2251 |

**සතිපතා නිකුත් වන *ගැසට්* පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාර ගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම ගැසට් පත්‍රය පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2026 ජුනි මස 19 දින පළකෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2026 ජුනි මස 05 දින දහවල් 12.00 ට හෝ ඊට පෙර තැපැලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාර දිය යුතුය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."

**ප්‍රසන්න ජයරත්න,**
රජයේ මුද්‍රණාලයාධිපති

2026 අප්‍රේල් මස 02 දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

2237 - B 82792 - (2026/05)
E - 01

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට්* පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

2. සේවා කොන්දේසි - සාමාන්‍ය :

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අනිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ෂඪ වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමඟම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

5. යුද්ධ සේවා අනුග්‍රහය

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (I) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

# විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපෙදස්

අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :

"1968 අංක 25 දරන විභාගපනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,

(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,

(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,

(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,

(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,

(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාගශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාගඅපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. ඊ"

(i)විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii)යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන, රෙදි කැලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii)යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

විභාග කොමසාරිස් ජනරාල්.

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු ඇබෑර්තු

**අධිකරණ සේවා කොමිෂන් සභාව**

වකුෆ් විනිශ්චයාධිකාරයට සභාපති හා සාමාජිකයින් පත්කිරීම - 2026

1982 අංක 33 දරන පනතින් සංශෝධිත 1956 අංක 51 දරන මුස්ලිම් පල්ලි සහ පුණ්‍ය භාර හෝ වකුෆ් පනත යටතේ වකුෆ් විනිශ්චයාධිකාරයට සභාපති හා සාමාජිකයින් පත්කිරීම සඳහා, අධිකරණ සේවා කොමිෂන් සභාව අයදුම්පත් කැඳවයි.

02. අයදුම්කරුවන් ශ්‍රී ලංකාවේ පුරවැසියන්වන මුස්ලිම්වරුන් විය යුතු ය.

03. මෙහි පහත දක්වා ඇති ආකෘති පත්‍රය අනුව සැකසූ අයදුම්පත්, ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ "වකුෆ් විනිශ්චයාධිකාරය" යනුවෙන් සඳහන් කොට **2026 ජුනි මස 26** දින හෝ ඊට පෙර ලියාපදිංචි තැපෑලෙන් මා වෙත ලැබෙන සේ එවිය යුතු ය. අයදුම්පත් සමග ලිපි ලේඛනාදියෙහි මුල්පිටපත් එවිය යුතු නොවේ.

04. පහත සඳහන් ලිපි ලේඛනවලින් එකක් හෝ සියල්ලම හෝ ඉල්ලා සිටින විට ඉදිරිපත් කිරීමට අයදුම්කරුවන්ට හැකිවිය යුතු ය.

(*අ*) උප්පැන්න සහතිකය;
(*ආ*) උසස්ම අධ්‍යාපන සහතිකය;
(*ඇ*) වෘත්තිය සුදුසුකම් පිළිබඳ සහතිකය;
(*ඈ*) සිංහලෙන්/දෙමළෙන්/ඉංග්‍රීසියෙන් සමත් වී ඇති උසස්ම විභාගය පිළිබඳ සහතිකය.

05. රජයේ/සංස්ථා සේවයේ නියුක්තව සිටින නිලධාරීන්ගේ අයදුම්පත් තම දෙපාර්තමේන්තු/සංස්ථා ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතු ය.

06. අයදුම්පත් සහ ඊට අදාළ වෙනත් ලිපි සම්බන්ධයෙන් අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම්වරයා වෙත ආමන්ත්‍රණය කළ යුතු ය.

**ආනන්දි කනගරත්නම්,**
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්,
අධිකරණ සේවා කොමිෂන් සභාව.

2026 මැයි මස 29 දින,
තැ. පෙ. 573,
කොළඹ 12,
අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේ දී ය.

**අධිකරණ සේවා කොමිෂන් සභාව**

**වකුෆ් විනිශ්චයාධිකාරයට පත්කිරීම සඳහා වන ආදර්ශ අයදුම්පත**

දිස්ත්‍රික්කය :-

1. මුලකුරු සමග නම :

උ: අබ්දුර් රහ්මාන් එම්. අයි.

2. සම්පූර්ණ නම :

උ: මුහම්මදු ඉෂ්හාක් අබ්දුර් රහ්මාන්

3. ස්ථිර පදිංචිය :

4. ලිපිනය :

5. උපන් දිනය : | ව | ව | ව | ව | මා | මා | දි | දි |

6. වයස :

7. ජාතිය :

8. ආගම :

9. ජා. හැ. ප. අංකය :

10. දුරකතන අංකය :

11. <u>අධ්‍යාපන සුදුසුකම්</u>

1. ...................................
2. ...................................
3. ...................................
4. ...................................
5. ...................................

12. <u>වෘත්තීය සුදුසුකම්</u>

1. ...................................
2. ...................................
3. ...................................
4. ...................................
5. ...................................

13. කියවීමට හා ලිවීමට හැකි භාෂාවන් :

14. වකුෆ් නීතිය පිළිබඳ දැනීමක් තිබේ ද? : ඔව් | නැත

15. විවාහක ද? : ඔව් | නැත

16. ඔබ නීතිඥවරයෙක් ද? : ඔව් | නැත

17. නීතිඥවරයෙකුනම් බඳවා ගන්නා ලද දිනය : | ව | ව | ව | ව | මා | මා | දි | දි |

18. ඉහත දී කරන ලද සහ දැනට කරන රක්ෂා (දිනත් සමග) :

| *සිට* | *දක්වා* | *රැකියාව* | *ස්ථානය* |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

19. ඉල්ලුම්කරු සතු දේපළ වටිනාකම : රු.

20. මාසික ආදායම : රු.

21. කොපමණ ණය ගැති ද, ඇතොත් : රු.

22. පසුගිය අවුරුදු 10 තුළ ඔබ ක්‍රියාකාරීව දේශපාලන කටයුතුවල නිරතව සිටියේ ද? ඔව් ☐ නැත ☐

23. ඔබ ආදායම් බදු ගෙවන්නෙක් ද? ඔව් ☐ නැත ☐

24. ඔබට එරෙහිව අධිකරණයක අපරාධ නඩු තිබුනේ ද? තිබේ ද? ඔව් ☐ නැත ☐

25. අධිකරණයෙන් දඬුවම් ලබා ඇතොත් ඒවායේ විස්තර :

26. පෞද්ගලික තොරතුරු විමසිය හැකි අය (ඒ අය ඔබව හොඳින් දන්නා වග කිවයුතු පුද්ගලයන් විය යුතු ය.)

| | |
|---|---|
| නම : | නම : |
| ලිපිනය : | ලිපිනය : |
| දුරකථන අංක : | දුරකථන අංක : |
| රැකියාව : | රැකියාව : |
| ඔබ දැන සිටි කාලපරිච්ඡේදය : | ඔබ දැන සිටි කාලපරිච්ඡේදය : |

මෙම අයදුම්පතෙහි මා විසින් සපයා ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බැව් සහතික කරමි.

.......................................................... ................................,

ඉල්ලුම්කරුගේ අත්සන දිනය

***සටහන :***

සියලුම සහතිකයන්හි පිටපත් ද මෙයට අමුණන්න.

05 - 345

**<u>යුද්ධ හමුදා නිත්‍ය බල හමුදාව වෙත වෙනත් වෘත්තීය නිලධාරි පුරප්පාඩු</u>**
**<u>තනතුරු සඳහා අයදුම්පත් කැඳවීම</u>**

1. ශ්‍රී ලංකා යුද්ධ හමුදා නිත්‍ය බල හමුදාවේ පහත සඳහන් වෙනත් වෘත්තීය නිලධාරි පුරප්පාඩු වෙනුවෙන් අයදුම්පත් කැඳවනු ලබයි:

(අ) සයිබර් ආරක්‍ෂණ ඉංජිනේරු.
(ආ) ගණකාධිකාරි.

2. තෝරාගනු ලබන අයදුම්කරුවන් කෙටි කාලීන යුද්ධ හමුදා මූලික පාඨමාලාවකට සහභාගී කරවන අතර, ඔවුන් බඳවාගනු ලබන නිලයෙන් අධිකාරියට පත්කොට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ අවශ්‍යතාවයන් අනුව යුද්ධ හමුදා නිත්‍ය බල හමුදාවේ රෙජිමේන්තු/ බලකා වෙත ඇතුළත් කරනු ලැබේ.

3. <u>මූලික සුදුසුකම්</u>:

| | | | |
|---|---|---|---|
| (අ) | පුරවැසිභාවය | : | ශ්‍රී ලාංකීය පුරවැසියෙකු විය යුතු ය. |
| (ආ) | විවාහක/අවිවාහක බව | : | වෘත්තීන්ට අදාළව දක්වා ඇති පරිදි වේ. |
| (ඇ) | වයස | : | බඳවා ගන්නා දිනට වයස අදාළ වෘත්තීන් යටතේ දක්වා ඇති පරිදි වේ. |
| (ඈ) | උස | : | |
| | (1) පිරිමි | : | උස අඩි 5 යි අඟල් 4 ට වැඩි විය යුතු ය. |
| | (2) ගැහැණු | : | උස අඩි 5 යි අඟල් 2 ට වැඩි විය යුතු ය. |
| (ඉ) | බර: | | |
| | (1) පිරිමි | : | බර කිලෝ ග්‍රෑම් 55 ට වැඩි විය යුතු ය. |
| | (2) ගැහැණු | : | බර කිලෝ ග්‍රෑම් 45 ට වැඩි විය යුතු ය. |
| (ඊ) | පපුව | : | පිරිමි : අඟල් 32 ට වැඩි විය යුතු ය. |
| (උ) | ශරීර ස්කන්ධ දර්ශකය | : | 18.5 Kg/m2 - 25 Kg/m2 ත් අතර විය යුතු ය. |
| (ඌ) | දෘෂ්ටි දර්ශනය | : | උපැස් රහිතව දකුණු ඇස 6/6 ලෙස සහ වම් ඇස 6/9 විය යුතු යි. තවද, දෘෂ්ටි දර්ශනය 6/18 ලෙස පවතින අවස්ථාවල දී උපැස් මඟින් දකුණු ඇස දෘෂ්ටි දර්ශනය 6/6 ලෙසත් වම් ඇස දෘෂ්ටි දර්ශනය 6/9 ලෙසත් නිවැරදි කළ හැකි අයදුම්කරුවන් තෝරාගනු ලැබේ. |

4. <u>මූලික අධ්‍යාපන සුදුසුකම්</u>:

(අ) අ.පො.ස (උ/පෙළ) විභාගයෙන් තෙවරකට නොවැඩි වාර ගණනක දී එකවර විෂයයන් තුනක් සමත්වීම (සාමාන්‍ය සාමාර්ථ) සහ සාමාන්‍ය පොදු පරීක්‍ෂණය සඳහා 30% ප්‍රතිශතයක් ලබා තිබීම හා විශ්වවිද්‍යාල ප්‍රවේශය “YES” ලෙස සඳහන්ව තිබීම.

*සහ*

(ආ) අ.පො.ස (සා/පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනක දී එකවර විෂයයන් පහකට (05) සම්මාන සාමාර්ථ සමඟ විෂයන් අටක් (08) සමත්වීම හා දෙවරකට නොවැඩි වාර ගණනක දී ඉංග්‍රීසි, විද්‍යාව, ගණිතය හා සිංහල/දෙමළ විෂයන් සඳහා සම්මාන සාමාර්ථ (C) ලබා තිබීම හෝ ඉංග්‍රීසි භාෂාව සඳහා සාමාන්‍ය සාමාර්ථ (S) පමණක් ලබා ඇති අයදුම්කරුවන් අ.පො.ස (උ/පෙළ) විභාගයෙන් ඉංග්‍රීසි භාෂාවට සම්මාන සාමාර්ථ (C) ලබා තිබීම හෝ ඉංග්‍රීසි මාධ්‍යයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන අධ්‍යාපන ආයතනයක් මඟින් උපාධි/ NVQ Level - 4 මට්ටමේ ඩිප්ලෝමා පාඨමාලාවක් හදාරා තිබීම ( NVQ සහතික පත්‍රය ඉදිරිපත් කළ යුතු යි).

*හෝ*

(ඇ) ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පිළිගනු ලබන අ.පො.ස (සා/පෙළ) හා අ.පො.ස (උ/පෙළ) විභාගයන්ට සමාන ජාත්‍යන්තර විභාගයකින් (Pearson Edexcel, GCSE, G.C.E හා Cambridge හෝ වෙනත්) ඒ හා සමාන සාමාර්ථ ලබා තිබිය යුතු ය. (ඉහත අනිවාර්යය විෂයයන් ද ඇතුළුව).

5. **<u>වෙනත් සුදුසුකම්.</u>** ජාත්‍යන්තර/ජාතික/පළාත්/දිස්ත්‍රික් මට්ටමින් ක්‍රීඩා, නායකත්ව, වෙනත් ජයග්‍රහණ සහ වෙනත් භාෂා (සිංහල හා ඉංග්‍රීසි හැර) හැසිරවීම විශේෂ සුදුසුකම් ලෙස සලකා බලනු ලැබේ.

6. **<u>පොදු උපදෙස්:</u>**

(අ) පුහුණුවීම් ලබන කාලය තුළ දී කෙඩෙට් නිලධාරින්හට විවාහවීමට අවසර දෙනු නොලැබේ. (අවිවාහක වෘත්තීන්ට අදාළ කෙඩෙට් නිලධාරින් හට පමණක්).

(ආ) මනා ශාරීරික සෞඛ්‍ය තත්ත්වයෙන් සිටිය යුතු අතර, සම්මුඛ පරීක්ෂණය සඳහා තෝරාගනු ලබන සියලුම අයදුම්කරුවන් බඳවාගැනීමට පෙර ශ්‍රී ලංකා යුද්ධ හමුදාව මගින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලබන අතර, ඉන් සමත් විය යුතු ය.

7. **<u>සයිබර් ආරක්ෂණ ඉංජිනේරු (කපිතන්)</u>**:

(අ) ස්ත්‍රී/පුරුෂ දෙපාර්ශවයටම අයදුම් කළ හැකිය.

(ආ) විවාහක/අවිවාහක දෙපාර්ශවයටම අයදුම්කළ හැකිය.

(ඇ) 2026 ඔක්තෝබර් මස 01 දිනට වයස අවුරුදු 32 ට අඩු විය යුතු ය.

(ඈ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙතින් අනුමත විශ්වවිද්‍යාලයක් වෙතින් තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයට අදාළ පූර්ණ කාලීන උපාධියක් ලබා තිබිය යුතු ය.

(ඉ) අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 2½ ක පළපුරුද්දක් තිබිය යුතුය (අධ්‍යයන හා සීමාවාසික පුහුණු කාලසීමාව පළපුරුද්ද ලෙස නොසැලකේ).

8. **<u>සයිබර් ආරක්ෂණ ඉංජිනේරු (ලුතිනන්)</u>**:

(අ) ස්ත්‍රී/පුරුෂ දෙපාර්ශවයටම අයදුම්කළ හැකිය.

(ආ) විවාහක/අවිවාහක දෙපාර්ශවයටම අයදුම්කළ හැකිය.

(ඇ) 2026 ඔක්තෝබර් මස 01 දිනට වයස අවුරුදු 28 ට අඩු විය යුතු ය.

(ඈ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙතින් අනුමත විශ්වවිද්‍යාලයක් වෙතින් තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයට අදාළ පූර්ණ කාලීන උපාධියක් ලබා තිබිය යුතු ය.

(ඉ) අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 1½ ක පළපුරුද්දක් තිබිය යුතු ය. (අධ්‍යයන හා සීමාවාසික පුහුණු කාලසීමාව පළපුරුද්ද ලෙස නොසැලකේ).

9. **<u>ගණකාධිකාරී(කපිතන්)</u>**:

(අ) ස්ත්‍රී/පුරුෂ දෙපාර්ශවයටම අයදුම් කළ හැකිය.

(ආ) විවාහක/අවිවාහක දෙපාර්ශවයටම අයදුම් කළ හැකිය.

(ඇ) 2026 ඔක්තෝබර් මස 01 දිනට වයස අවුරුදු 32 ට අඩු විය යුතුය.

(ඈ) ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙතින් අනුමත විශ්වවිද්‍යාලයකින් ලබාගත් ගිණුම්කරණය/මූල්‍ය සම්බන්ධ උපාධියක් (විද්‍යාවේදී විශේෂ ගණකාධිකරණය/ මූල්‍ය/ මූල්‍ය කළමනාකරණය, ව්‍යාපාර පරිපාලනවේදී විශේෂ ගණකාධිකරණය/මූල්‍ය, ව්‍යාපාර කළමනාකරණවේදී විශේෂ ගණකාධිකරණය/මූල්‍ය, වාණිජවේදී විශේෂ) ලබා තිබීම;

*හා*

වරලත් ගණකාධිකාරී ආයතනයේ (CA Sri Lanka) ව්‍යාපාර අදියර - II (Executive Level II) හෝ වරලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනයේ (CIMA - UK) කළමනාකරණ අදියර (Management Level) සමත්ව තිබීම;

*හෝ*

සහතිකලත් වරලත් ගණකාධිකාරී සංගමයේ (ACCA - UK) කුසලතා අදියර (Skills Level) සමත්ව තිබීම.

(ඉ) පිළිගත් ආයතනයක ගිණුම්කරනය/මූල්‍ය/ විගණනයට අදාළ මාණ්ඩලික ශ්‍රේණියේ අවම වශයෙන් වසර 2½ ක පළපුරුද්ද (අධ්‍යයන/ සීමාවාසික පුහුණු කාලසීමාව පළපුරුද්ද ලෙස නොසැලකේ) හා ගිණුම්කරණ මෘදුකාංග භාවිතය පිළිබඳ දැනුමක් තිබීම.

10. **<u>සේවා කොන්දේසි</u>**:

(අ) පුහුණු කාලසීමාව අවසානයේ සිට (අධිකාරියට පත්කරනු ලබන දිනයේ සිට) වසර 10 ක් අනිවාර්යයෙන් යුද්ධ හමුදා සේවයේ යෙදී සිටිය යුතු ය. ඒ සඳහා යුද්ධ හමුදාව සමග ඇප

බැඳුම්කරයකට සහ ගිවිස්නාවකට යටත් කරනු ලැබේ.

(ආ) පුහුණුවීම් ලබන කාලසීමාව තුළදී කෙඩෙට් නිලධාරියෙකුගේ මාසික වැටුප සියලු දීමනා සහිතව රු. 105,415.80 කි. කෙඩෙට් නිලධාරියෙක් වශයෙන් සේවය කරන කාලය තුළදී ඔවුන්හට කිසිදු වැටුප් වැඩිවීමකට හිමිකමක් නොමැත.

(ඇ) අයදුම්කරුවන්/අයදුම්කාරිනියන් අදාළ වෘත්තීන්ට අනුව බඳවාගැනීමෙන් පසු ශ්‍රී ලංකා යුද්ධ හමුදා විද්‍යාපීඨයේ දී යුද්ධ හමුදා මූලික පුහුණුවීම් පාඨමාලාවක් හැදෑරිය යුතුය.

(ඈ) පුහුණුවීමේ කාලය තුළ දී කෙඩෙට් නිලධාරින්ගේ තරාතිරම සෙසුනිලයින් හා සමාන වන අතර, ඔවුන් යුද්ධ හමුදා නීතියට සහ සිවිල් නීතියට යටත් වනු ඇත.

(ඉ) රාජ්‍ය සේවයේ දෙපාර්තමේන්තු, සංස්ථා, සිවිල් ආයතන හා පුද්ගලික ආයතනයන්හි නියුතු අයදුම්කරුවන්/අයදුම්කාරිනියන් බඳවා ගැනීමට තෝරා ගතහොත් පූර්ණ කාලීනව යුද්ධ හමුදා සේවයට නිදහස් කළ හැකි බවට ආයතන ප්‍රධානියාගේ සහතිකය සහිතව (දෙපාර්තමේන්තු, සංස්ථා, සිවිල් ආයතන) ඉදිරිපත් කළ යුතු ය.

(ඊ) වෘත්තීය නිලධාරින් වශයෙන් බඳවාගනු ලබන නිලධාරි/නිලධාරිනියන් හමුදා නියෝග (12/2019) උපදෙස් හා වෘත්තීය නිලධාරි බඳවා ගැනීමේ ක්‍රියාපටිපාටියේ සඳහන් සුදුසුකම් අනුව අදාළ නිලය සඳහා බඳවාගනු ලැබේ.

(උ) <u>පාඨමාලාවෙන් ඉවත්වීම/ඉවත් කිරීම</u>:

(1) පුහුණුවීම් කාලසීමාව තුළ දී කෙඩෙට් නිලධාරියෙකු සිය කැමැත්තෙන්ම අධිකාරිය සඳහා වූ තම අපේක්ෂකත්වය අවසන් කළහොත් එතෙක් එම කෙඩෙට් නිලධාරියා වෙනුවෙන් ශ්‍රී ලංකා ජනරජය මගින් දරන්නට යෙදුනු සියලුම වියදම භාරකරු හෝ ඇපකරුවන් විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයට ආපසු ගෙවිය යුතු යි.

(2) කෙඩෙට් නිලධාරියෙකු පාඨමාලාවේ නියුතුව සිටින කාලය තුළ කිනම් අවස්ථාවක හෝ විෂමාචාර හේතුන් නිසා අස්කිරීම, තම අයහපත් ආරක්ෂක නිශ්කාෂණ, තමන් විසින් වලක්වාලිය හැකි හේතූන් නිසා හෝ අධිකාරිය පිරිනැමීමට නුසුදුසු යැයි නිලධාරින් විසින් වාර්තා කරනු ලැබුවහොත්, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය මගින් ඔහු වෙනුවෙන් දරන්නට යෙදුනු සියලුම වියදම් භාරකරු හෝ ඇපකරුවන් විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයට ආපසු ගෙවිය යුතු යි.

(3) ඉල්ලා අස්වන ලද, ඉවත් කරන ලද හෝ වෛද්‍ය හේතුන් මත නුසුදුසු යැයි පුහුණුවෙන් ඉවත් කරන ලද කෙඩෙට් නිලධාරියෙකුට නැවත අවස්ථාවක යුද්ධ හමුදාව වෙත කෙඩෙට් නිලධාරියෙකු වශයෙන් බැඳීමට නොහැක.

11. <u>වැටුප් හා දීමනා</u>. ශ්‍රී ලංකා යුද්ධ හමුදා නිත්‍ය බල හමුදාවේ නිලධාරින් වශයෙන් බඳවා ගනු ලබන නිලධාරින්ට අදාළ වන වැටුප් තලය/පරිමාණය පහත සඳහන් පරිදි වේ:

| *අ.අ.* | *නිලය* | *කළමණාකරන සේවා චක්‍රලේඛ 05/2025 ට අනුව ඒකාබද්ධ වැටුප* | | *වැටුප් වර්ධක* |
|---|---|---|---|---|
| | | *2026* | *2027* | |
| 1 | දෙවන ලුතිනන් | 60,709.00 | 65,880.00 | ස්ථිර |
| 2 | ලුතිනන් | 74.,438.00 | 82,150.00 | 30 x 2400 |
| 3 | කපිතන් | 86,601.00 | 96,550.00 | 24 x 2400 |
| 4 | මේජර් | 94,710.00 | 106,150.00 | 22 x 2400 |
| 5 | ලුතිතන් කර්නල් | 97,192.00 | 109,090.00 | 17 x 2940 |
| 6 | කර්නල් | 117,857.00 | 133,570.00 | 17 x 3900 |
| 7 | බ්‍රිගේඩියර් | 124,446.00 | 141,370.00 | 15 x 3900 |
| 8 | මේජර් ජෙනරාල් | 136,575.00 | 156,000.00 | 12 x 4850 |
| 9 | ලුතිනන් ජෙනරාල් | 144,770.00 | 165,700.00 | 10 x 4850 |
| 10 | ජෙනරාල් | 157,063.00 | 180,250.00 | 7 x 4850 |

12. <u>අනෙකුත් දීමනා</u>. පහත සඳහන් මාසික දීමනා ගෙවනු ලැබේ:

(අ) සුදුසුකම් දීමනා.

(ආ) නොමිලේ ආහාර හෝ ආහාර දීමනාව.

(ඇ) ඇතුළත විසීමට නියෝග ලැබ සිටින විට වික්ෂේපණ දීමනාව (විවාහක නිලධාරින්ට පමණක්).

(ඈ) නිල ඇඳුම් නඩත්තු කිරීමේ දීමනාව.

13. පහත සඳහන් පහසුකම්/දීමනා ගෙවනු ලැබේ:

(අ) ඇතුළත විසීමට නියෝග ලැබ සිටින විට නොමිලේ නේවාසික පහසුකම්.
(ආ) කුලී නිවාසයක වාසය කරන විට සීමිත ගෙවල් කුලී.
(ඇ) නොමිලේ නිල ඇඳුම්.
(ඈ) විවාහක නිලධාරීන්ට අනුගාමික දීමනා/අවිවාහක නිලධාරීන් අනුගාමික සේවය.
(ඉ) ඇතුළත විසීමට නියෝග ලැබ සිටින නිලධාරින්ට රාජකාරි ස්ථානයේ සිට නිවස දක්වා මසකට වරක් රාජකාරි දුම්රිය බලපතක්.

14. වැටුප් හා ඉදිරි සේවා කොන්දේසි සම්බන්ධයෙන් පහත සඳහන් රෙගුලාසි නිලධාරින්ට බලපවත්වනු ලැබේ:

(අ) කළමණාකරන සේවා චක්‍රලේඛ 05/2025.

(ආ) යුද්ධ හමුදා වැටුප් සංග්‍රහය.

(ඇ) 1993 අගෝස්තු මස 17 වන දින අංක 780/7 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ *ගැසට්* පත්‍රයේ ප්‍රසිද්ධ කරනු ලැබූ කලින් කල සංශෝධිත 1992 යුද්ධ හමුදා නිලධාරි (නිත්‍ය බලසේනා) සේවා නියෝගය.

(ඈ) 1989 ජුනි මස 15 වන දින අංක 562/11 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ *ගැසට්* පත්‍රයේ ප්‍රසිද්ධ කරනු ලැබූ කලින් කල සංශෝධිත 1981 යුද්ධ හමුදා විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික ව්‍යවස්ථා සංග්‍රහය.

15. මෙහි පහත 16 වැනි ඡේදයෙහි දක්වා ඇති පරිදි දෙමව්පියන් හෝ භාරකරුවන් විසින් ප්‍රකාශන පත්‍රයකට අත්සන් කළයුතු වන අතර, එම ප්‍රකාශන පත්‍රය අයදුම්පත්‍රය සමග ඉදිරිපත් කළයුතු වේ. තෝරාගත් අපේක්ෂකයින්ගේ දෙමව්පියන් හෝ භාරකරුවන් විසින් එකී අපේක්ෂකයින් පත්කිරීමට පෙර ප්‍රකාශන පත්‍රයෙහි අඩංගු කරුණුවලට අනුව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයත් සමඟ ඇපබැඳුම්කරයකට අත්සන් කළ යුතු ය. විශේෂ අවස්ථාවල දී හැර පියා ජීවතුන් අතර සිටින කෙඩෙට් නිලධාරියෙකුගේ භාරකරු පියා විය යුතු අතර, ඔහු නොමැති නම් පමණක් මවට හෝ භාරකරුහට භාරකාරීත්වය හිමිවනු ලැබේ.

16. අයදුම්කරුගේ මව, පියා හෝ භාරකරු විසින් අත්සන් කළ යුතු ප්‍රකාශය:

(අ) ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ කෙඩෙට් නිලධාරි ඉල්ලුම්කරුවෙකු වන ........................... ............................... ගේ පියා/මව/භාරකරු මම වෙමි.

(ආ) ශ්‍රී ලංකාවේ දී හෝ විදේශයක දී පුහුණුවීමේ පාඨමාලාවක් හැදෑරීම සඳහා ඉහත නම සඳහන් අයදුම්කරු තෝරාගනු ලැබුවහොත් මෙහි පහත සඳහන් කරුණු සම්බන්ධ වගකීම මම භාර ගනිමි.

(1) පුහුණුවීමේ කාලසීමාව තුළ දී අයදුම්කරුහට දරන්නට වන සියලුම පෞද්ගලික වියදම් දැරීමට.

(2) පුහුණුව ලබන කාලය තුළ ඉහත නම සඳහන් අයදුම්කරු සිය කැමැත්තෙන්ම අධිකාරිය අවසන් කළහොත්, ඔහු වෙනුවෙන් රජයට දැරීමට සිදුවූ සියලුම වියදම් ශ්‍රී ලංකා ජනරජයට ආපසු ගෙවීමට.

(3) පුහුණුව ලබන කාලය තුළ ඉහත නම සඳහන් අයදුම්කරු කිනම් අවස්ථාවක වුවත් (විෂමාචාර හෝ ඔහුට තමන් විසින්ම වලක්වාලිය හැකි හේතූන් නිසා) අධිකාරිය ලැබීමට නුසුදුසු යැයි බලධාරින් විසින් වාර්ථා කරනු ලැබුවහොත් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය මඟින් ඔහු වෙනුවෙන් දරන්නට වූ වැයකිරීම් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙත ආපසු ගෙවීමට.

* නොගැළපෙන වචන කපා හරින්න.

..........................................,
මව/පියා/භාරකරුගේ අත්සන.

නම සහ ලිපිනය පැහැදිලි අකුරෙන් : .......................................
..................................................................................
දිනය : ..........................................................................
සාක්ෂිකරුගේ අත්සන : ........................................................
නම සහ ලිපිනය පැහැදිලි අකුරෙන් : .......................................
...............................................................

17. <u>භාෂා අවශ්‍යතා</u> : ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදවීම සඳහා විශේෂයෙන්ම වර්ෂ 1956 අංක 33 දරන රාජ්‍ය භාෂා පනත හා සංශෝධන ප්‍රකාරව විධිවිධාන ක්‍රියාවේ යෙදවීම සඳහා දැනට පනවා ඇති ව්‍යවස්ථාවලට මෙන්ම මතු පනවනු ලබන ව්‍යවස්ථාවලටද අනුකූලව තෝරාගත් අපේක්ෂකයින් ක්‍රියා කළ යුතු වේ.

18. <u>අනන්‍යතාව තහවුරු කිරීම</u> : අපේක්ෂකයින් විසින් ඔවුන්ගේ අනන්‍යතාව තහවුරු කිරීම පිණිස සාක්ෂි ඉදිරිපත් කිරීම අවශ්‍ය වනු ඇත. මේ සඳහා පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් හෝ තැපැල්පති විසින් හෝ නිකුත් කරන ලද හැඳුනුම්පත සහ මෝටර් වාහන

කොමසාරිස් ජෙනරාල්වරයා විසින් නිකුත් කරන ලද "රියදුරු බලපත්‍රය" පිළිගනු ලැබේ.

19. රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන්ගේ ඉල්ලුම්පත්‍ර තෝරා ගතහොත් එම අපේක්ෂකයා මුදවාලිය හැකි බවට සහතිකයක් සහිතව දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් එවිය යුතු යි.

20. <u>**ඉල්ලුම් පත්‍ර**</u>. ඉල්ලුම් පත්‍රය පහත දැක්වෙන ආකෘතියට අනුව ඉල්ලුම්කරුගේම අත් අකුරින් සම්පූර්ණකර **2026 ජූනි මස 19 දින 1200** පැයට හෝ ඊට පෙර ලැබෙන සේ "පිරිස් පරිපාලන අධ්‍යක්ෂ මණ්ඩලය, ශ්‍රී ලංකා යුද්ධ හමුදා මූලස්ථානය, ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය, අකුරේගොඩ පාර, බත්තරමුල්ල" යන ලිපිනයට එවිය යුතු වේ. ඉල්ලුම්පත්‍ර බහාලන කවරයේ වම් ඉහළ කෙලවරේ **"යුද්ධ හමුදා නිත්‍ය බල හමුදාවේ වෙනත් වෘත්තීය නිලධාරි තනතුර සඳහා ඉල්ලුම් පත්‍රය"** යනුවෙන් සඳහන් කළ යුතුවේ. ඉල්ලුම්පත්‍ර භාරගනු ලබන අවසාන දිනට හා වේලාවට පසුව සහ මෙම නිවේදනයේ දැක්වෙන අවශ්‍යතාවයන්ට අනුකූල නොවන ඉල්ලුම්පත්‍ර භාරගනු නොලැබේ. මෙම මූලස්ථානය මඟින් ඉල්ලුම් පත්‍ර නිකුත් කිරීමක් ද සිදුකරනු නොලැබේ. මේ පිළිබඳ වැඩිදුර විස්තර සහ අයදුම්පත www.army.lk/officers වෙබ් අඩවියෙන් බාගත කර ගත හැක.

21. ඉල්ලුම් පත්‍ර සමග පහත සඳහන් සහතිකවල ඡායා පිටපත් එවිය යුතු ය:

(අ) උප්පැන්න සහතිකය,

(ආ) ඉදිරිපත්කර ඇති අධ්‍යාපන සුදුසුකම් සනාථ කිරීමේ සහතික,

(ඇ) උපාධි සහතිකය,

(ඈ) වෘත්තීය පළපුරුද්ද පිළිබඳ සහතිකය,

(ඉ) ක්‍රීඩා හා විෂය සමගාමී ක්‍රියාකාරකම් පිළිබඳ සහතික,

(ඊ) තවද, ජාතික හැඳුනුම්පතෙහි ඡායා පිටපතක් ද මෑතකදී ලබාගත් 2" x 2½" ප්‍රමාණයේ නිල් පසුබිම සහිත වර්ණ ඡායාරූපයක් ග්‍රාම නිලධාරි හෝ නීතිඥවරයෙකු විසින් සහතික කර එවිය යුතු ය.

22. <u>**සම්මුඛ පරීක්ෂණයන් පැවැත්වීම**</u>. ඉහත සඳහන් අවශ්‍යතාවයන් සපුරාලන අයදුම්කරුවන් මූලික තේරීම් වලට භාජනය කරනු ලැබේ. එසේ තෝරාගනු ලබන අයදුම්කරුවන් යුද්ධ හමුදාධිපති විසින් නියම කරනු ලබන පරිදි පරීක්ෂණවලට පෙනී සිටිය යුතු යි. එම පරීක්ෂණයන්ගෙන් තෝරාගනු ලබන අයදුම්කරුවන් ආරක්ෂක අමාත්‍යාංශය මගින් පත්කරනු ලබන තේරීම් මණ්ඩලයක් ඉදිරිපිට සම්මුඛ පරීක්ෂණයකට භාජනය කිරීමෙන් අවසාන තේරීම් කරනු ලැබේ.

23. තේරීම් මණ්ඩලය මඟින් සම්මුඛ පරීක්ෂණය සඳහා තෝරාගනු ලබන අයදුම්කරුවන්ට සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලබන ස්ථානය, වේලාව සහ දිනය විද්‍යුත් ලිපියක් මඟින් දැනුම් දෙනු ලැබේ. සම්මුඛ පරීක්ෂණය **පිරිස් පරිපාලන අධ්‍යක්ෂ මණ්ඩලය, ශ්‍රී ලංකා යුද්ධ හමුදා මූලස්ථානය, ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය, අකුරේගොඩ පාර, බත්තරමුල්ල** හිදී පැවැත්වීමට කටයුතු සිදුකරනු ලබන අතර, අයදුම්කරුවන් දරනු ලබන ගමන් වියදම් හෝ වෙනත් වියදම් කිසිවක් ශ්‍රී ලංකා ජනරජය මඟින් ආපසු ගෙවනු නොලැබේ.

24. අයදුම්කරුවෙකු නිර්දේශ කිරීමට අදහස් කරන කවරෙකු විසින් වුවද එසේ කළ යුත්තේ ඔහුට සහතිකයක් දීමෙන් පමණි. තව ද, අයදුම්කරුවෙකු තෝරා ගැනීම සඳහා කවරාකාරයකින් හෝ පෙළඹවීමක් නැතහොත් බලපෑම් කිරීමට උත්සහ දැරීම අදාළ අපේක්ෂකයා නුසුදුස්සෙකු ලෙස පරීක්ෂණ මණ්ඩලය විසින් තීරණය කිරීමට හේතු වේ.

25. බඳවා ගැනීම සඳහා සුදුසුකම් නොලබන අයදුම්කරුවන් වෙත ඒ බව දන්වනු නොලබන අතර, එවැනි අයදුම්කරුවන්ගෙන් ඒ පිළිබඳ කරුණු සැලකිරීම භාරගනු නොලැබේ.

*සටහන:* මෙම *ගැසට්* නිවේදනය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂා ත්‍රිත්වයෙන්ම පළවේ. සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා අතර, යම් අනනුකූලතාවක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු ය.

**බී කේ ජී එම් එල් රොද්‍රිගෝ ආර්එස්පී**
**සීටීඑෆ්-එන්ඩීයූ පීඑස්සී අයිජී,**
ලුතිනන් ජෙනරාල්,
යුද්ධ හමුදාධිපති.

2026 මාර්තු මස 27 දින,
ශ්‍රී ලංකා යුද්ධ හමුදා මූලස්ථානය"
ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය,
අකුරේගොඩ පාර,
බත්තරමුල්ල.

05 - 376

**ආයුර්වේද වෛද්‍ය සභාව**

සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය

**ජ්‍යෙෂ්ඨ කළමනාකාර ( HM 1-1 ) ආයුර්වේද වෛද්‍ය සභාවේ ලේඛකාධිකාරි තනතුර සඳහා අයදුම්පත් කැඳවීම**

සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන **මහරගම, නාවින්න පිහිටි ආයුර්වේද වෛද්‍ය සභාවේ** ඉහත තනතුර සඳහා යෝග්‍ය පුද්ගලයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම තනතුර ස්ථිර සේවක අර්ථසාධක අරමුදල හා සේවා නියුක්තියන්ගේ භාරකාර අරමුදල සඳහා හිමිකම් සහිත තනතුරකි.

**බඳවා ගැනීමේ සුදුසුකම් -**

i. ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතු ය.
ii. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතු ය.
iii. විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය.

**පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව - 01 ( එකයි )**

| | |
|---|---|
| **අධ්‍යාපන සුදුසුකම්** | i. 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත යටතේ පිළිගත් විශ්වවිද්‍යාලයක් හෝ අනුබද්ධ ආයතනයක් විසින් ප්‍රදානය කළ ආයුර්වේද වෛද්‍ය හා ශල්‍යවේදී උපාධියක් (BAMS) හෝ සිද්ධ වෛද්‍ය හා ශල්‍යවේදී උපාධියක් (BSMS) හෝ යුනානි වෛද්‍ය හා ශල්‍යවේදී උපාධියක් (BUMS) හෝ සිද්ධ ආයුර්වේද වෛද්‍ය හා ශල්‍යවේදී ඩිප්ලෝමාවක් (DSAMS) හෝ සිද්ධ ආයුර්වේද ඩිප්ලෝමා සහතිකයක් (DSAC) ලබා තිබීම;<br>*සහ*<br>ii. ආයුර්වේද වෛද්‍ය සභාවේ වෛද්‍යවරයෙකු ලෙස ලියාපදිංචිය ලබා තිබීම හා ලියාපදිංචිය අලුත් කර තිබීම; සමග<br>iii. අදාළ ක්ෂේත්‍රයකින් පශ්චාත් උපාධියක් (Masters) ලබා තිබීම;<br>*සහ*<br>iv. රාජ්‍ය සේවයේ හෝ 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත යටතේ පිළිගත් වෙනත් සේවයක අවම වශයෙන් වසර 15 ක පළපුරුද්ද තිබිය යුතු ය. |
| **වයස** | **-** අවුරුදු 40 ට නොඅඩු හා 55 ට නොවැඩි අය විය යුතු ය. |
| **වැටුප් පරිමාණය** | **-** ක.සේ.චක්‍රලේඛ අංක 01/2025 අනුව HM 1-1 වැටුප් කේතය හිමි තනතුරකි.<br>වැටුප් පරිමාණය රු. **140,640 - 15x4,100 – රු. 202,140** වේ.<br>**2026.01.01 දිනට ආරම්භක වැටුප රු.123,019/- කි.**<br>සේවක අර්ථසාධක අරමුදලට හා සේවා නියුක්තිකයින්ගේ භාරකාර අරමුදල් සඳහා හිමිකම් සහිතයි. |
| **බඳවා ගැනීමේ ක්‍රමවේදය** | පත්වීම් බලධරයා විසින් පත් කෙරෙන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකින් තෝරා ගැනීමෙන් මෙම තනතුරට බඳවා ගනු ලැබේ. ඉහළම ලකුණු ලැබුවන් අතරින් කුසලතා අනුපිළිවෙල අනුව තෝරා ගැනීම සිදු කෙරේ.<br><br>1961 අංක 31 දරන ආයුර්වේද පනතේ 19(1)(අ) සහ (2) වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 49 (1) (අ) (2) සහ (3) වගන්ති යටතේ 2024.03.01 දින අංක 2373/43 යටතේ නිකුත් කර ඇති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ *ගැසට්* නිවේදනයේ රීති වලට යටත්විය යුතු ය. මෙය ආයුර්වේද වෛද්‍ය සභාව විසින් වර්ෂ තුනක කාලයක් සඳහා පත් කරනු ලබන බඳවා ගැනීමකි. (ධුර කාලය වසර තුනක් වන අතර දෙවන වාරයක් සඳහා නැවත පත් කරනු ලැබිය හැක.) උපරිම සේවා කාලය වසර 06 කි. |

| | |
|---|---|
| **පත්වීම් බලධාරියා** | ආයුර්වේද වෛද්‍ය සභාවේ අධ්‍යක්ෂ මණ්ඩලය - |
| **අයැදුම්කරන පිළිවෙල** | **-** සියලුම ජීව දත්ත හා පළපුරුද්ද ඇතුළත් කොට මේ සමඟ අමුණා ඇති ආකෘතිය පරිදි තමා විසින්ම අයදුම්පත පිළියෙල කළ යුතු ය. ඉහතින් සඳහන් අධ්‍යාපන සුදුසුකම්වලට පමණක් අදාළ අධ්‍යාපන සහතිකවල ඡායා පිටපත් ද අයදුම්පත හා අමුණා එවිය යුතු ය. අයදුම්පත බහාලන කවරයේ ඉහල වම්පස කෙලවරෙහි **"ජ්‍යෙෂ්ඨ කළමනාකාර (HM 1-1) ලේඛකාධිකාරි බඳවා ගැනීම - ආයුර්වේද වෛද්‍ය සභාව"** ලෙස සඳහන් කොට **2026 ජුනි මස 26 දිනට හෝ ඊට පෙර "සභාපති, ආයුර්වේද වෛද්‍ය සභාව, නාවින්න, මහරගම"** යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. |

**ලබා දී ඇති උපදෙස් අනුව යොමු නොකරනු ලබන අයැදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලබන අතර බඳවා ගැනීම පිළිබඳ අවසාන තීරණය ආයුර්වේද වෛද්‍ය සභාව සතුය.**

**ඒ.එම්.ජී.එන්. දීප්ති සුමනසේන,**
ආයුර්වේද වෛද්‍ය සභාවේ සභාපති,
ආයුර්වේද කොමසාරිස් ජනරාල්.

2026 මැයි මස 20 දින,
ආයුර්වේද වෛද්‍ය සභා කාර්යාලයේ දී.

**ආයුර්වේද වෛද්‍ය සභාව**

සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය

**(කාර්යාල ප්‍රයෝජනය සඳහා පමණයි)**

**ජ්‍යෙෂ්ඨ කළමනාකාර ( HM 1-1 ) ආයුර්වේද වෛද්‍ය සභාවේ ලේඛකාධිකාරි**
**තනතුර සඳහා අයැදුම්පත**

| | | |
|---|---|---|
| 1.0 | 1.1. සම්පූර්ණ නම | |
| | 1.2. මුලකුරු සමඟ නම | |
| 2.0 | 2.1. ස්ථිර ලිපිනය | |
| | 2.2. දිස්ත්‍රික්කය | |
| 3.0 | 3.1. ස්ත්‍රී පුරුෂ භාවය | |
| | 3.2. ජාතික හැඳුනුම්පත් අංකය | |
| 4.0 | 4.1. ජංගම දුරකතන අංකය | |
| | 4.2. ස්ථාවර දුරකතන අංකය | |
| 5.0 | 5.1. උපන් දිනය - | |
| | 5.2. අයැදුම්පත් භාරගැනීමේ අවසන් දිනට වයස | |
| 6.0 | 6.1. විවාහක / අවිවාහක බව | |

**7.0** **අධ්‍යාපන සුදුසුකම් :**
**උපාධි පිළිබඳ විස්තර**

| | | | | |
|---|---|---|---|---|
| **බී.ඒ.එම්.එස්. B.A.M.S.** ☐ | **බී.යූ.එම්.එස්. B.U.M.S.** ☐ | **බී.එස්.එම්.එස්. B.S.M.S.** ☐ | **ඩී.එස්.ඒ.එම්.එස්. D.S.A.M.S.** ☐ | **ඩී.එස්.ඒ.සී. D.S.A.C.** ☐ |

**(අදාළ කොටුවේ X ලකුණ යොදන්න.)**

විශ්ව විද්‍යාල ආයතනය - .............................................
උපාධිය වලංගුවන දිනය - .............................................
ප්‍රායෝගික පුහුණුව ලැබූ කාලය .............................................
ආයුර්වේද වෛද්‍ය සභාවේ ලියාපදිංචි අංකය ............................................. (ලියාපදිංචි සහතිකයේ පිටපතක් අමුණන්න)
ආයුර්වේද වෛද්‍ය සභාවේ ලියාපදිංචි දිනය ................................................

**පශ්චාත් උපාධි විස්තර**

ලබා ඇති පශ්චාත් උපාධිය - .................................................................
විශ්ව විද්‍යාල ආයතනය - ................................................................. (සහතිකයේ පිටපතක් අමුණන්න)
උපාධිය වලංගු වන දිනය - .................................................................
පශ්චාත් උපාධිය ආයුර්වේද වෛද්‍ය සභාවේ ලියාපදිංචි කළ දිනය - ...........................................................

8.0. **භාෂා ප්‍රවීණතාවය :**

| *භාෂාව* | *කියවීම* | *ලිවීම* | *කථනය* |
|---|---|---|---|
| (අ). සිංහල භාෂාව | | | |
| (ආ). දෙමළ භාෂාව | | | |
| (ඇ). ඉංග්‍රීසි භාෂාව | | | |
| (ඈ). වෙනත් විදේශ භාෂා | | | |

**9.0 පළපුරුද්ද: (රාජ්‍ය සේවයේ හෝ 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත යටතේ පිළිගත් වෙනත් සේවයක අවම වශයෙන් වසර 15 ක පළපුරුද්ද තිබිය යුතුය. පළපුරුද්ද ලැබූ ආයතන හා කාලසීමාව අනුව සඳහන් කළ යුතුය.)**
.......................................................................................................................................................
.......................................................................................................................................................

**10.0 වෙනත් සුදුසුකම් :**
.......................................................................................................................................................
.......................................................................................................................................................

**11.0 අයැදුම්කරුගේ / අයැදුම්කාරියගේ සහතිකය :**

මෙම අයැදුම්පතෙහි සඳහන්කර ඇති තොරතුරු මාගේ දැනීමේ හැටියට සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙහි සඳහන් කිසියම් තොරතුරක් වැරදි හෝ සාවද්‍ය බව බඳවා ගැනීමට පෙර හෝ ඉන් පසුව හෝ හෙළි වුවහොත් මාගේ අපේක්ෂකත්වය / හෝ පත්වීම අවලංගු කිරීමේ අයිතිය ආයුර්වේද වෛද්‍ය සභාවේ සභාපතිවරයා සතු බව දනිමි.

මෙම බඳවා ගැනීම සම්බන්ධයෙන් පවතින නීතිරීතිවලට බැඳී සිටීමට හා නීති රෙගුලාසි අනුව මා නුසුදුස්සෙකු බව පෙනී ගියහොත් බඳවා ගැනීමට පෙර හෝ ඉන් පසුව හෝ මාගේ අපේක්ෂකත්වය / පත්වීම අවලංගු කිරීම සඳහා ගනු ලබන ඕනෑම තීරණයකට යටත්වන බවට මම එකඟ වෙමි.

.................................................................,
අයදුම්කරුගේ / අයදුම්කාරියගේ අත්සන.

දිනය:…………………………………...

05 - 378

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

**කෘෂිකර්ම දෙපාර්තමේන්තුව**

කෘෂිකාර්මික නිෂ්පාදන තාක්ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමා පාඨමාලාව හැදෑරීම සඳහා ශ්‍රී ලංකා කෘෂිකර්ම විද්‍යාලවලට සිසුන් ඇතුළත්කර ගැනීමේ විවෘත තරග විභාගය - 2026

**Open competitive Examination for the enrollment of students for the National Diploma in Agricultural Production Technology in Sri Lanka Schools of Agriculture - 2026**

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට අයත් ශ්‍රී ලංකා කෘෂිකර්ම විද්‍යාලයන්හී පැවැත්වෙන "කෘෂිකාර්මික නිෂ්පාදන තාක්ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමා පාඨමාලාව (NVQ 5)" හැදෑරීම සඳහා **2027/ 2028** අධ්‍යයන වර්ෂයට අදාළව සිසුන් ඇතුළත් කර ගැනීමේ තරග විභාගය සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම විභාගය කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ විභාග අංශය විසින් 2026 ඔක්තෝබර් මාසය තුළ දී සිංහල හා දෙමළ මාධ්‍යයවලින් ප්‍රධාන නගර කීපයක පිහිටුවනු ලබන විභාග මධ්‍යස්ථානවල දී පැවැත්වීමට අපේක්ෂිතය.

**02. කෘෂිකාර්මික නිෂ්පාදන තාක්ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමා පාඨමාලාව :**

2.1 කෘෂිකාර්මික නිෂ්පාදන තාක්ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමා පාඨමාලාව තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව යටතේ ලියාපදිංචි කර ඇති පාඨමාලාවක් වන අතර ඒ සඳහා ජාතික වෘත්තීය සුදුසුකම් 5 මට්ටම (NVQ level 5) ලබාදේ.

2.2 කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට අයත් අනුරාධපුර, බිබිල, ලබුදූව, පාලමුණේ, පරන්තන්, වාරියපොල යන කෘෂිකර්ම විද්‍යාලයන් තුළ කාන්තා සහ පිරිමි දෙපාර්ශවයටම විවෘත පාඨමාලාවක් ලෙසින් මෙම පාඨමාලාව පවත්වා ගෙන යනු ලැබේ.

2.3 පාඨමාලා කාලය වසර 1 ½ කි. එයින් වසරක කාලයක් කෘෂිකර්ම විද්‍යාලයක් තුළ දී නිශ්චිත විෂය මාලාවකට අනුකූලව පුහුණුව ලබා දේ. අනතුරුව ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරියේ (NAITA) අධීක්ෂණය යටතේ මාස 06ක රැකියාස්ථ පුහුණුවක් නම් කරන ලද ආයතනයකින් ලබා ගත යුතුවේ.

2.4 පූර්ණකාලීන නේවාසික පාඨමාලාවක් වන මෙම පාඨමාලාව ඉංග්‍රීසි මාධ්‍යයෙන් පමණක් පවත්වනු ලැබේ.

2.5 ඇතුළත් කරගැනීමේ තරග විභාගයේ ප්‍රතිඵල මත පාඨමාලාව හැදෑරීම සඳහා සුදුසුකම් ලැබූවන්ගේ සුදුසුකම්වල නිරවද්‍යතාවය සම්මුඛ පරීක්ෂණයක් තුළින් පරීක්ෂා කිරීමෙන් අනතුරුව කෘෂිකර්ම විද්‍යාලවලට ඇතුළත්කර ගැනීම සඳහා තෝරාගනු ලැබේ.

2.6 පාඨමාලාව සඳහා අ.පො.ස (උ.පෙළ) සුදුසුකම් මත හා කෘෂිකර්ම ක්ෂේත්‍රයට අදාළ ජාතික වෘත්තීය සුදුසුකම් 4 (NVQ Level 4) මට්ටමේ පාඨමාලාවක් හදාරා ලබා ගත් සුදුසුකම් මත ඉල්ලුම් කළ හැකිය.

**03. පාඨමාලාවට ඇතුළත්වීම සඳහා සපුරාලිය යුතු සුදුසුකම් :**

**3.1 අ.පො.ස (උ.පෙළ) සුදුසුකම් මත අයදුම්කරන අයදුම්කරුවන් සඳහා :**

3.1.1 අධ්‍යාපන සුදුසුකම් :

දෙවරකට නොවැඩි වාර ගණනක දී ගණිතය සහ විද්‍යාව යන විෂයයන් සහිතව විෂයයන් 06කින් අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත් වී තිබිය යුතු අතර, භාෂාව සහ තවත් ඕනෑම විෂයයන් 02ක් සඳහා සම්මාන සාමාර්ථ හෝ ඊට ඉහල සාමාර්ථ ලබා තිබිය යුතු ය;

ඉහත වාර දෙක තුළ දී හෝ වෙනත් ඕනෑම වාර ගණනකට මුහුණ දී ඉංග්‍රීසි විෂයය සඳහා අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථයක් (S) ලබා තිබිය යුතු ය;

*සහ*

අ.පො.ස. (උ.පෙළ) විභාගයේ දී ජීව විද්‍යාව විෂයධාරාව තුළ ජීව විද්‍යාව, රසායන විද්‍යාව, භෞතික විද්‍යාව/ කෘෂි විද්‍යාව යන විෂයයන්ගෙන් අවම වශයෙන් එක් විෂයයක්වත් සමත් වී තිබීම;

*හෝ*

අ.පො.ස. (උ.පෙළ) විභාගයේ දී තාක්ෂණවේදය විෂයධාරාව තුළ ජෛව පද්ධති තාක්ෂණවේදය/ ඉංජිනේරු තාක්ෂණවේදය, තාක්ෂණවේදය සඳහා විද්‍යාව සහ කෘෂි විද්‍යාව යන විෂයයන් හදාරා අවම වශයෙන් එක් විෂයයක්වත් සමත් වී තිබීම.

*වැදගත්:-* **ජීව විද්‍යාව සහ තාක්ෂණවේදය විෂය ධාරාවන් යටතේ අ.පො.ස. (උ.පෙළ) සඳහා උක්ත විෂයය සංකලනවලට අදාළ**

**විෂයයන් තුනෙන් බැහැර වෙනත් විෂයයන් හදාරා තිබීම නුසුදුසුකමක් ලෙස සැලකේ.**

3.1.2 වයස :

2026.06.30 දිනට අයදුම්කරුගේ වයස අවුරුදු 18 ට නොඅඩු විය යුතු අතර අවුරුදු 25ට නොවැඩි විය යුතු ය. (ඒ අනුව අයදුම්කරුගේ උපන් දිනය 2008.06.30 දින හෝ ඊට පෙර හා 2001.06.30 දින හෝ ඊට පසුව විය යුතු ය.)

**3.2. කෘෂිකර්ම ක්ෂේත්‍රයට අදාළව ජාතික වෘත්තීය සුදුසුකම් 4 මට්ටමේ (NVQ Level 4) පාඨමාලාවක් හදාරා සහතිකපතක් හිමි අයදුම්කරුවන් සඳහා**

3.2.1 අධ්‍යාපන සුදුසුකම් :

දෙවරකට නොවැඩි වාර ගණනක දී ගණිතය සහ විද්‍යාව යන විෂයයන් සහිතව විෂයයන් 06කින් අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත් වී තිබිය යුතු අතර භාෂාව සහ තවත් ඕනෑම විෂයයන් 02ක් සඳහා සම්මාන සාමාර්ථ හෝ ඊට ඉහළ සාමාර්ථ ලබා තිබිය යුතු ය;

ඉහත වාර දෙක තුළ දී හෝ වෙනත් ඕනෑම වාර ගණනකට මුහුණ දී ඉංග්‍රීසි විෂයය සඳහා අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථයක් (S) ලබා තිබිය යුතු වේ;

***සහ***

අයදුම්පත් කැඳවන අවසාන දිනට කෘෂිකර්ම ක්ෂේත්‍රයට අදාළව ජාතික වෘත්තීය සුදුසුකම් 4 (NVQ Level 4) මට්ටමේ පහත සඳහන් කුමන හෝ පාඨමාලාවක් හදාරා තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂම මගින් ලබා දෙන ජාතික වෘත්තීය සුදුසුකම් 4 මට්ටමේ (NVQ Level 4) සහතිකලාභියෙකු වීම;

- පැල තවාන් සංවර්ධන සහායක
- ක්ෂේත්‍ර සහායක (කෘෂිකර්ම)
- උද්‍යාන අලංකරණ ශිල්පී
- භූ දර්ශන සංවර්ධන සහායක

***හෝ***

කෘෂිකර්ම ක්ෂේත්‍රයට සම්බන්ධ කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් අනුමත කරන ජාතික වෘත්තීය සුදුසුකම් 4 (NVQ Level 4) මට්ටමේ වෙනත් පාඨමාලාවක්.

3.2.2 වයස :

2026.06.30 දිනට මෙම අයදුම්කරුගේ වයස අවුරුදු 18 ට නොඅඩු විය යුතු අතර අවුරුදු 35 ට නොවැඩි විය යුතු ය. (ඒ අනුව අයදුම්කරුගේ උපන් දිනය 2008.06.30 දින හෝ ඊට පෙර හා 1991.06.30 දින හෝ ඊට පසුව විය යුතු ය.)

3.3 මෙම පාඨමාලාව තුළ කෘෂිකාර්මික කටයුතුවලට අදාළ ප්‍රායෝගික ක්‍රියාකාරකම් ඇතුළත් හෙයින් පාඨමාලාව හැදෑරීම සඳහා ශාරීරික හා මානසික වශයෙන් යෝග්‍ය සෞඛ්‍ය තත්ත්වයක් පැවතිය යුතු ය. පාඨමාලාවට ඇතුළුවන අවස්ථාවේ දී ගර්භණීභාවයේ පසුවීම පාඨමාලාවට ඇතුළත් කර නොගැනීමටත්, පාඨමාලාවට ඇතුළත් වීමෙන් අනතුරුව ගර්භණී තත්ත්වයට පත්වීම පාඨමාලාවෙන් ඉවත් කිරීමටත් හේතුවක් වනු ඇත.

(පාඨමාලාව හැදෑරීම සඳහා ඔබ තෝරා ගතහොත් ශාරීරික හා මානසික වශයෙන් යෝග්‍ය සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත බවට රජයේ වෛද්‍යවරයෙකුගෙන් ලබාගත් වෛද්‍ය සහතිකයක් ඉදිරිපත් කළ යුතු ය.)

3.4 පූජ්‍ය පක්ෂය මෙම පාඨමාලාව හැදෑරීම සඳහා අයදුම් කිරීමට සුදුසුකම් නොලබයි.

3.5 රජයේ සේවයේ නියුතු අය මෙම තරග විභාගයට පෙනී සිටීමට සුදුසුකම් නොලබයි.

**04. විභාගය පැවැත්වෙන මාධ්‍යය සහ විභාග මධ්‍යස්ථාන :**

4.1 කෘෂිකාර්මික නිෂ්පාදන තාක්ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමා පාඨමාලාව හැදෑරීම සඳහා ශ්‍රී ලංකා කෘෂිකර්ම විද්‍යාලවලට සිසුන් ඇතුළත් කරගැනීමේ තරග විභාගය සිංහල හා දෙමළ මාධ්‍යයවලින් පමණක් පවත්වනු ලබන අතර ඉල්ලුම් කරන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

4.2 තරග විභාගය පහත සඳහන් විභාග මධ්‍යස්ථානවල දී 2026 ඔක්තෝබර් මාසය තුළ දී පවත්වනු ලැබේ. අයදුම්පත පිරවීමේ දී තමා විභාගයට පෙනී සිටීමට කැමති විභාග මධ්‍යස්ථානය සහ ඊට අදාළ මධ්‍යස්ථාන අංකය නියමිත ස්ථානයේ ඇතුළත් කළ යුතු ය. එම තෝරාගැනීම පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

| මධ්‍යස්ථාන අංකය | විභාග මධ්‍යස්ථානය |
|---|---|
| 1. | ශ්‍රී ලංකා කෘෂිකර්ම විද්‍යාලය, කුණ්ඩසාලේ |
| 2. | ශ්‍රී ලංකා කෘෂිකර්ම විද්‍යාලය, පැල්වෙහෙර |
| 3. | ශ්‍රී ලංකා කෘෂිකර්ම විද්‍යාලය, ලබුදූව |
| 4. | ශ්‍රී ලංකා කෘෂිකර්ම විද්‍යාලය, අනුරාධපුරය |
| 5. | ශ්‍රී ලංකා කෘෂිකර්ම විද්‍යාලය, පාලමුණේ |
| 6. | ශ්‍රී ලංකා කෘෂිකර්ම විද්‍යාලය, වාරියපොල |
| 7. | ශ්‍රී ලංකා කෘෂිකර්ම විද්‍යාලය, පරන්තන් |
| 8. | ශ්‍රී ලංකා කෘෂිකර්ම විද්‍යාලය, වව්නියාව |

4.3 විභාග මධ්‍යස්ථාන සඳහා ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් ඉල්ලුම්කර නොමැති විට හෝ වෙනත් ප්‍රායෝගික අපහසුතාවයන් ඇති වූ විට අයදුම්කරුවන් විසින් ඉල්ලුම්කර ඇති විභාග මධ්‍යස්ථානය වෙනුවට වෙනත් මධ්‍යස්ථානයක් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් නියම කරනු ඇත.

**5. පාඨමාලාව සඳහා අයදුම්පත් කැඳවීම :**

5.1 මෙම තරග විභාගය සඳහා අයදුම්පත් කැඳවීම මාර්ගගත (Online) ක්‍රමය ඔස්සේ සිදු කරනු ලැබේ. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ **www.doa.gov.lk** යන වෙබ් අඩවිය හරහා මේ සඳහා අයදුම් කළ යුතු ය.

5.2 විභාග ගාස්තුව රු. 1,300.00 කි. මහජන බැංකුවේ පේරාදෙණිය ශාඛාවේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අංක 057100139027201 දරන ආදායම් ගිණුමට විභාග ගාස්තු බැර කර අයදුම්කරුගේ නමින් ලදුපතක් ලබා ගත යුතු ය. එම මුදල් කුවිතාන්සිය නිකුත් කළ දිනය, ශාඛාව හා අංකය අයදුම්පතේ නියමිත ස්ථානයේ සඳහන් කළ යුතු ය.

5.3 අයදුම්පත ඉංග්‍රීසි මාධ්‍යයෙන් පමණක් සම්පූර්ණ කළ යුතු වේ. අයදුම්පත සම්බන්ධයෙන් යම් ගැටළුවක් වෙතොත් අදාළ තොරතුරු සමඟින් 0812 388 340 හෝ 0812 388 341 යන දුරකථන අංක වලින් විමසීමක් කළ හැක.

5.4 විභාගය සඳහා ගෙවන ලද ගාස්තුව මොනම හේතුවක් නිසාවත් ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් සිදු නොකෙරේ.

5.5 අයදුම්පත් භාර ගන්නා අවසන් දිනය වන 2026.06.30 රාත්‍රී 12.00න් පසුව අයදුම්පත වෙබ් අඩවියෙන් ඉවත් කරනු ලැබේ.

5.6 මාර්ගගත ආකාරයෙන් සම්පූර්ණ කළ අයදුම්පතේ දෘඪ පිටපතක් ලබා ගැනීම අනිවාර්ය වේ.

5.7 එසේ ලබාගත් දෘඪ පිටපතෙහි අයදුම්කරුගේ අත්සන යොදා පහත සඳහන් ඇමුණුම් සහිතව ලියාපදිංචි තැපෑලෙන් පමණක් 2026.07.06 වැනි දිනට හෝ ඊට පෙර අධ්‍යක්ෂ (ව්‍යාප්ති හා පුහුණු), ව්‍යාප්ති හා පුහුණු මධ්‍යස්ථානය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, පේරාදෙණිය යන ලිපිනයට එවිය යුතුය. ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරෙහි "ජාතික ඩිප්ලෝමා පාඨමාලාව (NVQ – 5)" යන්න සඳහන් කළ යුතු ය.

**ඇමුණුම්**

**(අ) අ.පො.ස (උසස් පෙළ) සුදුසුකම් මත අයදුම්කරන අයදුම්කරුවන් සඳහා -**

i. අ.පො.ස. (සා.පෙළ) විභාගයේ ප්‍රතිඵල ලේඛනවල ඡායා පිටපත්;
ii. අ.පො.ස. (උ.පෙළ) විභාගයේ ප්‍රතිඵල ලේඛනයේ ඡායා පිටපත;
iii. උප්පැන්න සහතිකයේ ඡායා පිටපතක්;
iv. ජාතික හැඳුනුම්පතෙහි ඡායා පිටපතක්;
v. මුදල් ගෙවූ කුවිතාන්සියේ මුල් පිටපත.

**(ආ) ජාතික වෘත්තීය සුදුසුකම් 4 මට්ටමේ (NVQ Level 4) පාඨමාලාවක් හදාරා අයදුම්පත් කැඳවන අවසාන දිනට සහතිකපතක් හිමි අයදුම්කරුවන් සඳහා -**

i. අ.පො.ස. (සා.පෙ) විභාගයේ ප්‍රතිඵල ලේඛනවල ඡායා පිටපත්;
ii. ජාතික වෘත්තීය සුදුසුකම් 4 මට්ටමේ (NVQ 4) සහතිකය;
iii. උප්පැන්න සහතිකයේ ඡායා පිටපතක්;
iv. ජාතික හැඳුනුම්පතෙහි ඡායා පිටපතක්;
v. මුදල් ගෙවූ කුවිතාන්සියේ මුල් පිටපත.

නියමිත දිනට ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපෑලේ දී ප්‍රමාදවන හෝ නැති වන හෝ අයදුම්පත්

පිළිබඳව කෘෂිකර්ම දෙපාර්තමේන්තුව වගකීම් දරනු නොලැබේ.

5.8 5.7 හි සඳහන් ඇමුණුම් සහිත අයදුම්පතෙහි මුද්‍රිත පිටපත කෘෂිකර්ම දෙපාර්තමේන්තුව වෙත ලැබී නොමැති වීම විභාගය සඳහා පෙනී සිටීමට නුසුදුසුකමක් වේ. එබැවින් නියමිත දිනට හෝ ඊට පෙර එම ලේඛන එවීමට වග බලා ගත යුතු වේ. තව ද සම්පූර්ණ කරන ලද අයදුම්පතේ සහ විභාග ගාස්තුවට අදාළ ලදුපතේ ඡායා පිටපත් තමා සතුව තබා ගැනීම ප්‍රයෝජනවත් වේ.

**06. අනන්‍යතාවය සනාථ කිරීම :**

6.1 විභාග අපේක්ෂක අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළ දී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහාම ශාලාධිපති සෑහීමට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාවය සනාථ කළ යුතු ය. ඒ සඳහා පහත දැක්වෙන කවර හෝ ලියවිල්ලක් ඉදිරිපත්කළ යුතු වේ :-

i. ජාතික හැඳුනුම්පත;
ii. වලංගු විදේශ ගමන් බලපත්‍රය;
iii. වලංගු ශ්‍රී ලංකා රියදුරු බලපත්‍රය.

**07. විභාග ක්‍රමය :**

7.1 තරග විභාගය සඳහා කෘෂිකර්මය සහ බුද්ධි පරීක්ෂණය ලෙස පැය 01 බැගින් වූ විෂයයන් දෙකක් ඇතුළත්ය. සෑම විෂයයක් සඳහාම ලකුණු 100 බැගින් ලබා දී අවසන් ලකුණු ප්‍රමාණය මුළු ලකුණු 200න් කොපමණ ද වශයෙන් ප්‍රකාශයට පත් කෙරේ.

7.2 එක් එක් විෂයය සමත් වීම සඳහා අවශ්‍ය අවම ලකුණු ප්‍රමාණය 30%ක් වේ.

7.3 විෂයය නිර්දේශය

***කෘෂිකර්මය :*** අ.පො.ස. (සා.පෙළ) කෘෂිකර්ම විෂය නිර්දේශ මට්ටම හා කෘෂිකර්ම ක්ෂේත්‍රයේ යාවත්කාලීන විෂය කරුණු ආශ්‍රිතව සකස් කරන ලද බහුවරණ මාදිලියේ ප්‍රශ්න අඩංගුවේ. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතු ය.

***බුද්ධි පරීක්ෂණය:*** රටා, සබඳතා, පුරෝකථන, ගැළපීම්, විශ්ලේෂණ, කුසලතා පිළිබඳ හැකියා ආදිය පරීක්ෂාවට ලක් වේ. බහුවරණ මාදිලියේ ප්‍රශ්න 50කින් යුක්ත වේ. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතු වේ.

7.4 *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරා ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නිවේදනයේ සඳහන් වයස් සීමාව තුළ වන, අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා, ඊට අදාළ ලදුපත ඇතුළුව 5.7 හි සඳහන් අනෙකුත් ඇමුණුම් සහිතව නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමු කොට ඇති අයදුම්කරුවන් වෙත විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ලැබේ. ඒ බව කෙටි පණිවිඩයක් මඟින්ද කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ විභාග අංශය විසින් දැනුම් දෙනු ඇත.

විභාග ප්‍රවේශ පත්‍රය සම්බන්ධ යම් ගැටලුවක් වෙතොත් අදාළ තොරතුරු සමගින් 0812388085 හෝ 081 2388059 යන දුරකථන අංක වලින් විමසීමක් කළ හැකි ය.

7.5 අයදුම්පතේ සඳහන් කර ඇති අයදුම්කරු සම්බන්ධ කර ගැනීමේ මාර්ගවන විද්‍යුත් තැපැල් ලිපිනය, Whatsapp අංකය හා දුරකථන අංක බඳවා ගැනීමේ කටයුතු අවසන් වනතුරු නොවෙනස්ව පවත්වා ගත යුතුය. එම අංක වෙනස් කිරීම හේතුවෙන් ඇතිවන අපහසුතාවයන්ට කෘෂිකර්ම දෙපාර්තමේන්තුව වගකියනු නොලැබේ.

7.6 විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේ අයදුම්කරුගේ අත්සන සහතික කර තිබිය යුතු ය. අයදුම්කරුවන් තම අත්සන රජයේ පාසලක ප්‍රධානියකු, කොට්ඨාසයේ ග්‍රාම නිලධාරි, සමාදාන විනිශ්චයකාරවරයකු, දිවුරුම් කොමසාරිස්වරයකු, නීතිඥවරයකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු, මාණ්ඩලික සේවයේ නිලධාරියකු, ත්‍රිවිධ හමුදා අධිකාරිය ලත් නිලධාරියකු හෝ බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමින්වහන්සේ නමක් හෝ අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්ත්වයක් දරන අයකු ලවා සහතික කර ගත යුතු ය.

7.7 විභාගය සඳහා පෙනී සිටින පළමු අවස්ථාවේ දී ම විභාග ශාලාධිපති වෙත තම අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතු ය.

7.8 විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත්කිරීම සම්බන්ධයෙන් කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයන් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පනවනු ලබන දඬුවමකට යටත්වීමට අපේක්ෂකයන් හට සිදුවේ.

7.9 තරග විභාගයේ දී සිසුන් ලබාගත් ලකුණු කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියෙහි ප්‍රසිද්ධ කරනු ලැබේ. එම ලකුණු පාදක කර ගනිමින් සහ බඳවාගනු ලබන සංඛ්‍යාව පිළිබඳව සැලකිලිමත් වෙමින් වැඩිම ලකුණු ලබා ගන්නා අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. එහි දී අධ්‍යාපනික හා අදාළ අනිකුත් සහතික පරීක්ෂා කිරීම සිදුකරන අතර සම්මුඛ පරීක්ෂණයට ලකුණු ලබා දෙනු නොලැබේ. කෘෂිකර්ම විද්‍යාලවලට ඇතුලත් කර ගැනීමට අපේක්ෂිත සිසුන් සංඛ්‍යාවට වඩා වැඩි සිසුන් ප්‍රමාණයක් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ.

7.10 ලිඛිත විභාගයට පෙනී සිටීමට ඉඩදීම මත හෝ සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීමට කැඳවීම මත හෝ අදාළ අයදුම්කරුවන්ගේ සුදුසුකම් පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ. විභාගයට පෙර හෝ එය පවත්වන අතර හෝ ඉන් පසුව හෝ යන කවර අවස්ථාවක දී වුවත් මෙම නිවේදනයේ කරුණු අනුව නුසුදුසු යැයි තීරණය වන අයදුම්කරුවන්ගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

7.11 ලිඛිත විභාගයට හෝ සම්මුඛ පරීක්ෂණයට හෝ ඒ දෙකටම හෝ පෙනී සිටීම වෙනුවෙන් රජය විසින් අයදුම්කරුවන්ට කිසිදු දීමනාවක් ගෙවනු නොලැබේ.

**08.** බඳවා ගැනීමේ ක්‍රමවේදය :

8.1 පාඨමාලාව සඳහා බඳවා ගැනීමට අපේක්ෂිත මුළු ශිෂ්‍ය සංඛ්‍යාවෙන් 90% ක ප්‍රමාණයක් අ.පො.ස. (උ.පෙළ) සුදුසුකම් මත බඳවා ගැනීමට කටයුතු කරන අතර, ඉතිරි 10% ක ප්‍රමාණය ජාතික වෘත්තීය සුදුසුකම් 4 (NVQ Level 4) මට්ටමේ සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන්ගෙන් බඳවා ගනු ලැබේ.

8.2 අදාළ වර්ෂයේ දී එක් එක් කෘෂිකර්ම විද්‍යාලයට ඇතුළත් කරගනු ලබන පිරිමි හා කාන්තා සිසුන් සංඛ්‍යාව තීරණය කරනුයේ එම විද්‍යාලවල පිරිමි හා කාන්තා නේවාසිකාගාරවල ඇති ධාරිතාවය සහ එම විද්‍යාලවල ඇති පුහුණු පහසුකම් පාදක කරගනිමිනි. එබැවින් තෝරා ගැනීමට සලකා බලන තරග විභාගයේ කඩඉම් ලකුණු මට්ටම් පිරිමි හා කාන්තා අයදුම්කරුවන් අතර වෙනස් විය හැක.

8.3 යම් අයදුම්කරුවෙක් පාඨමාලාවට බඳවා ගැනීම සඳහා කරනු ලබන අනියම්/අයුතු බලපෑම් ඔහු/ ඇය පාඨමාලාවට ඇතුලත් කර ගැනීම සඳහා නුසුදුසුකමක් වීමට හේතු වේ.

8.4 පාඨමාලාව හැදෑරීම සඳහා සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් කෘෂිකර්ම විද්‍යාලයන්ට අනුයුක්ත කිරීමෙන් පසු ඔවුන්ට කෘෂිකර්ම විද්‍යාල අතර මාරු වීම් සිදු කළ නොහැක.

8.5 පූර්ණකාලීන නේවාසික පාඨමාලාවක් වන මෙම පාඨමාලාවට ලියාපදිංචි වීමෙන් පසු පාඨමාලාව හැර යන්නේ නම් නැවත පාඨමාලාව හැදෑරීම සඳහා කිසිදු අවස්ථාවක් ලබා දෙනු නොලැබේ.

8.6 බඳවාගැනීමට අදාළ කරුණු සම්බන්ධයෙන් කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ තීරණය අවසන් තීරණය වේ.

8.7 සිංහල හා දෙමළ මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැලපීමක් හෝ අනනුකූලතාවයක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍යය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

ආචාර්ය ඩබ්. ඒ. ආර්. ටී. වික්‍රමආරච්චි,
කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්.

2026 මැයි මස 21 දින,
කෘෂිකර්ම දෙපාර්තමේන්තුව,
පේරාදෙණිය.

05 - 383

---

**ශ්‍රී ලංකා චිත්ත මනෝවිද්‍යා උසස් අධ්‍යාපන විවෘත විද්‍යායතනය**
**(2025 අංක 18 දරන පාර්ලිමේන්තු පනත් කෙටුම්පත හරහා සංස්ථාපනය කිරීමට කටයුතු යොදා ඇත)**

මත්ද්‍රව්‍ය නිවාරණය සහ පුනරුත්ථාපනය පිළිබඳ මනෝවිද්‍යා උපදේශන ඩිප්ලෝමා පාඨමාලාව
2026/2027 (ප්‍රධාන බඳවා ගැනීම)

ශ්‍රී ලංකා චිත්ත මනෝවිද්‍යා උසස් අධ්‍යාපන විවෘත විද්‍යායතනයේ මත්ද්‍රව්‍ය නිවාරණය සහ පුනරුත්ථාපනය පිළිබඳ මනෝවිද්‍යා උපදේශන ඩිප්ලෝමා පාඨමාලාව සඳහා විශ්වවිද්‍යාල ශිෂ්‍යයින්, උසස් පෙළ ඕනෑම අංශයකින් හැදෑරූ ශිෂ්‍යයින්, රාජ්‍ය හෝ පෞද්ගලික අංශයේ රැකියා නියුතු පිරිස්, මත්ද්‍රව්‍ය නිවාරණය සහ පුනරුත්තාපනය පිළිබඳ උනන්දුවක් දක්වන පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති අයට අයදුම්පත් කැඳවා ඇත.

**සුදුසුකම් :** අ.පො.ස. (උසස් පෙළ) ඕනෑම විෂයය ධාරාවකින් ලබාගත් S සාමාර්ථ 3ක් සහිතව සමත් වීම;

*හෝ*

වෘත්තීය සහ අධ්‍යාපනික වශයෙන් සලකා බැලිය හැකි වෙනත් සුදුසුකම් සපුරා තිබීම.

**සම්පූර්ණ අර්ස (Total credits) :** 30කි.

**සාමාසික ගණන :** සාමාසික 02කි.

**ඩිප්ලෝමාවේ ස්වභාවය :** මාර්ගගත ඉගැන්වීම් ක්‍රමවේදය (විවෘත සහ දුරස්ථ අධ්‍යයනය)

**ඉගැන්වීමේ ක්‍රමවේදය :** LMS පද්ධතිය හරහා ඉගැන්වීම්, පහසු දිනයක් තුළ දී නැරඹිය හැකි පටිගත කරන ලද දේශන සහ නිබන්ධන ලබාදීම සිදුකෙරේ.

**මාධ්‍ය :** සිංහල

**පාඨමාලා කාලය :** මාස 12කි.

**පාඨමාලා ගාස්තු සහ ශිෂ්‍ය ලියාපදිංචි ගාස්තු :** සම්පූර්ණ ඩිප්ලෝමාව සඳහා අයකිරීම රු. 36,000.00කි. ඩිප්ලෝමාව සඳහා ලියාපදිංචි වීමේ දී රු. 1,000.00 ක මුදලක් ලියාපදිංචි ගාස්තුව වශයෙන් ගෙවිය යුතු ය. රු. 36,000.00ක මුදල එකවර හෝ වාරික වශයෙන් ගෙවා අවසන් කළ හැකිය.

**පාඨමාලාව සඳහා අයදුම් කළ යුතු ආකාරය :**

අයදුම්කරුවන් විසින්,

1. තම ජාතික හැඳුනුම්පතේ/ගමන් බලපත්‍රයේ හෝ වෙනත් හඳුනාගතහැකි ඡායාරූපයක්,
2. අ.පො.ස. (උසස් පෙළ) විභාග ප්‍රතිඵල ලේඛනයේ සහ වෙනත් අධ්‍යාපනික සහතික ඡායාරූප,
3. තම වර්ණවත් පැහැදිළි ඡායාරූපයක් .

070 - 5337702 (WhatsApp) අංකයට යොමු කළ යුතු ය.

**වැඩි විස්තර සඳහා :** කාර්යාලීය වේලාවන් වන පෙ.ව. 8.30 සිට ප.ව. 4.30 දක්වා 081-3169800 දුරකතන අංකය හරහා විමසිය හැකිය.

ජ්‍යෙෂ්ඨ ලේඛකාධිකාරි,
ශ්‍රී ලංකා චිත්ත මනෝවිද්‍යා උසස් අධ්‍යාපන විවෘත විද්‍යායතනය.

05 - 384

## අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය

අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) ඛණ්ඩ 02 I,II සහ III ශ්‍රේණියේ නිලධාරින් සඳහා වන 1,2 හා 3 කාර්යක්ෂමතා කඩඉම් විභාග - 2026

**සේවා ගණ**

1. ලේඛන සහකාර
2. රසායනාගාර සහකාර
3. පාසල් දත්ත සටහන්කරු
4. ශිෂ්‍යා නිවාසාධිකාරි (ගැහැණු/පිරිමි)
5. සහකාර ශිෂ්‍යා නිවාසාධිකාරි (ගැහැණු/පිරිමි)
6. ස්ටීරියෝ වර්ගයේ යන්ත්‍ර ක්‍රියාකරු

01. ඉහත තනතුරුවලට අයත් නිලධාරීන් සඳහා අදාළ අනුමත බඳවා ගැනීමේ පරිපාටිවල විධිවිධානවලට අනුකූලව කාර්යක්ෂමතා කඩඉම් විභාගයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් 2026 සැප්තැම්බර් මස පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

අයදුම්පත් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www.doents.lk වෙබ් අඩවියේ “ Our Services” යටතේ ඇති “ Online Applications - Recruitment Exams /E.B. Exams” ඔස්සේ පළකර ඇති අතර අයදුම්පත් ඉදිරිපත් කළහැක්කේ මාර්ග ගත ක්‍රමයට (Online) පමණි.

මාර්ගගත අයදුම්පත් භාර ගැනීම **2026 මැයි මස 29 වැනි දින පෙ.ව.09.00ට විවෘත වන අතර 2026 ජූනි මස 30 වැනි දින රාත්‍රී 09.00ට අවසන් වේ.** අයදුම්පත මාර්ගගතව යොමු කළ පසු එය බාගත කර මුද්‍රිත පිටපතෙහි අදාළ කොටස් අත් අකුරින් පුරවා අයදුම්කරුගේ අත්සන සහතික කර, අදාළ ආයතන ප්‍රධානියාගේ සහතිකය සමඟ අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට හෝ ඊට පෙර ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

අයදුම්පත් යොමු කිරීම අවසාන දිනය දක්වා ප්‍රමාද කිරීමෙන් ඇති වන ඕනෑම අහිතකර තත්ත්වයන් අයදුම්කරු විසින් විඳ දරාගත යුතු ය.

02. 1. මෙම විභාගය ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන අතර විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් ඔහු විසින් නියම කරන ලද නීතිරීතිවලට විභාග අපේක්ෂකයන් යටත් වේ.

II. විභාග අපේක්ෂකත්වය ලැබීම සඳහා පනවා ඇති නීති *ගැසට්* පත්‍රයේ වෙනම මුද්‍රණය කර ඇත. මෙම නීති උල්ලංඝනය කළහොත් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔවුන්ට සිදුවනු ඇත.

III. මෙම විභාගය සඳහා අයදුම් කළ හැක්කේ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ පත්වීම් ලද මෙහි මුලින් දක්වා ඇති තනතුරුධාරීන්ට පමණි.

03. විභාග ගාස්තු :

විභාග ගාස්තුව රු 500 කි. විභාග ගාස්තු ගෙවීමේ දී මාර්ගගතව පද්ධතියෙන් ලබා දෙන පහත ගාස්තු ගෙවීමේ ක්‍රමවේදය යටතේ පමණක් ගෙවීම සිදු කළ යුතු ය.

I. ඕනෑම බැංකු ණය කාඩ්පතක් මගින් (Any Bank Credit Card),
II. අන්තර්ජාල ගෙවීම් පහසුකම් සහිත ඕනෑම බැංකු හර කාඩ්පතක් මගින් (Any Bank Debit Card With the Facility of Internet Transactions),
III. ලංකා බැංකු ඔන්ලයින් බැංකු ක්‍රමය මගින් (Online Banking Method of Bank of Ceylon ),
IV. ඕනෑම ලංකා බැංකු ශාඛාවක් මගින් (Any Branch of the Bank of Ceylon).

***සටහන :***

(*අ*) ඉහත ක්‍රම මගින් ගෙවීම් සිදුකරන ආකාරය පිළිබඳ උපදෙස් වෙබ් අඩවියේ විභාගයට අදාළ තාක්ෂණික උපදෙස් යටතේ පළ කර ඇත.

(*ආ*) ගෙවීම් ලැබුණු බවට කෙටි පණිවිඩයක් (SMS) මගින් හෝ විද්‍යුත් තැපැල් පණිවිඩයක් මගින් හෝ දන්වනු ලැබේ. විභාග ගාස්තුව සඳහා වන සම්පූර්ණ මුදලම ගෙවිය යුතු වන අතර විභාග ගාස්තු අඩුවෙන් හෝ වැඩියෙන් වශයෙන් ගෙවා ඇති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉහත සඳහන් ගෙවීම් ක්‍රම මගින් විභාග ගාස්තු ගෙවීමේදී සිදුවන දෝෂ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වග කියනු නොලැබේ.

(*ඇ*) විභාගය සඳහා ගෙවන ලද මුදල කිසිම හේතුවක් නිසා ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් සිදු කරනු නොලැබේ.

04. අයදුම්පත් :

මාර්ගගත (Online) විභාග අයදුම්පත ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් සම්පූර්ණ කළ යුතුය. අයදුම්කරු විසින් මාර්ගගතව යොමු කරන ලද මෘදු පිටපත හා ලියාපදිංචි තැපෑලෙන් යොමු කරන ලද මුද්‍රිත පිටපත (Printout) යන දෙකම විභාග දෙපාර්තමේන්තුවට ලැබුණු පසු එම මෘදු පිටපත හා මුද්‍රිත පිටපත සත්‍යාපනය කිරීම(Verify) සිදු කරනු ලබන අතර වලංගු අයදුම්පතක් බවට දෙපාර්තමේන්තුව විසින් භාර ගන්නා ලද බව/භාර නොගන්නා බව පද්ධතියට ප්‍රවේශ වීමට භාවිත කරන ලද ජංගම දුරකථන අංකයට කෙටි පණිවිඩයක් (SMS) මගින් හෝ විද්‍යුත් තැපැල් (E -mail) ලිපිනයට හෝ දැනුම් දෙනු ලැබේ. මාර්ගගත අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර විභාගය සඳහා අයදුම් කිරීම වෙනුවෙන් සකසා ඇති උපදෙස් පත්‍රිකාව (Instructions) බාගත කර ගන්න. අයදුම්පත පිරවීමේදී එම උපදෙස් තරයේ පිළිපදින්න. අයදුම්පතේ මුද්‍රිත පිටපතක් ලබා ගැනීමෙන් පසුව එහි සිදුකරනු ලබන කිසිදු සංශෝධනයක් වලංගු සංශෝධනයක් ලෙස සලකනු නොලැබේ. අසම්පූර්ණ අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පසුව ලැබෙන අයදුම්පත් භාර ගනු නොලැබේ. මුද්‍රිත පිටපත එවිය යුතු ලිපිනය " විභාග කොමසාරිස් ජනරාල්, ආයතනික විභාග ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, පැලවත්ත, බත්තරමුල්ල" වේ.

05. විභාග අපේක්ෂක / අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළදී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහාම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතු ය. ඒ සඳහා පහත දැක්වෙන කවර ලියවිල්ලක් හෝ භාර ගනු ලැබේ.

I. ජාතික හැඳුනුම්පත,
II. වලංගු විදේශ ගමන් බලපත්‍රය,
III. වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය.

එමෙන්ම විභාග අපේක්ෂකයන් අනන්‍යතාව තහවුරු කර ගත හැකි වන පරිදි මුහුණ හා විද්‍යුත් සන්නිවේදන උපකරණ පැළඳගෙන නොමැති බව තහවුරුකර ගත හැකිවන පරිදි දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතුය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතු ය.

06. *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග

ගාස්තුව ගෙවා ඊට අදාළ ලදුපත සමඟ නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමුකොට ඇති අයදුම්කරුවන් වෙත විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත.

විභාගයට පෙනී සිටින නිලධාරීන් විසින් විභාග ශාලාධිපති වෙත ඔවුන්ගේ අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍ර ඉදිරිපත් කළ යුතු ය. එවැනි ප්‍රවේශ පත්‍ර නොමැතිව විභාගයට පෙනී සිටීමට ඉඩ දෙනු නොලැබේ. අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියේ පළකරනු ඇත. නිවේදනය පළවී දින 02 ක් හෝ 03 ක් ගත වූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවෙන් විමසිය යුතු ය. එසේ විමසීමේ දී අයදුම්කරු තමා අයදුම් කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් විද්‍යුත් තැපැල් ලිපිනයක් වෙත යොමු කරමින් විමසා සිටීම වඩාත් ඵලදායී වනු ඇත. එසේ විමසීමේදී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා තමා ළඟ තබා ගත් අයදුම්පතේ පිටපත, විභාග ගාස්තු ගෙවීමට අදාළ ලදුපතේ පිටපත හා අයදුම්පත තැපැල් කිරීමේදී ලියාපදිංචි කළ කුවිතාන්සිය සූදානමින් තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. විභාගයට දින කිහිපයකට පෙර ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියෙන් ප්‍රවේශ පත්‍ර බාගත කර ගැනීමේ අවස්ථාව ලබා දෙනු ඇත.

07. අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම, ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට හෝ තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය.

08. ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද ප්‍රවේශ පත්‍ර ඇති නිලධාරින්ට විභාගයට පෙනී සිටීමට හැකි වන පරිදි දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් රාජකාරි නිවාඩු දිය යුතුය. ගමන් ගාස්තු ගෙවනු නොලැබේ.

09. විභාගය පැවැත්වෙන්නේ සිංහල හා දෙමළ මාධ්‍යවලින් පමණි. ඒ අතරින් තමන් අධ්‍යාපනය ලැබූ භාෂා මාධ්‍යයෙන් හෝ රාජ්‍ය භාෂාවෙන් හෝ විභාගයට පෙනී සිටිය හැකි අතර, පෙනී සිටින සෑම ප්‍රශ්න පත්‍රයකටම පිළිතුරු සැපයිය යුත්තේ එකම මාධ්‍යයයෙනි. අයදුම් කරන භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ. මෙම විභාගය කොළඹ දී පමණක් පවත්වනු ලැබේ.

10. අයදුම්පතේ ද විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේ ද අයදුම්කරුගේ අත්සන සහතික කර තිබිය යුතු ය. අයදුම්කරුවකු තම අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු ලවා සහතික කරවා ගත යුතු ය. තව ද විභාගය සඳහා පෙනී සිටින පළමු දිනයේම විභාග ශාලාධිපති වෙත තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතු වේ.

11. විභාග පරිපාටිය - එක් එක් කාර්යක්ෂමතා කඩඉම් විභාගය සඳහා පෙනී සිටිය හැකි නිලධාරීන් සඳහා වන විෂය නිර්දේශය පහත සඳහන් වේ.-

11.1 කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) ඛණ්ඩ 02 - III වන ශ්‍රේණියේ නිලධාරින් සඳහා වන 1 කාර්යක්ෂමතා කඩඉම් විභාගය

| *විෂයය* | *විෂයය අංකය* | *ලකුණු* | *කාලය* | *අවම සමත් ලකුණු* |
|---|---|---|---|---|
| කාර්යාල ක්‍රම | 01 | 100 | පැය2 | 40 |
| මුදල් රෙගුලාසි පිළිබඳ මූලික දැනුම | 02 | 100 | පැය2 | 40 |
| පරිගණක දැනුම පිළිබඳ පරීක්ෂණය | 03 | 100 | පැය1 ½ | 40 |

11.1.1 විෂයය අංකය (01) කාර්යාල ක්‍රම

රජයේ කාර්යාලවල භාවිතවන කාර්යාල ක්‍රම පිළිබඳ මූලික දැනුම

i. කාර්යාල ක්‍රම පිළිබඳ මූලධර්ම
ii. කාර්යාල ක්‍රම පිළිබඳ මූලධර්මවල වැදගත්කම
iii. කාර්යාල ක්‍රම භාවිත කිරීම පිළිබඳ අවබෝධය
iv. ලිපිගොනුකරණය

11.1.2 විෂයය අංකය (02) මුදල් රෙගුලාසි පිළිබඳ මූලික දැනුම

රජයේ කාර්යාලවල භාවිත වන මුදල් රෙගුලාසි පිළිබඳ මූලික දැනුම.

මුදල් රෙගුලාසි සංග්‍රහයේ පරිච්ඡේද I, II ,III, IV, V යටතේ ඒකාබද්ධ අරමුදල, වාර්ෂික වියදම් ඇස්තමේන්තු, ආදායම් ඇස්තමේන්තු අනුව වියදම් කිරීමට අධිකාරි බලය හා වියදම් පාලනය පිළිබඳ දැනුම, මුදල් පාලනය හා ගිණුම් තැබීම් හා ගෙවීම් පිළිබඳ සාමාන්‍ය අවබෝධය.

11.1.3 විෂයය අංකය (03) පරිගණක දැනුම පිළිබඳ පරීක්ෂණය :

I. අයදුම්කරුවන්ට පහත හැකියාවන් තිබේදැයි පරීක්ෂා කිරීම මෙම පරීක්ෂණයේ අරමුණ වේ.

- තොරතුරු තාක්ෂණය පිළිබඳ මූලික සංකල්ප
- පරිගණක මූලික කොටස් හා ඒවායේ සංකල්ප
- දෘඪාංග හා මෘදුකාංග.

II. මේ යටතේ බලාපොරොත්තුවන දැනුම හා කුසලතා :

- පරිගණකයක් ක්‍රමානුකූලව පණ ගැන්වීම හා ක්‍රියා විරහිත කිරීම
- පරිගණක තැටියක පරිගණක ගොනු රාශි (Directory) හා පරිගණක ගොනු (File) පිහිටි ආකාරය
- පරිගණක ගොනු රාශි අලුතින් ඇති කිරීම, එම ගොනු රාශියක අලුතින් ගොනුවක් ඇරඹීම, ගොනු අංක දැමීම, පිටපත් කිරීම, පිටපත් කළ ගොනු රාශියක ඇතුල්වීම, එක්ගොනු රාශියක් තවත් ගොනු රාශියකට ගෙන යාම, නම වෙනස් කිරීම
- මෘදුකාංග නැවත සැකසීම.

III. වදන් සැකසුම :

- මෘදුකාංග විවෘත කිරීම, නව ගොනුවක් ඇරඹීම, ගොනුවක් සුරක්ෂා කිරීම
- මෙනු වර්ග හා ඒවා භාවිතය, සංවාද කොටු
- ලියවිලි සංසරණය, ලියවිල්ලේ කොටස් තෝරා ගැනීම, කොටස් ඇතුළු කිරීම, කපා ඉවත් කිරීම, ගෙන යාම , පිටු අංක කිරීම
- පාඨ තිරස් එකේලි කිරීම, අකුරු වර්ග, පේළිවල ඉඩ තැබීම, පේළි අතර පරතරය, පාඨ පටන් ගන්නා තැන් යෙදීම, අක්ෂර වින්‍යාසය හා ව්‍යාකරණ
- පිටු සැකසීම, මුද්‍රණ මායිම් සැකසීම, මුද්‍රණය
- වගු ඇතුළත් කිරීම, පේළි තීරු ඇතුල් කිරීම, කොටු බෙදීම හා එක් කිරීම, ගොනු නියමිත ගොනු සුරක්ෂා කිරීම, නැවත ඒවා සොයා විවෘත කිරීම.
- ගොනු තැපැල් කටයුතු සඳහා එක් කිරීම(Mail Merging), තැපැල් ලේබන සැකසීම, ලිපි කවර සැකසීම හා ලිපි සැකසීම
- Micros භාවිතය, Micros අලුතින් සැකසීම, සටහන් කිරීම හා ක්‍රියාත්මක කිරීම.

IV. පැතුරුම්පත (Spread Sheet) :

- මෘදුකාංගය විවෘත කිරීම, අලුත් වැඩ පොතක් විවෘත කිරීම, ඒවායේ ගමන් කිරීම,
- වැඩපතකට දත්ත ඇතුළත් කිරීම, සමීකරණ ඇතුළත් කිරීම
- අංක සැකසීම, පාඨ එකේලි කිරීම, අකුරු හැඩ හා ප්‍රමාණ වෙනස් කිරීම
- දත්ත පිටපත් කිරීම, ගෙන යාම, සමීකරණ පිටපත් කිරීම
- ප්‍රස්තාර සැකසීම, ප්‍රස්තාර වර්ග, සංස්කරණය, මුද්‍රණය
- නව Micros ඇති කිරීම, පවතින Micros විවෘත කිරීම හා ක්‍රියාත්මක කිරීම.

V. ඉදිරිපත් කිරීම හා රූප භාවිතය (Presentation) :

- මෘදුකාංගය විවෘත කිරීම, නව ඉදිරිපත් කිරීමක් සැකසීම, Slides effect සැකසීම, ඉදිරිපත් කිරීම, සුරක්ෂා කිරීම
- Slides පාඨ ඇතුළත් කිරීම හා වෙනස් කිරීම, පාඨවලට විශේෂ ගුණයන් ඇතුළත් කිරීම, අක්ෂර ප්‍රමාණය හැඩය වෙනස් කිරීම
- Design ඉදිරිපත් කිරීමට යෙදීම, Slides සඳහා වර්ණ සංයෝජනය යෙදීම.

VI. දත්ත පාදයන් (Data Base)

- නව විමසුම් (Queries) හා පවතින විමසුම් භාවිතය, විවෘත කිරීම, පිටපත් කිරීම, සුරක්ෂා කිරීම, විමසුම සඳහා වගු භාවිතය
- දත්තවර්ගකොටතේරීම (Sorting), වගුවල දත්ත තේරීම

- වාර්තා (Reports) සැලසුම් කිරීම හා සැකසීම, විවෘත කිරීම, පිටපත් කිරීම, සුරක්ෂා කිරීම හා මුද්‍රණය.

VII. අන්තර්ජාලය (Internet) :

- අන්තර්ජාලය යනු කුමක් ද? එහි ප්‍රයෝජන, නිවස්න පිටුව
- අන්තර්ජාල පිටු, අන්තර්ජාලය තුළ ගමන් කිරීම, වෙබ් අඩවි සෙවීම
- දත්ත බාගත කිරීම, වෙබ් පිටු සුරක්ෂා කිරීම හා ඒවා මුද්‍රණය කිරීම.

*සටහන.-* 1 කාර්යක්ෂමතා කඩඉම් විභාගයේ සාමර්ථය ලැබීම සඳහා ඉහත විෂය අංක 1,2,3 යන සියලුම විෂයයන් සඳහා එක් එක් විෂයයට අදාළ ලකුණුවලින් අවම වශයෙන් ලකුණු 40 ක් බැගින් හෝ ඊට වැඩියෙන් නිලධාරියා විසින් ලබා ගත යුතු වේ.

11.2 කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) බණ්ඩ 02 – II ශ්‍රේණියේ නිලධාරින් සඳහා 2 කාර්යක්ෂමතා කඩඉම් විභාගය

| *විෂයය* | *විෂය අංකය* | *ලකුණු* | *කාලය* | *අවම සමත් ලකුණු* |
|---|---|---|---|---|
| කාර්යාල ක්‍රම | 04 | 100 | පැය1 ½ | 40 |
| විෂය දැනුම | 05 | 100 | පැය1 ½ | 40 |
| පොදු ප්‍රශ්න පත්‍රය | 06 | 100 | පැය1 ½ | 40 |

11.2.1 විෂය අංක (04) කාර්යාල ක්‍රම :

ආයතන සංග්‍රහයේ 1 හා 2 කොටස්වල අඩංගු විධි විධාන පිළබඳ දැනුම අපේක්ෂා කෙරේ.

ආයතන සංග්‍රහයේ I කාණ්ඩයේ I, II, IV, VII, VIII, XII පිළිබඳ සාමාන්‍ය අවබෝධය

ආයතන සංග්‍රහයේ II කාණ්ඩයේ පරිච්ඡේද XL,VII පිළිබඳ සාමාන්‍ය අවබෝධය.

11.2.2 විෂය අංක (05) විෂය දැනුම :

තනතුරට අදාළ රාජකාරි පිළිබඳ විෂයානුබද්ධ දැනුම පරීක්ෂා කර බැලීම. (අයදුම්කරු අයත් තනතුරට අදාළව පරීක්ෂා කෙරේ).

I. *ලේඛන සහකාර :*

පාසලට සේවාවක් ලබාගැනීම සම්බන්ධයෙන් බාහිර ආයතනයක් වෙත ලිපියක් යොමු කිරීම/ රජයේ ආයතනයක් වෙත ලිපියක් යොමු කිරීම, අසංවිධානාත්මකව ඇති දත්ත විධිමත් පරිදි යොදවා ප්‍රයෝජනයට ගන්නා පිළිවෙළ, නිවාඩු ලේඛනයක් නිවැරදිව පවත්වාගෙන යාම පිළිබඳව පාසල් දුරකථන නාමාවලි සකස් කිරීම, පාසල සතු සම්පත් ලේඛනයක් සකස් කිරීම, සංඛ්‍යාලේඛන වාර්තා පවත්වාගෙන යාමට අදාළ කරුණු, නිවැරදි සේවක සංඛ්‍යා විස්තර, ශිෂ්‍ය සංඛ්‍යාව හා වෙනත් දත්ත පවත්වාගෙන යාමට අදාළ කරුණු, 5 S සංකල්පය පාසල් කාර්යාලයට අදාළකර ගැනීම, පාසලේ සංවිධාන ව්‍යුහය පිළිබඳව/ පාසල් සංවර්ධන සමිති හා සංවිධාන පිළිබඳ අවබෝධය, ලේඛනවල ආරක්ෂාව, පාසලේ නිල උත්සව සංවිධානය කිරීම, පාසල් පොත් බෙදා හැරීම, නිල ඇඳුම් බෙදා හැරීම නිවැරදිව ඉටු කිරීම සඳහා කටයුතු සංවිධානය, පාසලේ විවිධ කටයුතු සඳහා අවශ්‍ය කරන පොත් පත් තබා ගැනීම, පාසල් ගිණුම් පවත්වා ගෙන යාම.

II. *රසායනාගාර සහකාර :*

විද්‍යාගාරයක ඇති උපකරණ හඳුනා ගැනීමට ඇති හැකියාව මැනබැලීම, මෙහි දී උපකරණයේ නම, පාවිච්චි කරන කාර්යයන්, එම උපකරණවල වටිනාකම ආදී කරුණු පිළිබඳ දැනුම, එක් එක් විශේෂිත උපකරණ පාවිච්චි කිරීමේ පිළිවෙළ, ගබඩා කිරීමේ දී සැලකිලිමත් විය යුතු විශේෂිත කරුණු පිළිබඳ දැනුම, උදා: වර්ණාවලීමානය, අණ්වීක්ෂ ආදී, පරීක්ෂණවලින් පසු නැවත සකස් කිරීමේ දැනුම, දාහක වර්ග, විද්‍යාගාරයට බලශක්තිය සැපයීම, ගෑස් නළ පද්ධතිය, ජල සැපයුම් පිළිබඳ දැනුම පරීක්ෂණ තත්ත්වවල දී භාවිත කරන උපරිම උෂ්ණත්ව සීමා ආදිය පිළිබඳ දැනුම.

- විද්‍යාගාරයක ඇති රසායනික මූලද්‍රව්‍ය හඳුනා ගැනීමට ඇති හැකියාව

මූලද්‍රව්‍ය භෞතික තත්ත්වයේ හඳුනා ගැනීමට ඇති හැකියාව ඝන, ද්‍රව, වායු වශයෙන් පවතින මූලද්‍රව්‍ය - ඒවායේ ස්ඵටික ස්වභාවය, වර්ණය, ගඳ සුවඳ ආදියත්, සාමාන්‍ය වායුගෝලීය තත්ත්වය යටතේ ගබඩා කළ හැකි ආකාරය පිළිබඳ දැනුම, ද්‍රව්‍යවල ප්‍රතික්‍රියා හඳුනා ගැනීම උදා:- ප්‍රබල අම්ල, භෂ්ම ප්‍රතික්‍රියා අනුමාපන ආදිය

නොදන්නා රසායනික ද්‍රව්‍ය හඳුනා ගැනීමට ඇති හැකියාව, හානි කර රසායන ද්‍රව්‍ය හඳුනා ගැනීම, එම හානි වැළැක්වීමට ඒවා ගබඩා කිරීමේ විශේෂ පිළිවෙළ පිළිබඳ දැනුම

- ද්‍රාවණ පිළියෙල කිරීමේ දැනුම

විද්‍යාගාර පරීක්ෂණ කටයුතු සඳහා යොදා ගන්නා ශාක හා සත්ත්ව කොටස් කල්තබා ගැනීමේ දී ගබඩා කළ යුතු ආකාරය පිළිබඳ දැනුම

පරීක්ෂණ අවස්ථාවල දී ශිෂ්‍යයන්ගේ ආරක්ෂාව පිළිබඳ සැලකිලිමත් විය යුතු කරුණු, විද්‍යාගාරයේ පවත්වාගෙන යායුතු ලේඛන පිළිබඳ දැනුම.

III. *පාසල් දත්ත සටහන්කරු :*

ආදාන උපාංග (Input Device), ප්‍රතිදාන උපාංග (Output Device), දත්ත ගබඩා කිරීමේ උපාංග (Storage Device) පිළිබඳ දැනුම, RAM හා ROM අතර වෙනස්කම් හා ඒවා පිළිබඳ දැනුම, පරිගණකවල (Operating System) භාවිතවන මෙහෙයුම් පද්ධති සහ පරිගණක වදන් සැකසුම් සඳහා භාවිත කළ හැකි මෘදුකාංග, සාමාන්‍ය මේස පරිගණකයක (Desktop Computer) ඇති ප්‍රධාන උපාංග / කොටස් හඳුනා ගැනීම, යතුරු පුවරුවේ කොටස් හඳුනා ගැනීම, පරිගණක භාවිතයේ දී පරිශීලකයාගේ ශරීර සෞඛ්‍යය රැක ගැනීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග පිළිබඳ දැනුම, මිනිස් ශ්‍රමය හා සාමාන්‍ය යතුරු ලියනය භාවිතයට (Word Processing) සාපේක්ෂව පරිගණක භාවිතයේ ඇති වාසි, පරිගණක දත්ත ගබඩා කිරීමේ දී යොදා ගනු ලබන ඒකක පිළිබඳ දැනුම, MS Word හි ලිපියක් සැකසීමේ දී යොදාගනු ලබන ක්‍රමවේද පිළිබඳ අවබෝධය

(උදා:- Bold, Underline, Font size…) MS Excel (පැතුරුම් පත්) හි භාවිත කරනු ලබන ශ්‍රිතයන් (formula), පිළිබඳ දැනුම,

(උදා:- එකතුව, මධ්‍යන්‍යය), දත්ත වර්ග (Data Types) හඳුනා ගැනීම, MS Power Point භාවිතය හා එමගින් Presentation ඉදිරිපත් කිරීමේදී ගනු ලබන ක්‍රියාමාර්ග පිළිබඳ අවබෝධය, යතුරු පුවරුවේ කෙටි විධාන (Shortcut Keys) පිළිබඳ අවබෝධය හා කෙටි යෙදුම් සඳහා අදාළ දිග යෙදුම් හඳුනා ගැනීම, Recycle Bin හි ඇති ගොනුවක් නැවත ස්ථාපනය (Restore) කිරීමේ ක්‍රියා පිළිවෙළ, අන්තර්ජාල, විද්‍යුත් තැපැල භාවිතය පිළිබඳ අවබෝධය, විවෘත හා නිදහස් මෘදුකාංග පිළිබඳ අවබෝධය Generation Languages පිළිබඳ මූලික අවබෝධය, පරිගණක තිර (Monitor) තාක්ෂණය අනුව වර්ග කිරීම පිළිබඳ මූලික දැනුම පරිගණකයට අඛණ්ඩ ජව සැපයුම් යන්ත්‍රයකින් (UPS) ඇති ප්‍රයෝජන හඳුනා ගැනීම.

IV. *ශිෂ්‍ය නිවාසාධිකාරී (ගැහැණු/ පිරිමි)*

V. *සහකාර ශිෂ්‍ය නිවාසාධිකාරී (ගැහැණු/ පිරිමි)*

නේවාසිකාගාරයක් තුළ දී නේවාසික සිසුන් පිළිපැදිය යුතු නීති රීති පිළිබඳ දැනුම, සිසුන් සම්බන්ධයෙන් නේවාසිකාගාරය තුළ පවත්වාගෙන යායුතු ලේඛන පිළිබඳ දැනුම, මුළුතැන් ගෙය සඳහා ද්‍රව්‍ය මිල දී ගැනීමේ දී පවත්වාගෙන යා යුතු තොග ලේඛන, නිකුත් කිරීමේ ලේඛන හා භාර ගැනීමේ ලේඛන පිළිබඳ

දැනුම, නේවාසිකාගාරය තුළ පවතින දේපළවල ආරක්ෂාව සඳහා ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳ දැනුම, ජලය සහ විදුලිය සැපයීම් පද්ධතිය පිළිබඳ දැනුම, ඒවා නඩත්තුව පිළිබඳ දැනුම සහ අරපිරිමැස්ම සඳහා නේවාසිකාගාර තුළ පවත්වාගෙන යා යුතු ක්‍රියාමාර්ග පිළිබඳ දැනුම, බෝවන රෝග පිළිබඳ දැනුම, බෝවන රෝග වළක්වා ගැනීමට නේවාසිකාගාරයක අනුගමනය කළ යුතු විධිවිධාන පිළිබඳ දැනුම, හදිසි ආපදාවක දී ක්‍රියාත්මක විය යුතු ක්‍රියා මාර්ග පිළිබඳ දැනුම සහ පැමිණීම බැහැරවීම ලේඛන පිළිබඳ දැනුම.

VI. *ස්ටීරියෝ වර්ගයේ යන්ත්‍ර ක්‍රියාකරු / කාර්මික සහකාර :*

ස්ටීරියෝ වර්ගයේ යන්ත්‍ර ක්‍රියාකරවීම හා එමගින් බ්‍රේල් ලිවීම, එම සෝදුපත් බැලීම ආශ්‍රිත පිළිවෙළ, තර්මෆෝම් යන්ත්‍ර ක්‍රියා කරවීම, බ්‍රේල් මුද්‍රණ යන්ත්‍ර ක්‍රියා කරවීම පිළිබඳ අවබෝධය, පරිගණක මගින් බ්‍රේල් ලිවීම, කියවීම, පොත් බැඳීම සම්බන්ධ නිවැරදි ක්‍රමවේද පිළිබඳ දැනුම .

11.2.3 විෂය අංක (06) පොදු ප්‍රශ්න පත්‍රය :

1. කිසියම් ප්‍රකාශයක් හෝ සාකච්ඡාවක සටහනක් කියවා අවබෝධ කොටගෙන ලිපියක් හෝ වාර්තාවක් පිළියෙල කිරීම.

2. කාලීන සමාජීය සිදුවීම් පිළිබඳ අවබෝධ කොටගෙන විග්‍රහකොට දැක්වීම පිළිබඳ හැකියාව මැනීම.

***සටහන :*** 2 කාර්යක්ෂමතා කඩඉම් විභාගයේ සාමර්ථය ලැබීම සඳහා ඉහත විෂය අංක 4, 5, 6 යන සියලුම විෂයයන් සඳහා එක් එක් විෂයයට අදාළ ලකුණුවලින් අවම වශයෙන් ලකුණු 40 ක් බැගින් හෝ ඊට වැඩියෙන් නිලධාරියා විසින් ලබා ගත යුතු වේ.

11.3 කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) ඛණ්ඩ 02 - I වන ශ්‍රේණියේ නිලධාරීන් සඳහා 3 වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය :

| *විෂයය* | *විෂය අංකය* | *ලකුණු* | *කාලය* | *සමත් අවම ලකුණු* |
|---|---|---|---|---|
| කාර්ය විශේෂිත දැනුම | 07 | 100 | පැය1 ½ | 40 |
| විෂයානුබද්ධ අධ්‍යයනය | 08 | 100 | පැය1 ½ | 40 |

11.3.1 විෂය අංකය (07) කාර්යය විශේෂිත දැනුම - ලිඛිත පරීක්ෂණය :

පළමු හා දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයන් හි විෂය නිර්දේශයට ඇතුළත්ව ඇති කරුණු පිළිබඳ අදාළ නිලධාරීන්ගේ දැනුම හා කුසලතාව, ඔහුගේ ජොෂ්ඨතාවට සරිලන පරිදි වැඩි දියුණු වී තිබේ ද යන්න හා ගත වූ කාලය තුළ එකී ක්ෂේත්‍රයන්හි සිදුව ඇති නවාකරණයන් පිළිබඳ ඔවුන්ගේ දැනුවත්භාවය පිළිබඳ මැන බැලීම සඳහා වන පරීක්ෂණයකි. (අයදුම්කරු අයත් තනතුරට අදාළව පරීක්ෂා කෙරේ.)

I. ලේඛන සහකාර :

පාසලට සේවාවක් ලබා ගැනීම සම්බන්ධයෙන් බාහිර ආයතනයක් වෙත ලිපියක් යොමු කිරීම/රජයේ ආයතනයක් වෙත ලිපියක් යොමු කිරීම, අසංවිධානාත්මකව ඇති දත්ත විධිමත් පරිදි යොදවා ප්‍රයෝජනයට ගන්නා පිළිවෙළ, නිවාඩු ලේඛනයක් නිවැරදිව පවත්වාගෙන යාම පිළිබඳව පාසල් දුරකථන නාමාවලි සකස් කිරීම, පාසල සතු සම්පත් ලේඛනයක් සකස් කිරීම, සංඛ්‍යාලේඛන වාර්තා පවත්වාගෙන යාමට අදාළ කරුණු, නිවැරදි සේවක සංඛ්‍යා විස්තර, ශිෂ්‍ය සංඛ්‍යාව හා වෙනත් දත්ත පවත්වාගෙන යාමට අදාළ කරුණු, 5 S සංකල්පය පාසල් කාර්යාලයට අදාළ කර ගැනීම, පාසලේ සංවිධාන ව්‍යුහය පිළිබඳව / පාසල් සංවර්ධන සමිති හා සංවිධාන පිළිබඳ අවබෝධය, ලේඛනවල ආරක්ෂාව, පාසලේ නිල උත්සව සංවිධානය කිරීම, පාසල් පොත් බෙදා හැරීම, නිල ඇඳුම් බෙදා හැරීම නිවැරදිව ඉටු කිරීම සඳහා කටයුතු සංවිධානය, පාසලේ විවිධ කටයුතු සඳහා අවශ්‍ය කරන

පොත් පත් තබා ගැනීම, පාසල් ගිණුම් පවත්වා ගෙන යාම

II. රසායනාගාර සහකාර

විද්‍යාගාරයක ඇති උපකරණ හඳුනා ගැනීමට ඇති හැකියාව මැන බැලීම, මෙහිදී උපකරණයේ නම, පාවිච්චි කරන කාර්යයන්, එම උපකරණවල වටිනාකම ආදී කරුණු පිළිබඳ දැනුම, එක් එක් විශේෂිත උපකරණ පාවිච්චි කිරීමේ පිළිවෙළ , ගබඩා කිරීමේ දී සැලකිලිමත්විය යුතු විශේෂිත කරුණු පිළිබඳ දැනුම, උදා - වර්ණාවලීමානය, අන්වීක්ෂ ආදී, පරීක්ෂණවලින් පසු නැවත සකස් කිරීමේ දැනුම, දාහක වර්ග, විද්‍යාගාරයට බල ශක්තිය සැපයීම, ගෑස් නළ පද්ධතිය, ජල සැපයුම් පිළිබඳ දැනුම, පරීක්ෂණ තත්ත්වවලදී භාවිත කරන උපරිම උෂ්ණත්ව සීමා ආදිය පිළිබඳ දැනුම.

- විද්‍යාගාරයක ඇති රසායන මූලද්‍රව්‍ය හඳුනා ගැනීමට ඇති හැකියාව

  මූලද්‍රව්‍ය භෞතික තත්ත්වයේ හඳුනා ගැනීමට ඇති හැකියාව.

  ඝන, ද්‍රව, වායු වශයෙන් පවතින මූලද්‍රව්‍ය - ඒවායේ ස්ඵටික ස්වභාවය, වර්ණය, ගඳ සුවඳ ආදියත්, සාමාන්‍ය වායුගෝලීය තත්ත්වය යටතේ ගබඩා කළ හැකි ආකාරය පිළිබඳ දැනුම, ද්‍රව්‍යවල ප්‍රතික්‍රියා හඳුනා ගැනීම උදා:- ප්‍රබල අම්ල, භෂ්ම ප්‍රතික්‍රියා අනුමාපන ආදිය.

  නොදන්නා රසායනික ද්‍රව්‍ය හඳුනා ගැනීමට ඇති හැකියාව, හානිකර රසායන ද්‍රව්‍ය හඳුනා ගැනීම, එම හානි වැළැක්වීමට ඒවා ගබඩා කිරීමේ විශේෂ පිළිවෙළ පිළිබඳ දැනුම

- ද්‍රාවණ පිළියෙල කිරීමේ දැනුම විද්‍යාගාර පරීක්ෂණ කටයුතු සඳහා යොදා ගන්නා ශාක හා සත්ත්ව කොටස් කල් තබා ගැනීමේදී ගබඩා කළ යුතු ආකාරය පිළිබඳ දැනුම.

  පරීක්ෂණ අවස්ථාවල දී ශිෂ්‍යයන්ගේ ආරක්ෂාව පිළිබඳ සැලකිලිමත් විය යුතු කරුණු.

  විද්‍යාගාරයේ පවත්වාගෙන යායුතු ලේඛන පිළිබඳ දැනුම.

III. පාසල් දත්ත සටහන්කරු

ආදාන උපාංග (Input Device), ප්‍රතිදාන උපාංග (Output Device), දත්ත ගබඩා කිරීමේ උපාංග (Storage Device) පිළිබඳ දැනුම, RAM හා ROM අතර වෙනස්කම් හා ඒවා පිළිබඳ දැනුම, පරිගණකවල (Operating System) භාවිතාවන මෙහෙයුම් පද්ධති සහ පරිගණක වදන් සැකසුම් සඳහා භාවිත කළ හැකි මෘදුකාංග, සාමාන්‍ය මේස පරිගණකයක (Desktop Computer) ඇති ප්‍රධාන උපාංග/ කොටස් හඳුනා ගැනීම, යතුරු පුවරුවේ කොටස් හඳුනා ගැනීම, පරිගණක භාවිතයේදී පරිශීලකයාගේ ශරීර සෞඛ්‍ය රැක ගැනීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග පිළිබඳ දැනුම, මිනිස් ශ්‍රමය හා සාමාන්‍ය යතුරු ලියනය භාවිතයට (Word Processing) සාපේක්ෂව පරිගණක භාවිතයේ ඇති වාසි, පරිගණක දත්ත ගබඩා කිරීමේදී යොදා ගනු ලබන ඒකක පිළිබඳ දැනුම, MS Word හි ලිපියක් සැකසීමේදී යොදාගනු ලබන ක්‍රමවේද පිළිබඳ අවබෝධය (උදා:- Bold, Underline, Font size…), MS Excel (පැතුරුම්පත්) හි භාවිත කරනු ලබන ශ්‍රිතයන් (formula) පිළිබඳ දැනුම (උදා:- එකතුව, මධ්‍යන්‍යය), දත්ත වර්ග (Data Types) හඳුනා ගැනීම, MS Power Point භාවිතය හා එමගින් Presentation ඉදිරිපත් කිරීමේදී ගනු ලබන ක්‍රියාමාර්ග පිළිබඳ අවබෝධය, යතුරු පුවරුවේ කෙටි විධාන (Shortcut Keys) පිළිබඳ අවබෝධය හා කෙටි යෙදුම් සඳහා අදාළ දිග යෙදුම් හඳුනා ගැනීම, Recycle Bin හි ඇති ගොනුවක්, නැවත ස්ථාපනය (Restore) කිරීමේ ක්‍රියා

පිළිවෙළ, අන්තර්ජාල, විද්‍යුත් තැපැල භාවිතය පිළිබඳ අවබෝධය, විවෘත හා නිදහස් මෘදුකාංග පිළිබඳ අවබෝධය, Generation Languages පිළිබඳ මූලික අවබෝධය, පරිගණක තිර (Monitor) තාක්ෂණය අනුව වර්ග කිරීම පිළිබඳ මූලික දැනුම පරිගණකයට අඛණ්ඩ ජව සැපයුම් යන්ත්‍රයකින් (UPS) ඇති ප්‍රයෝජන හඳුනා ගැනීම.

IV. ශිෂ්‍ය නිවාසාධිකාරි (ගැහැනු/ පිරිමි)

V. සහකාර ශිෂ්‍ය නිවාසාධිකාරි (ගැහැනු/ පිරිමි)

නේවාසිකාගාරයක් තුළ දී නේවාසික සිසුන් පිළිපැදිය යුතු නීතිරීති පිළිබඳ දැනුම, සිසුන් සම්බන්ධයෙන් නේවාසිකාගාරය තුළ පවත්වාගෙන යා යුතු ලේඛන පිළිබඳ දැනුම, මුළුතැන් ගෙය සඳහා ද්‍රව්‍ය මිලදී ගැනීමේදී පවත්වාගෙන යා යුතු තොග ලේඛන, නිකුත් කිරීමේ ලේඛන හා භාර ගැනීමේ ලේඛන පිළිබඳ දැනුම, නේවාසිකාගාරය තුළ පවතින දේපළවල ආරක්ෂාව සඳහා ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳ දැනුම, ජලය සහ විදුලිය සැපයීම් පද්ධතිය පිළිබඳ දැනුම, ඒවා නඩත්තුව පිළිබඳ දැනුම සහ අරපිරිමැස්ම සඳහා නේවාසිකාගාර තුළ පවත්වාගෙන යා යුතු ක්‍රියාමාර්ග පිළිබඳ දැනුම, බෝවන රෝග පිළිබඳ දැනුම, බෝවන රෝග වළක්වා ගැනීමට නේවාසිකාගාරයක අනුගමනය කළ යුතු විධිවිධාන පිළිබඳ දැනුම, හදිසි ආපදාවකදී ක්‍රියාත්මක විය යුතු ක්‍රියාමාර්ග පිළිබඳ දැනුම සහ පැමිණීම, බැහැරවීම ලේඛන පිළිබඳ දැනුම.

VI. ස්ටීරියෝ වර්ගයේ යන්ත්‍ර ක්‍රියාකරු / කාර්මික සහකාර

ස්ටීරියෝ වර්ගයේ යන්ත්‍ර ක්‍රියාකරවීම හා එමඟින් බ්‍රේල් ලිවීම, එම සෝදුපත් බැලීම ආශ්‍රිත පිළිවෙළ, තර්මෆෝම් යන්ත්‍ර ක්‍රියාකරවීම, බ්‍රේල් මුද්‍රණ යන්ත්‍ර ක්‍රියාකරවීම පිළිබඳ අවබෝධය, පරිගණක මඟින් බ්‍රේල් ලිවීම, කියවීම, පොත් බැඳීම සම්බන්ධ නිවැරදි ක්‍රමවේද පිළිබඳ දැනුම .

11.3.2. විෂය අංකය (08) විෂයානුබද්ධ අධ්‍යයනය

කාර්යාල පරිපාලනයට අදාළ වන ගැටලුවකට ගත යුතු ක්‍රියාමාර්ග විභාග වන පරිදි සැකසුනු බහුවරණ ප්‍රශ්න පත්‍රයකට පිළිතුරු සැපයිය යුතු වේ.

***සටහන-3*** වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය සාමර්ථ්‍යය ලැබීම සඳහා ඉහත විෂය අංක 7,8 යන සියලුම විෂයයන් සඳහා එක් එක් විෂයයට අදාළ ලකුණුවලින් අවම වශයෙන් 40 ක් බැගින් හෝ ඊට වැඩියෙන් නිලධාරියා විසින් ලබා ගත යුතු වේ.

12 අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය.

13 මෙම විභාග නිවේදනය මඟින් විධිවිධාන සලසා නොමැති කවර කරුණක් පිළිබඳව වුව ද අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්ගේ තීරණය අවසාන තීරණය වන්නේය.

14 සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැළපීමක් හෝ අනනුකූලතාවක් ඇති බව පෙනී යන්නේනම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

**නාලක කලුවැව,**
ලේකම්,
අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය
අධ්‍යාපන අමාත්‍යාංශය.

2025 දෙසැම්බර් මස 01 දින,
අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය,
"ඉසුරුපාය",
බත්තරමුල්ල.

05 - 388

### සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය

### සිසු හෙද පුහුණුවට බඳවා ගැනීම - 2026 වර්ෂය

සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ සිසු හෙද පුහුණු පාඨමාලාව සඳහා බඳවාගැනීමට සුදුසුකම් ලබා ඇති ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් 2026.05.29 දින සිට 2026.06.30 දින දක්වා අයදුම්පත් කැඳවනු ලැබේ. මේ සඳහා අයදුම් කළ හැක්කේ මෙම අමාත්‍යාංශයේ නිල වෙබ් අඩවිය (www.health.gov.lk) ඔස්සේ පමණි.

**1. සැලකිය යුතුයි:**

1.1. එක් අයදුම්කරුවෙකුට ඉදිරිපත්කළ හැක්කේ එක් අයදුම්පතක් පමණි. එක් අයදුම්පතකට වඩා වැඩියෙන් ඉදිරිපත්කර ඇති අයදුම්කරුවන්ගේ සියලු අයදුම්පත් කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. 2021, 2022, 2023 සහ 2024 යන සියලු වර්ෂවලින් හෝ කිහිපයකින් අ.පො.ස. (උ.පෙළ) විභාගය සමත් අයෙකුට වුවද ඉදිරිපත් කළ හැක්කේ එක් අයදුම්පතක් පමණි. එවැනි අයදුම්කරුවන්ට තම මනාපය අනුව තෝරාගනු ලබන එක් වර්ෂයකින් පමණක් අයදුම්පතක් ඉදිරිපත් කළ හැකිය. වර්ෂ කිහිපයකින් අයදුම්පත් ඉදිරිපත් නොකළ යුතු ය. එසේ නොමැතිව වර්ෂ කිහිපයකින් අයදුම්පත් ඉදිරිපත් කර ඇති අයදුම්කරුවන් වේ නම් එකී සියලු අයදුම්පත් ද කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

1.2. පසුගිය වසර කිහිපයක් තුළ බඳවා ගැනීම් පිළිබඳව අවධානය යොමු කිරීමේ දී එක් සිසුවෙකු විසින් රජයේ නිදහස් අධ්‍යාපන වරප්‍රසාද යටතේ විවිධ රාජ්‍ය ආයතන විසින් පවත්වාගෙන යනු ලබන පාඨමාලා කිහිපයක ලියාපදිංචිවීම නිසා, සුදුසුකම් සහිත තවත් සිසුන් ගණනාවකට එවැනි එක් අවස්ථාවක් හෝ නොලැබීයාමේ තත්වයක් නිරීක්ෂණය විය. ඊට අමතරව මෙම තත්වය නිසා රජයේ මුදල් අපතේ යාමක් සිදුවන අතරම පාඨමාලාව අවසානයේ දී අපේක්ෂා කළ පුහුණු වෘත්තිකයින් සංඛ්‍යාව නොමැතිවීම නිසා අදාළ ආයතනවල සැළසුම්ගත ඉලක්කයන් ද ඉටුකරගත නොහැකි වේ. එබැවින්, මෙම තත්වය අවම කර සෑම අයදුම්කරුවෙකුට ම එක් අවස්ථාවක් හෝ හිමිකරදීමට අවශ්‍ය ප්‍රතිපාදන මෙම *ගැසට්* නිවේදනයෙහි අංක 5 ඡේදය මගින් ප්‍රකාශයට පත්කර ඇත. ඒ අනුව අංක 5.1 සිට 5.5 දක්වා වන අනුඡේදවලින් සවිස්තරාත්මකව දක්වා ඇති පරිදි නුසුදුසු අයෙකු මේ සඳහා අයදුම් නොකළ යුතු ය. කෙසේ වෙතත්, එවැනි නුසුදුසුකම් පවතින අයෙකු මේ සඳහා අයදුම්කර, පසු අවස්ථාවක දී අනාවරණය වුවහොත් ඔවුන්ට විරුද්ධව *ගැසට්* නිවේදනයේ 9.3 අනුඡේදය ප්‍රකාරව කටයුතු කරනු ලැබේ.

1.3. පසුගිය බඳවාගැනීම්වල දී සාවද්‍ය තොරතුරු (සාවද්‍ය විභාග වර්ෂ, විෂයයන්, ලබා ඇති ශ්‍රේණි යනාදිය) ඇතුලත් කර අයදුම්පත් ඉදිරිපත් කර ඇති බව නිරීක්ෂණය වූ අතර, සමහර අයදුම්කරුවන් ව්‍යාජ තොරතුරු ඇතුලත් කර සකස් කරන ලද සහතික සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් කර ඇති බවද නිරීක්ෂණය විය. එය බරපතල වරදකි. එබැවින්, කිසිදු අයදුම්කරුවෙකු තමා විසින් ඉදිරිපත් කරනු ලබන විද්‍යුත් අයදුම්පතට සාවද්‍ය තොරතුරු ඇතුළත් නොකළ යුතු ය. සාවද්‍ය තොරතුරු ඇතුලත් කර ඉදිරිපත් කර ඇති සෑම අයදුම්පතක්ම කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කර, එවැනි අයදුම්කරුවන්ට විරුද්ධව නීත්‍යානුකූලව කටයුතු කිරීම සඳහා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට යොමු කරන අතර ඔවුන්ගේ නම් නැවත රජයේ සේවයට නොගන්නවුන්ගේ අසාධු ලේඛනයට ඇතුලත් කිරීමට ද කටයුතු කරනු ලැබේ.

1.4. සෑම අයදුම්කරුවෙකු විසින් ම පළමුව මෙම *ගැසට්* නිවේදනයේ සහ වෙබ් අඩවියෙහි ඉදිරිපත් කර ඇති විද්‍යුත් අයදුම්පත සම්පූර්ණ කිරීම සඳහා වන උපදෙස් පත්‍රිකාවේ සඳහන් සියලුම කරුණු ඉතා හොඳින් කියවා තේරුම්ගෙන මෙම පාඨමාලාව සඳහා අයදුම්පතක් ඉදිරිපත් කිරීමට තමන් සුදුස්සෙකු බවට තහවුරු කර ගත යුතු ය. අනතුරුව *ගැසට්* නිවේදනයේ 7.3 ඡේදයට අනුව ඕනෑම ලංකා බැංකු ශාඛාවකට රු.1000/- ක මුදල ගෙවා ලබාගත් රිසිට් පත, 9.4, 9.5, හා 9.6 යන ඡේදවල දක්වා ඇති ලේඛන ද සූදානම් කරගෙන අයදුම්පත සම්පූර්ණ කිරීමට කටයුතු කිරීමෙන් ඔබට අයදුම්පත් යොමුකිරීමේ ක්‍රියාවලිය සාර්ථකව සිදුකළ හැකිය.

**02.** **පාඨමාලාවට අදාළ අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් :**

| *අ.පො.ස. (සා.පෙළ) සුදුසුකම්* | *අ.පො.ස. (උ.පෙළ) සුදුසුකම්* | *පුහුණු පාඨමාලාවට අදාල වෙනත් සුදුසුකම් සහ විශේෂ කරුණු* |
|---|---|---|
| සිංහල භාෂාව / දෙමළ භාෂාව, ගණිතය, විද්‍යාව හා ඉංග්‍රීසි යන විෂයයන් 04 ට සම්මාන සාමාර්ථ සහිතව දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් (06) අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත් වීම. | 2021, 2022, 2023,වර්ෂයේ හෝ 2024 වර්ෂයේ හෝ යන විභාගවලින් එකකදී අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී ජීව විද්‍යා විෂය ධාරාවට අයත් ජීව විද්‍යාව, රසායන විද්‍යාව, කෘෂි විද්‍යාව, භෞතික විද්‍යාව හා ගණිතය යන විෂයයන් අතුරින් විෂයයන් 03 කින් එකවර සමත් වීම; (සාමාන්‍ය පොදු පරීක්ෂණය හා සාමාන්‍ය ඉංග්‍රීසි හැර);<br><br>*හෝ*<br><br>2021, 2022, 2023 වර්ෂයේ හෝ 2024 වර්ෂයේ හෝ යන විභාගවලින් එකකදී අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී භෞතික විද්‍යා විෂය ධාරාවට අයත් සංයුක්ත ගණිතය, රසායන විද්‍යාව, භෞතික විද්‍යාව හා උසස් ගණිතය යන විෂයයන් අතුරින් විෂයයන් 03 කින් එකවර සමත් වීම. (සාමාන්‍ය පොදු පරීක්ෂණය හා සාමාන්‍ය ඉංග්‍රීසි හැර). | පූර්ණකාලීන පාඨමාලාවක් වන මෙහි කාලසීමාව අවු. 03 කි.<br><br>පාඨමාලාව ඉංග්‍රීසි මාධ්‍යයෙන් හැදෑරිය යුතු ය.<br><br>2026.05.29 දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා 28 ට නොවැඩි විය යුතු ය.<br><br>උස අඩි 04 යි අඟල් 10කට (147.3CM) නොඅඩු විය යුතු ය.<br><br>අවිවාහක විය යුතු ය.<br><br>ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයට ම අයදුම් කළ හැකිය. |

**අංක 01 වගුව**

**3. පාඨමාලාවට තෝරාගැනීමේ ක්‍රමවේදය :**

3.1 සිසු හෙද පුහුණුව සඳහා බඳවාගැනීම අංක 1837/8 හා 2013.11.19 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ *ගැසට් පත්‍රයේ* පළකරන ලද ශ්‍රී ලංකා හෙද සේවා ව්‍යවස්ථාවට හා ඊට වරින්වර සිදුකරන ලද සංශෝධන ප්‍රකාරව සුදුසුකම් සපුරාලන අයදුම්කරුවන්ගෙන් සිදුකරනු ලැබේ. (පිරිමි අයදුම්කරුවන් බඳවා ගැනීම හෙද සේවා ව්‍යවස්ථාවේ විධිවිධාන අනුව මෙම අමාත්‍යාංශය යටතේ ඇති ආයතනවල අවශ්‍යතා පදනම් කරගනිමින් සිදුකරනු ලැබේ.)

3.2 දිවයිනෙන් බඳවා ගැනීමට නියමිත සම්පූර්ණ සංඛ්‍යාව එක් එක් දිස්ත්‍රික්කයේ ජනගහනය පදනම් කරගෙන ජන සංඛ්‍යාවට සමානුපාතිකව බෙදා එක් එක් දිස්ත්‍රික්කයෙන් බඳවාගත යුතු සංඛ්‍යාව තීරණය කරනු ලැබේ.

3.3 ඉන්පසු එම එක් එක් දිස්ත්‍රික්කයෙන් බඳවාගත යුතු සංඛ්‍යාව අදාළ දිස්ත්‍රික්කයෙන් 2021, 2022, 2023 වර්ෂයේ හෝ 2024 වර්ෂයේ හෝ යන විභාගවලින් එකක දී එම එක් එක් විභාගයෙන් අයදුම්කර අවශ්‍ය අවම අධ්‍යාපන සුදුසුකම් සපුරා ඇති සම්පූර්ණ අයදුම්කරුවන් සංඛ්‍යාවට සමානුපාතිකව බෙදා අදාළ දිස්ත්‍රික්කයෙන් එම එක් එක් විභාගයෙන් බඳවා ගත යුතු සංඛ්‍යාව තීරණය කරනු ලැබේ.

3.4 ඉන්පසු එම එක් එක් විභාගයෙන් බඳවා ගත යුතු සංඛ්‍යාව එම විභාගයේ ජීව විද්‍යා විෂය ධාරාව හා භෞතික විද්‍යා විෂය ධාරාව යටතේ මෙම පාඨමාලාවට අයදුම්කර අවම අධ්‍යාපන සුදුසුකම් සම්පූර්ණ කර ඇති සම්පූර්ණ අයදුම්කරුවන් සංඛ්‍යාවට සමානුපාතිකව බෙදා අදාළ දිස්ත්‍රික්කයෙන් එක් එක් විභාගයෙන් අදාළ එක් එක් විෂයධාරා යටතේ බඳවා ගත යුතු සංඛ්‍යාව තීරණය කරනු ලැබේ.

3.5 එලෙස එම එක් එක් විභාගයෙන් එක් එක් විෂය ධාරාව යටතේ බඳවා ගත යුතු සංඛ්‍යාව තීරණය කර එම සංඛ්‍යාවෙන් 5% ක් පිරිමි අයදුම්කරුවන්ගෙන් ද, 95% ක් ගැහැණු අයදුම්කරුවන්ගෙන් ද සමන්විත වන ලෙස එම එක් එක් විභාගවලින් එක් එක් විෂය ධාරා යටතේ දිස්ත්‍රික්කයේ ඉහළම Z අගය ලබා ඇති අයදුම්කරුවන් පාඨමාලාව සඳහා තෝරාගනු ලැබේ.

**04.** **යෝග්‍යතාව -:**

**සෑම අයදුම්කරුවෙකු ම -**

4.1. ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතු ය.

4.2. අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් ද යහපත් කායික සහ මානසික සෞඛ්‍යයකින් ද යුක්ත විය යුතු ය.

4.3. තමන් අයදුම්කරන දිස්ත්‍රික්කය පදිංචි දිස්ත්‍රික්කය ලෙස සලකා බැලීම සඳහා අයදුම්කරු එම දිස්ත්‍රික්කය තුළ අයදුම්පත් භාරගන්නා අවසන් දිනය වන **2026.06.30** දිනට පූර්වාසන්න වසර 03 ක් අඛණ්ඩව පදිංචි වී සිටිය යුතු ය. එය සනාථ කිරීම සඳහා ග්‍රාම නිලධාරි සහතිකය ඉදිරිපත් කළ යුතු ය. කෙසේ වෙතත් එලෙස අඛණ්ඩ වසර 03 ක පදිංචි කාලසීමාව සනාථ කළ නොහැකි අයදුම්කරුවන් සඳහා ඔවුන්ගේ පදිංචි දිස්ත්‍රික්කය ලෙස ඔවුන් විසින් අයදුම්කර ඇති දිස්ත්‍රික්කය ලබාදිය නොහැකි අතර, එවැනි අයදුම්කරුවන්ගේ පූර්ව පදිංචි කාලසීමාව පිළිබඳව සලකා බලා ඊළඟ අත්‍යාසන්න වැඩිම කාලසීමාවක් පදිංචිව සිටි දිස්ත්‍රික්කය අයදුම්කරුට හිමි දිස්ත්‍රික්කය ලෙස සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් තීරණය කරනු ලැබේ. මේ සඳහා අවශ්‍ය ලේඛන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෙත **අයදුම්කරු විසින් නොපමාව ඉදිරිපත් කළ යුතු ය.**

*සටහන :-*

යම් අයදුම්කරුවෙකුගේ පියා හෝ මව හෝ රජයේ, පළාත් රාජ්‍ය සේවයේ හෝ රාජ්‍ය සංස්ථාවක මාරු කළ හැකි සේවයක යෙදී සිටීම හේතුවෙන් හෝ වෙනත් නොවැළැක්විය හැකි කරුණක් මත යම් අයදුම්කරුවෙකුට පූර්වාසන්න වසර 03 ක අඛණ්ඩ පදිංචිය සනාථ කළ නොහැකි අවස්ථාවල දී පිළිගත හැකි හේතු ඉදිරිපත් කළහොත් ඒ පිළිබඳව අවසන් තීරණය සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් ගනු ලැබේ.

**05.** **පාඨමාලාව සඳහා අයදුම් කිරීමට හෝ ඇතුළත් වීමට හෝ *නුසුදුස්සන් -:***

5.1 විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ පවත්නා රජයේ විශ්වවිද්‍යාලයක / රජයේ විශ්වවිද්‍යාල විද්‍යායතනයක අ.පො.ස. (උ.පෙළ) සුදුසුකම්වලින් බඳවාගනු ලබන උපාධි පාඨමාලාවක් හැදෑරීම සඳහා **"රජයේ නිදහස් අධ්‍යාපන වරප්‍රසාද"** යටතේ අභ්‍යන්තර ශිෂ්‍යයෙකු ලෙස ලියාපදිංචි වී සිටින /හදාරමින් සිටින අය.

5.2 ජාතික අධ්‍යාපන විද්‍යා පීඨයක අ.පො.ස. (උ.පෙළ) සුදුසුකම්වලින් බඳවාගනු ලබන පාඨමාලාවක් සඳහා ලියාපදිංචි වී සිටින / හදාරමින් සිටින අය.

5.3 සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය යටතේ හෝ වෙනත් රජයේ ආයතනයක හෝ අ.පො.ස. (උ.පෙළ) සුදුසුකම්වලින් බඳවාගනු ලබන පූර්ණකාලීන පාඨමාලාවක ලියාපදිංචි වී සිටින / හදාරමින් සිටින අය.

5.4 ඉහත 5.1, 5.2 හා 5.3 යටතේ සඳහන් ආයතනයක පාඨමාලාවක් සඳහා ලියාපදිංචි වී සිටින සිසුන් මෙම *ගැසට්* නිවේදනය පළවීමෙන් පසුව ලියාපදිංචිය අවලංගු කරගත්ත ද ඔවුන් මේ සඳහා අයදුම් කිරීමට / ඇතුළත් වීමට සුදුසුකම් නොලබති. තවද *ගැසට්* නිවේදනය පළවීමෙන් පසුව ද / සම්මුඛ පරීක්ෂණ පැවැත්වීමෙන් පසුව ද ඉහත ආයතනයක අදාළ පාඨමාලාවක ලියාපදිංචි වී එය අවලංගු කර ගත්ත ද ඔවුහු ද මෙම පාඨමාලාව සඳහා ඇතුළත් වීමට සුදුසුකම් නොලබති.

5.5 විවාහය ලියාපදිංචි කර ඇති හෝ දික්කසාද වූ හෝ අය.

**06.** ***වෙනත් කරුණු -***

6.1 ඔබ යම් විශ්වවිද්‍යාලයක උපාධියක් සම්පූර්ණ කර සිටින අයෙක් නම්, එම උපාධිය බලපැවැත්වෙන දිනය (EFFECTIVE DATE) මෙම පාඨමාලාවට අයදුම්පත් කැඳවීමේ දිනට එනම් **2026.06.30** **දිනට පෙර** දිනයක් විය යුතු ය.

6.2 ඉහත කොන්දේසි සියල්ල සම්පූර්ණ කර තිබුණ ද අනිවාර්යයෙන් ම ඔබව මෙම පාඨමාලාව සඳහා ඇතුළත් කර ගන්නේය යන්න මෙම *ගැසට්* නිවේදනයේ කුමන හෝ වගන්තියක් මඟින් අදහස් **නොකෙරෙන** බව තරයේ සිහි තබා ගත යුතු ය. එමෙන්ම ඉහත කොන්දේසි සම්පූර්ණ කර තිබුණ ද, ඔබ සුදුසුකම් ලැබීමට ප්‍රමාණවත් Z අගයක් ලබා

නොමැති නම් හෝ මෙහි සඳහන් අනෙකුත් කුමන හෝ කොන්දේසියක් සම්පූර්ණ කර නොමැති නම් හෝ ඔබ කිසිදු අයුරකින් මෙම පාඨමාලාව සඳහා සුදුසුකම් නොලබන බව දැනගත යුතු ය.

6.3 ඉහත 5.1, 5.2 හා 5.3 යටතේ සඳහන් ආයතනයක පූර්ණකාලීන පාඨමාලාවක ලියාපදිංචි වී සිටින / හදාරමින් සිටින අයෙකු හෝ 5.4 හා 5.5 ඡේදවල දක්වා ඇති නුසුදුසුකම් පවතින අයෙකු මේ සඳහා අයදුම්කර, පසු අවස්ථාවක දී අනාවරණය වුවහොත් අදාළ පාඨමාලාවෙන් / තනතුරෙන් ඉවත් කර ඒ වනතෙක් ඔවුන් වෙනුවෙන් රජය විසින් දරා ඇති සියලුම වියදම් අයකර ගැනීමට ද ඔවුන්ගේ නම් නැවත රජයේ සේවයට නොගන්නවුන්ගේ අසාධු ලේඛනයට ඇතුළත් කිරීමට ද කටයුතු කරනු ලැබේ.

6.4 සුදුසුකම් තහවුරු කිරීම සඳහා ඉදිරිපත් කරනු ලබන සියලුම අධ්‍යාපන හා අනෙකුත් **සහතිකවල වලංගු දිනය අයදුම්පත් ඉදිරිපත් කිරීමේ අවසන් දිනය වන 2026.06.30** දින හෝ ඊට පෙර දිනයක් විය යුතු ය.

6.5 තවද, මෙම පාඨමාලාව සඳහා *ගැසට්* නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් නොමැතිව අයදුම් කිරීමෙන් පසු, එමගින් අයදුම්කරුට සිදුවන අපහසුතා පිළිබඳව මෙම අමාත්‍යාංශය විසින් කිසිදු වගකීමක් දරනු නොලැබේ.

**07. අයදුම් කළ යුතු ක්‍රමය :**

7.1. මෙම පුහුණු පාඨමාලාව සඳහා අයදුම් කළ යුත්තේ සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ නිල වෙබ් අඩවිය (www.health.gov.lk) මගිනි. ඒ සඳහා මෙම අමාත්‍යාංශයේ වෙබ් අඩවියේ අදාළ කොටසේ ඇති අයදුම්පත සම්පූර්ණ කළ යුතු ය.

7.2. අයදුම්පත සම්පූර්ණ කළ යුත්තේ ඉංග්‍රීසි භාෂාවෙන් පමණි.

7.3. අයදුම්කරුවන් රු. 1000/- ක මුදලක් ලංකා බැංකුව, තැප්‍රොබේන් **ශාඛාවේ අංක 7041318 දරන සෞඛ්‍ය** හා ජනමාධ්‍ය **අමාත්‍යාංශයේ ලේකම්ගේ විභාග ගාස්තු රැස්කිරීමේ ගිණුමට ගෙවිය යුතු ය. සෑම අයදුම්කරුවෙකුම මෙම මුදල අයදුම්පත ඉදිරිපත් කිරීමට පෙර** ඕනෑම ලංකා බැංකු ශාඛාවකින් ගෙවීමට කටයුතු කළ යුතු අතර, **මෙම ගෙවීම මුදල් තැන්පත් කිරීමේ යන්ත්‍රයකින් හෝ අන්තර්ජාල බැංකු සේවාවක් මගින් සිදු නොකළ යුතු ය.** මෙම ගාස්තු කවර හේතුවක් නිසා හෝ ආපසු නොගෙවන අතර, වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමට ද ඉඩ දෙනු නොලැබේ. ඔබ විසින් උක්ත ගෙවීමට අදාළ සාක්ෂි (රිසිට් පත) **සුරක්ෂිතව** තබාගත යුතු අතර, සම්මුඛ පරීක්ෂණයට සහභාගී වුවහොත් **එය අනිවාර්යයෙන් ම** ඉදිරිපත් කළ යුතුය. ඒ අනුව අයදුම්පත ඉදිරිපත් කිරීමෙන් පසු ගෙවීම් සිදුකර ඇති බවට නිරීක්ෂණයවන අයදුම්කරුවන් සහ රිසිට්පතක් ඉදිරිපත් කිරීමට අපොහොසත්වන අයදුම්කරුවන් මේ සඳහා බඳවාගැනීමට නුසුදුස්සන් සේ සලකා කටයුතු කරනු ලැබේ.

7.4. **ඉදිරිපත් කරන ලද විද්‍යුත් අයදුම්පතෙහි පිටපත ඔබගේ විද්‍යුත් ලිපිනයට ලබා ගත යුතුය.**

(අ). මෙම *ගැසට්* නිවේදනයේ සහ ඒ සමගම විද්‍යුත් අයදුම්පත සම්පූර්ණ කිරීම සඳහා වෙබ් අඩවියෙහි පළකර ඇති උපදෙස් පත්‍රිකාවේ සඳහන් සියලු කරුණුවලට අනුව සාර්ථකව අයදුම්පතක් ඉදිරිපත් කරනු ලබන සෑම අයදුම්කරුවෙකුට ම තම අයදුම්පත විධිමත් පරිදි යොමු වූ වහාම එහි පිටපතක් ඔබගේ විද්‍යුත් ලිපිනයට උඩගත වනු ඇත.

(ආ). සෑම අයදුම්කරුවෙකු විසින් ම එලෙස පරිගණක තිරයේ දිස්වන තම අයදුම්පතෙහි මුද්‍රිත පිටපතක් (Print-out) ලබාගත යුතු ය. එය තැපැල් මඟින් එවීමට අවශ්‍ය නොවේ. අයදුම්පතක් ඉදිරිපත් කළ සෑම අයදුම්කරුවෙකුට ම තමා මේ සඳහා අයදුම්පතක් ඉදිරිපත් කළ බව තහවුරු කිරීම සඳහා පවතින විධිමත් සහ එකම සාක්ෂිය මෙම පිටපත බැවින් එය සුරක්ෂිතව තබා ගැනීම ඔබ සතු වගකීමකි.

(ඇ). යම් අවස්ථාවක තම අයදුම්පත ඉදිරිපත් කිරීමෙන් පසු ඔබගේ විද්‍යුත් ලිපිනයට අයදුම්පත උඩගත වී නොමැති නම් අයදුම්පත යොමු කිරීම නිවැරදිව සිදු වී නොමැත, ඔබගේ විද්‍යුත් ලිපිනයට අයදුම්පත නොලැබෙන අයදුම්කරුවන් වේ නම්, ඔවුන්ගේ අයදුම්පත් නිසි පරිදි උඩගත වී / ඉදිරිපත් වී නොමැති බව වටහා ගත යුතු ය. එවැනි සියලු දෙනාම අයදුම්පත් ඉදිරිපත් නොකළ සිසුන් ලෙස සලකනු ලැබේ. ඒ අනුව එවැනි අයදුම්කරුවෙකු කඩිනමින් පහත 7.5. (අ) ඡේදයේ දක්වා ඇති දුරකතනය හෝ / සහ විද්‍යුත් තැපැල හරහා **මානව සම්පත් කළමනාකරණ හා සම්බන්ධීකරණ ඒකකය සමග** සම්බන්ධ වී තම අයදුම්පත පිළිබඳ ගැටළුව **2026.06.30** දිනට පෙර විසඳා ගෙන තමාට අයත් කේතය හා අයදුම්පතෙහි පිටපත ලබාගැනීමට උපදෙස් ලබා ගතයුතු අතර,

මෙම කාර්යය සම්පූර්ණයෙන් ම අයදුම්කරු සතු වගකීමක් බවද අවධාරණය කරමි. කෙසේ වෙතත්, විධිමත් පරිදි මෙම අමාත්‍යාංශය වෙත යොමු වී නොමැති විද්‍යුත් අයදුම්පත් සම්බන්ධයෙන් **2026.06.30** දිනෙන් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් ද කිසිසේත් සලකා බලනු නොලැබේ.

(ඇ). තවද, අයදුම්කරුවෙකු විසින් මෙම බඳවා ගැනීමට අදාළ කිසියම් කරුණක් සම්බන්ධයෙන් කරනු ලබන සෑම ඉල්ලීමක් සමගම තම අයදුම්පතෙහි පිටපතක් එවිය යුතු අතර, එය නොමැතිව ඉදිරිපත් කරනු කිසිඳු ඉල්ලීමක් පිළිබඳව සලකා බලනු නොලබන බවද වැඩිදුරටත් අවධාරණය කරමි.

7.5. **අත්‍යාවශ්‍ය තොරතුරු දැනගැනීම සඳහා විමසීම් :**

(අ). මෙම පාඨමාලාව සඳහා අයදුම්කිරීමට සියලු සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් අයදුම්පත සම්පූර්ණ කිරීමේ දී කිසියම් ගැටළුවක් ඇති වුවහොත් ඒ සම්බන්ධයෙන් තාක්ෂණික සහාය ලබාගැනීම සඳහා හෝ ඉහත 7.4. (ඇ). ඡේදයේ දැක්වෙන ගැටළුවක් නිරාකරණය කර ගැනීම සඳහා පමණක් **සතියේ වැඩකරන දිනවල පෙ.ව. 9.00 සිට ප.ව. 4.00 දක්වා කාලය තුළ** සෞඛ්‍ය අමාත්‍යාංශයේ **මානව සම්පත් කළමනාකරණ හා සම්බන්ධීකරණ ඒකකයේ දුරකතන අංක 0112 340 007 අමතන්න. hrcodmoh@gmail.com විද්‍යුත් තැපැල් ලිපිනයෙන්ද සම්බන්ධ විය හැකිය. (විද්‍යුත් තැපෑල ඔස්සේ සම්බන්ධ වන සෑමවිට ම එහි ඔබගේ ජාතික හැඳුනුම්පත් අංකය සහ දුරකතන අංකයක් සඳහන් කිරීම අනිවාර්ය වේ.)**

(ආ). අදාළ සියලු තොරතුරු මෙම *ගැසට්* නිවේදනයෙ හි සහ සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශ වෙබ් අඩවියෙහි සවිස්තරව දක්වා ඇති බැවින්, වෙනත් කරුණු පිළිබඳව විමසීමෙන් වලකින්න.

**08. අයදුම්කරුවන්ගේ අත්සන සහතික කිරීම :**

8.1. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරියෙකු / ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරියෙකු /ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ නිලධාරියෙකු / රජයේ විදුහල්පතිවරයෙකු / සාමදාන විනිශ්චය කාරවරයෙකු / නීතිඥවරයෙකු හෝ වර්ෂයකට රු. 512,148/- කට නොඅඩු වැටුපක් ලබන ස්ථිර විශ්‍රාම වැටුප් සහිත තනතුරක් දරන රජයේ නිලධාරියෙකු විසින් අයදුම්කරුගේ අත්සන සහතික කළ යුතු ය.

8.2 මෙම *ගැසට්* නිවේදනයේ දැක්වෙන නියමයන්ට අනුකූල නොවන හෝ අසම්පූර්ණ අයදුම්පත් කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**09. සම්මුඛ පරීක්ෂණය සඳහා ඔබව කැඳවනු ලැබුවහොත් ඉදිරිපත් කළ යුතු තොරතුරු :**

9.1. (අ). ඔබ විසින් සාර්ථකව උඩගතකර ඇති විද්‍යුත් අයදුම්පත අනුව අවම අධ්‍යාපන සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන්ගෙන් සකස් කරන ලද ලේඛනයක් පදනම් කරගෙන තෝරාගත් පිරිසක් පමණක් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් පත්කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් මෙම තනතුරට අදාළ බඳවා ගැනීමේ පටිපාටියේ සහ මෙම *ගැසට්* නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් හා කායික යෝග්‍යතාව පරීක්ෂා කරනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයේ දී අයදුම්කරුවන් විසින් පහත සඳහන් ලිපිලේඛනවල **මුල් පිටපත්** ඉදිරිපත් කළ යුතු ය.

9.1 (ආ). නොවැලැක්විය හැකි හේතුවක් මත (සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට පිළිගත හැකි) කිසියම් අයදුම්කරුවෙකුට යම් සහතිකයක් / ලේඛණයක් එදිනට ඉදිරිපත් කිරීමට නොහැකි වුවහොත් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ උපදෙස් පරිදි එකී සහතික / ලේඛණ සම්මුඛ පරීක්ෂණ දිනයේ සිට දින 07ක් ඇතුළත මෙම අමාත්‍යාංශයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන) II වෙත පැමිණ භාරදිය යුතු අතර, එසේ නොකරන සියලු අයදුම්කරුවන් මේ සඳහා තෝරාගැනීමට නුසුදුස්සන් සේ සලකා කටයුතු කරනු ලැබේ.

9.2. විද්‍යුත් මාධ්‍යයෙන් උඩගත කරන ලද (UPLOAD) අයදුම්පතෙහි මුද්‍රිත පිටපත (8.1 ඡේදයේ දක්වා ඇති නිලධාරියෙකු ලවා සහතික කරන ලද)

9.3 උප්පැන්න සහතිකය,

9.4. අ.පො.ස. (උ.පෙළ) විභාග ප්‍රතිඵල හා Z අගය දැක්වෙන සහතිකය (විභාග දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද),

9.5. අ.පො.ස. (සා.පෙළ) විභාග ප්‍රතිඵල ලේඛනය (විභාග දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ),

9.6. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවෙන් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රය හෝ වලංගු දේශීය රියදුරු බලපත්‍රය,

9.7. රු. 1000/- ක මුදල ගෙවූ බවට සනාථ කෙරෙන රිසිට්පත,

9.8. පදිංචිය සනාථ කිරීම සඳහා ග්‍රාම නිලධාරි විසින් නිකුත් කරන ලද පදිංචි සහතිකය. (ඩී එස් - 04),

9.9. ශිෂ්‍ය කාර්ය දර්ශනය (පාසල් හැරයාමේ සහතිකය - අධ්‍යාපන බී 59 පොදු ආකෘති පත්‍රය),

9.10. ඉහත අංක 5.5 අනු ඡේදයෙහි දක්වා ඇති පරිදි විවාහය ලියාපදිංචි කර ඇති හෝ දික්කසාද වූ හෝ අයෙකු නොවන බව සනාථ කිරීම සඳහා සාමදාන විනිශ්චයකරුවෙකු ඉදිරියේ රු. 50/- ක මුද්දරයක් මත අත්සන් කරන ලද දිවුරුම් ප්‍රකාශය,

9.11. ඉහත අංක 5 ඡේදයෙහි 5.1 සිට 5.4 දක්වා වූ අනු ඡේදවලින් විස්තර කර ඇති පරිදි නුසුදුසුකම් නොපවතින අයෙකු බව සනාථ කිරීම සඳහා වන බහුමාන සහතිකය.

*සටහන:-*

(*අ*) ඉහත 9.2. සිට 9.11 දක්වා වන ඡේදවල සඳහන් ලේඛනවල තමා විසින් ම සහතික කරන ලද ඡායා පිටපත්, සම්මුඛ පරීක්ෂණය සඳහා සහභාගී වීමේ දී රැගෙන ආ යුතු ය.

(*ආ*) පුහුණු පාසල්වල පවතින ඉඩ පහසුකම් හා සේවා අවශ්‍යතාව අනුව පුහුණුවට බඳවාගත යුතු සංඛ්‍යාව හා සම්මුඛ පරීක්ෂණයට කැඳවිය යුතු අයදුම්කරුවන් සංඛ්‍යාව සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් තීරණය කරනු ලැබේ.

(*ඇ*) සම්මුඛ පරීක්ෂණයට පැමිණෙන සියලු දෙනාම පුහුණුවට බඳවා ගන්නා බවක් මෙහි අඩංගු කිසිඳු වගන්තියකින් අදහස් නොකෙරේ.

(*ඈ*) සම්මුඛ පරීක්ෂණයෙන් පසු තෝරාගත් අයදුම්කරුවන් පිළිබඳ තොරතුරු http://www.health.gov.lk මෙම අමාත්‍යාංශයීය **වෙබ් අඩවියේ පලකරනු ලබන අතර කිසිවෙකුට පෞද්ගලිකව දැනුම් දෙනු නොලැබේ.** කෙසේ වෙතත්, අවස්ථානුකූලව පැනනගින විශේෂිත තොරතුරු පිළිබඳව දැනුවත් කිරීමට අවශ්‍ය වුවහොත් ඒවා ඔබ විසින් අයදුම්පත සමග ඉදිරිපත් කර ඇති දුරකතන අංක සහ/හෝ විද්‍යුත් තැපැල් ලිපිනය ඔස්සේ සිදුකරනු ලැබේ. එබැවින්, අයදුම්පත සමග ඉදිරිපත් කරන ලද දුරකතන අංක සහ විද්‍යුත් තැපැල් ලිපිනය නොවෙනස්ව, සක්‍රියව තබාගැනීම ඔබගේ වගකීමක් වන අතර, ඒවායේ වෙනස්වීම් මත හෝ අක්‍රියව පැවතීම මත අදාළ තොරතුරු නිසි කලට සංනිවේදනය නොවීම නිසා සිදුවිය හැකි ගැටළු සහගත තත්වයන් සම්බන්ධයෙන් මෙම අමාත්‍යාංශය වගකියනු නොලැබේ.

(*ඉ*) *ගැසට්* නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් අතරින් නියමිත පරිදි පවත්වන ලද සම්මුඛ පරීක්ෂණ සඳහා සහභාගී නොවූවන් විසින් හෝ සම්මුඛ පරීක්ෂණ සඳහා සහභාගී වී නියමිත දිනට ලියාපදිංචි නොවූ අයදුම්කරුවන් විසින් හෝ අධ්‍යයන කටයුතු ආරම්භ කිරීමෙන් පසුව පාඨමාලාවට ඇතුළත් වීම සඳහා ඉදිරිපත් කරනු ලබන අභියාචනා කිසිඳු හේතුවක් මත සලකා බලනු නොලැබේ.

**10. පුහුණු කිරීමේ පරිපාටිය :**

10.1. සම්මුඛ පරීක්ෂණයෙන් අනතුරුව තෝරාගනු ලබන අයදුම්කරුවන් මෙම පුහුණු පාඨමාලාව හැදෑරීම සඳහා පුහුණු පාසල්වලට ඇතුළත් කරනු ලැබේ. පාඨමාලා කාලය සහ හැදෑරිය යුතු මාධ්‍යය අංක 02. වගුවේ දක්වා ඇත.

10.2. පුහුණු පාසල්වලට ඇතුළත් කරන සිසුන් ඒවායෙහි බලපැවැත්වෙන නීතිරීතිවලට හා සෞඛ්‍ය අමාත්‍යාංශය මඟින් කලින් කලට පනවනු ලබන වෙනත් නියෝගවලට ද යටත් වනු ඇත.

10.3. පුහුණුව ලබන කාලපරිච්ඡේදය තුළ නියමිත විභාගවලින් අසමත් වන හෝ වැඩ හා හැසිරීම අසතුටුදායක වන හෝ විභාග, නිවාඩු කොන්දේසි පිළිපැදීමට අපොහොසත්වන හෝ පුහුණුවට බඳවාගැනීම සඳහා ඉදිරිපත් කර තිබෙන අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් අසත්‍ය බවට අනාවරණය වන හෝ සිසුන්ගේ පුහුණුව ඕනෑම අවස්ථාවකදී වන්දි ගෙවීමකින් තොරව අවසන් කළ හැකිය.

10.4. පුහුණුව ලබන කාලපරිච්ඡේදය තුළ දී සිසුන්ට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025VI හි විධිවිධානවලට අනුව මාසික දීමනාවක් ගෙවනු ලැබේ.

10.5. පුහුණු පාසලට ඇතුලත් කරනු ලබන අවස්ථාවේ දී පුහුණුව සාර්ථකව නිම කරන බවටත්, පාඨමාලාව අත්හැර නොයන බවටත්, පුහුණුව සම්පූර්ණයෙන් ම නිම කිරීමෙන් පසු අදාළ තනතුරේ පත්වීම් ලදහොත් අවම වශයෙන් වසර දහයක (10) කාලපරිච්ඡේදයක්

රාජ්‍ය /පළාත් රාජ්‍ය සේවය යටතේ සේවය කරන බවටත්, සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් නම් කරනු ලබන නිලධාරියෙකු සමඟ ගිවිසුමකට එළඹිය යුතු අතර, ඔබගේ පුහුණුව හා අනිවාර්ය සේවා කාලය සම්බන්ධයෙන් වූ සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් ඉදිරිපත් කරනු ලබන ඇපකරයට පිළිගත් ඇපකරුවන් දෙදෙනෙකු සහිතව එළඹිය යුතුය.

ඉහත 10.3 කරුණු ප්‍රකාරව, පුහුණු කාලසීමාව තුළ දී පුහුණුවෙන් ඉවත්වන, පුහුණුව හැරයන, පුහුණුවෙන් ඉවත් කිරීමට සිදුවන හෝ පත්වීම් ලැබ වර්ෂ දහයක (10) කාලපරිච්ඡේදය ඉහත පරිදි අදාළ තනතුරේ සේවය කිරීමට අපොහොසත්වන සිසුන් පුහුණුවෙන් / තනතුරෙන් ඉවත්කරන අතර අදාළ කාලය තුළ දී ඔවුන් වෙත රජය විසින් ගෙවන ලද දීමනා, දරන ලද විය හියදම් හා ගිවිසුම්ගත මුදල සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයට ගෙවිය යුතු ය. එසේ නොමැති වුවහොත්, එම මුදල් අයකරගැනීමට ගිවිසුම් ප්‍රකාරව හා නීත්‍යානුකූලව කටයුතු කිරීමට පියවර ගනු ඇත.

10.6 මෙම පාඨමාලාව සඳහා අයදුම්කරන අයදුම්කරුවන් අයදුම්පත් කැඳවීමේ ආරම්භක දිනය වනවිට අවිවාහක/ දික්කසාද නොවූ අයෙකු වියයුතු අතර, පුහුණුව ලබන කාල සීමාව තුළ දී ද අවිවාහකව සිටීම **අනිවාර්යය** වේ.

## 11. සේවයේ නියුක්ත කරවීමේ නියමයන්:

11.1. පුහුණුව අවසානයේ ස්ථිර පත්වීම් ප්‍රදානය කිරීමට රජය බැඳී නොසිටී. එහෙත්, පුහුණුව අවසන් කරන දිනය වනවිට පවත්නා පුරප්පාඩු මත සකස් කරන ප්‍රමුඛතා පුරප්පාඩු ලේඛනය අනුව ජ්‍යෙෂ්ඨ නිලධාරීන් වෙත ස්ථාන මාරු ලබා දීමෙන් අනතුරුව ඉතිරිවන පුරප්පාඩු සඳහා පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කරන සිසුන්ගේ අවසන් පරීක්ෂණ කුසලතාවය සැලකිල්ලටගෙන අදාළ තනතුරේ III ශ්‍රේණියේ තනතුරකට පත් කිරීම සඳහා සලකා බලනු ලැබේ. එලෙස තෝරා ගනු ලබන සිසුන් පවතින පුරප්පාඩු අනුව ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා බැඳී සිටිය යුතු ය.

11.2. එකී පත්වීම්ලාභීන් වෙත රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025 VI හි විධිවිධාන පරිදි වැටුප් ගෙවනු ලැබේ.

11.3. අයදුම්පත සම්පූර්ණ කිරීමේ දී අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් නිවැරදිව ඇතුළත් කළ යුතු ය. පුහුණුව සඳහා බඳවා ගැනීමෙන් හෝ පත්වීම් ලැබීමෙන් පසුව හෝ ඉහත කී සහතික ව්‍යාජ බවට ඔප්පු වුවහොත් නීත්‍යානුකූලව කටයුතු කිරීම සඳහා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීමටත්, දෙනු ලබන පත්වීම අවලංගු කර පුහුණුවෙන්/ තනතුරෙන් පහ කරන අතර, ඒ සම්බන්ධයෙන් විනයානුකූලව කටයුතු කර නැවත රජයේ සේවයට නොගන්නවුන්ගේ අසාධු ලේඛනයට ඔවුන්ගේ නම් ඇතුලත් කිරීමටත් කටයුතු කරනු ලැබේ. තවද, පුහුණු කාලය තුළ දී රජය විසින් ගෙවන ලද දීමනා, දරන ලද වියහියදම් හා ගිවිසුම්ගත අදාළ මුදල අය කර ගැනීමට ද කටයුතු කරනු ලැබේ.

11.4. තෝරාගත් අයදුම්කරුවන් පාඨමාලාව හැදෑරීමට හා දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට කායික හා මානසික යෝග්‍යතාවයකින් හෙබි බව සනාථ කරනු පිණිස පුහුණුවේ පළමු මාසය ඇතුළත වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටිය යුතු අතර, වෛද්‍ය පරීක්ෂණයේ දී අයෝග්‍ය බව පෙනී යන අයදුම්කරුවන් පාඨමාලාවේ රැඳී සිටීමට නුසුදුස්සන් වනු ඇත.

11.5. ඉහත පරිදි බඳවා ගන්නා ලද සියලුම දෙනා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ විධිවිධානයන්ට, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් රජයේ සේවය සම්බන්ධව පනවන ලද රීති, රෙගුලාසි හා නියෝගවලට, සේවා ව්‍යවස්ථාවල විධිවිධානයන්ට, රජයේ මුදල් රෙගුලාසිවලට, රජයේ චක්‍රලේඛ හා උපදෙස්වලට හා ඒවාට අදාළව වරින්වර පනවනු ලබන නියමවලට හා සංශෝධනවලට ද යටත් වනු ඇත.

11.6. පාඨමාලාවට බඳවාගනු ලබන සිසුන් සඳහා පුහුණු පාසල්වල නේවාසික පහසුකම් සැපයීමට මෙම අමාත්‍යාංශය බැඳී නොසිටී. එසේ ලබාදෙන්නේ නම්, ඒ සඳහා අදාළ තක්සේරු නිවාස කාමර කුලිය, ජල හා විදුලි බිල්පත් ගාස්තු අය කරනු ලැබේ.

11.7 පුහුණු කාලසීමාව තුළ දී සිසුන්ට වෘත්තීය සමිති කටයුතුවල නිරතවීමට හෝ පෞද්ගලික සේවයේ යෙදීමට හෝ කිසිඳු අයිතිවාසිකමක් නොමැත.

11.8. පාඨමාලාවට බඳවාගැනීම සම්බන්ධයෙන් මෙම *ගැසට්* නිවේදනය මගින් ආවරණයවන හෝ නොවන යම් කරුණක් සම්බන්ධයෙන් ගැටලු සහගත තත්ත්වයක් උදා වුවහොත්, ඒ පිළිබඳ සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ලේකම්ගේ තීරණය අවසාන තීරණය වනු ඇත.

මෙම *ගැසට්* නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් පරස්පරතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු වන්නේය.

**වෛද්‍ය අනිල් ජාසිංහ,**
ලේකම්,
සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය.

2026 මැයි මස 26 දින,
“ සුවසිරිපාය “,
අංක 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ - 10.

05 - 445

**කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය.**

සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව.

**ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ නිලධාරීන් සඳහා**
**පළමුවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2026 (II).**

ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ නිලධාරීන් සඳහා පළමුවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය **2026 ජූලි මස** මහනුවර දී පැවැත්වීමට අපේක්ෂා කරන බව මෙයින් දැනුම් දෙනු ලැබේ. මේ සඳහා ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ සිටින තුන්වන ශ්‍රේණියේ නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. **විෂයය නිර්දේශය** : I කාර්යක්ෂමතා කඩඉම සඳහා අදාළ විෂය නිර්දේශය හා අනෙකුත් විධිවිධාන 2013.12.13 දිනැති අංක 1840/51 දරන *අති විශෙෂ ගැසට්* පත්‍රයේ පළකරන ලද ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ නව සේවා ව්‍යවස්ථාවේ සඳහන් කර ඇත.
කාර්යක්ෂමතා කඩඉම් විභාගවල විෂයයන් සඳහා පෙනී සිටීමේ දී එක් වරක දී හෝ වාර කිහිපයක දී හෝ පෙනී සිටිය හැක.

03. මෙම සේවාවේ නිලධාරීන් I කාර්යක්ෂමතා කඩඉම සඳහා පෙනී සිටිය යුතු විෂයයන් මෙසේය.

| *ප්‍රශ්න පත්‍රය* | | *කාලය* | *මුළු ලකුණු* | *සමත් ලකුණු* |
|---|---|---|---|---|
| *විෂයය අංකය* | *විෂයය* | | | |
| 01 | මූල්‍ය ක්‍රම | පැය 02 | 100 | 40 |
| 02 | පරිපාලනය | පැය 02 | 100 | 40 |
| 03 | දෙපාර්තමේන්තු රෙගුලාසි - 1 | පැය 02 | 100 | 40 |
| 04 | දෙපාර්තමේන්තු රෙගුලාසි - 2 | පැය 03 | 100 | 40 |

04. විභාගය සඳහා විෂයය නිර්දේශය:

| *ප්‍රශ්න පත්‍රයේ නම* | | *විෂයය නිර්දේශය* |
|---|---|---|
| *විෂයය අංකය* | *විෂයය* | |
| 01 | මූල්‍ය ක්‍රම | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය (x පරිච්ඡේදය හැර) |
| 02 | පරිපාලනය | (අ) කාර්යාල ක්‍රම, කාර්යාල කළමනාකරණය හා කාර්යාල සංවිධානය කිරීම පිළිබඳ දැනුම<br><br>(ආ) රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීතින්හි I – XXII දක්වා වූ පරිච්ඡේද සහ ආයතන සංග්‍රහයේ VI, VII, VIII, IX, XII, XIII, XIV, XV, XVI, XVII, XVIII, XIX, XXIII, XXV, XXVI,XXVII, XXVIII, XXX, XXXI, XXXII, XXXIII, XLVII, XLVIII පරිච්ඡේද |
| 03 | දෙපාර්තමේන්තු රෙගුලාසි - 1 | සත්ත්ව පනත, සත්ත්ව රෝග පනත හා ආනුෂංගික රීති, දෙපාර්තමේන්තුවේ නියෝග සහ පශු වෛද්‍ය ක්ෂේත්‍රයට අදාළ චක්‍රලේඛ |

| ප්‍රශ්න පත්‍රයේ නම | | විෂයය නිර්දේශය |
|---|---|---|
| විෂයය අංකය | විෂයය | |
| 04 | දෙපාර්තමේන්තු රෙගුලාසි - 2 | (අ) නිදර්ශක බෙදා හැරීම, පශ්චාත් මරණ පරීක්ෂණ ඇතුළු රසායනාගාර හඳුනාගැනීම්, ගැබ් පරීක්ෂාව ඇතුළු හඳුනාගැනීම් පරීක්ෂණ, බෝවන රෝග හා ස්පර්ශයෙන් බෝවන රෝග සඳහා එන්නත් හා මස්තු පරීක්ෂාව.<br>(ආ) කෘත්‍රිම සිංචන ක්‍රමවේදය හා එහි භාවිතය, වසුපැටවුන් බෝ කිරීම හා ඇතිදැඩි කිරීමේ මූලධර්ම, බිජෞෂණය මගින් පැටවුන් ලබා ගැනීම හා ඇතිදැඩි කිරීම, සත්ත්ව පෝෂණය, පශු සම්පත් සඳහා ආහාර වේල හා එහි භාවිතය, පෝෂ්‍ය තෘණ වගාව, වියළි තෘණ සහ සයිලේජ් සැකසීම හා පශු සම්පත් කළමනාකරණය.<br>(ඇ) කිරි නිෂ්පාදනය, පැස්චරීකරණය කරන ලද කිරි බෝතල් කිරීම හා ප්‍රවාහනය, කිරිවල සෞඛ්‍ය ආරක්ෂිත බව, කිරිවල බැක්ටීරියා, මේදය කිරි විශ්ලේෂණය ඇතුළුව පරීක්ෂා කිරීම, යොදය වෙන්කිරීම, බටර්, ගිතෙල් හා මීකිරි නිෂ්පාදනය.<br>(ඈ) ඝාතනාගාරවල දී සතුන් ඝාතනය කිරීම, මාංශ හඳුනාගැනීම් ඇතුළුව මාංශ පරීක්ෂා කිරීම. |

05. මෙම විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යවලින් මහනුවර දී පිහිටුවනු ලබන විභාග මධ්‍යස්ථානවල පමණක් පැවැත්වේ. අයදුම් කරන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.

06. අයදුම් පත්‍ර අමුණා ඇති ආකෘතියට අනුව A4 ප්‍රමාණයේ කඩදාසියක දෙපසම භාවිත කරමින් සකස් කොට ඉදිරිපත් කළ යුතු ය. ශීර්ෂ අංක 01 සිට 06 තෙක් පළමුවන පිටුවට ද ඉතිරිය දෙවන පිටුවටද වන ලෙස සකස් කළ යුතු වේ. අයදුම්පත්‍රය සම්පූර්ණ කිරීම තම අත් අකුරින්ම පැහැදිලිව කළ යුතු වේ. එම අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. තව ද සම්පූර්ණ කරනු ලබන අයදුම්පත්‍රය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පතට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු විසින්ම පරීක්ෂා කොට තහවුරු කර ගත යුතු ය. ආදර්ශ අයදුම්පතට අනුකූල නොවන හෝ අසම්පූර්ණ හෝ අයදුම්පත් කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත්‍රය පිළියෙල කර ගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්‍රවල සිංහල භාෂාවට අමතරව ඉංග්‍රීසි භාෂාවෙන් ද දෙමළ අයදුම්පත්‍රවල දෙමළ භාෂාවට අමතරව ඉංග්‍රීසි භාෂාවෙන් ද සටහන් කළ යුතු ය.

07. අංක 2422/49 හා 2025.02.07 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ *ගැසට්* පත්‍රයෙන් ප්‍රකාශිත ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ සංශෝධන අංක 04 ප්‍රකාරව විභාගය පවත්වනු ලබන බලධාරියා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරයා වන බැවින්, විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පනවනු ලබන නීති රීතිවලට විභාග අපේක්ෂකයින් යටත්වන අතර, විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන ජාතික මට්ටමේ විභාග සඳහා අදාළ වන සියලුම නීති රීති මෙම විභාගය සඳහා ද අදාළ වේ. එම නීති රීති උල්ලංඝනය කළහොත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පනවනු ලබන ඕනෑම දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

08. ඉල්ලුම් පත්‍ර **2026.06.30** දිනට හෝ ඊට ප්‍රථම අධ්‍යක්ෂ ජනරාල්, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව වෙත ලැබෙන පරිදි දෙපාර්තමේන්තු ප්‍රධානින්ගේ මාර්ගයෙන් ලියාපදිංචි තැපෑලෙන් පහත සඳහන් ලිපිනයට එවිය යුතු ය. මෙදිනට පසුව ලැබෙන ඉල්ලුම් පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අධ්‍යක්ෂ ජනරාල්,
සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව,
තැ.පෙ. 13,
ගැටඹේ, පේරාදෙණිය.

09. විභාග ගාස්තු ගෙවීම අදාළ වේ නම් විභාග අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පෙර එම මුදල ගෙවා ඊට අදාළ ලදුපත ද සමඟ විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍ය සඳහන් කොට අයදුම්කරුගේ අත්සන හා දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය ද සහිතව නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමු කළ යුතු ය. *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත, අයදුම්පත් යොමු කර ඇති අයදුම්කරුවන් වෙත සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරයා සින් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත.

10. අයදුම්කරුවන් වෙත විභාග ප්‍රවේශපත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් නිවේදනයක් දෙපාර්තමේන්තු නිල වෙබ් අඩවියේ ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව මගින් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින තුනක් ගත වූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණු අපේක්ෂකයෙක් වේ නම් දැන්වීමේ සඳහන් ආකාරයට අයදුම්කරුගේ නම, ලිපිනය, ජාතික හැඳුනුම්පත් අංකය හා ෆැක්ස් අංකය හෝ ඊ මේල් ලිපිනය සඳහන් කර ඒ පිළිබඳව සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව වෙත වහාම දන්වා සිටිය යුතු ය. අවශ්‍ය වුවහොත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් ඉල්ලා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා ඔබ ළඟ තබාගත් සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රයේ ඡායා පිටපත හා විභාග ගාස්තු ගෙවීම අදාළ නම් එම ලදුපතෙහි ඡායා පිටපත සහ ඉල්ලුම්පත්‍රය තැපැල් කිරීමේ දී ලියාපදිංචි කරන ලද කුවිතාන්සිය ද සූදානමින් තබා ගැනීම වඩාත් ඵලදායි වනු ඇත.

11. ඉහත 10 ඡේදයේ සඳහන් කර ඇති අවශ්‍යතාවන් සපුරාලීමට අපොහොසත්වන අපේක්ෂකයන් විසින් පසුව ඉදිරිපත් කෙරෙන කිසිදු ලියවිල්ලක් සලකා බලනු නොලැබේ.

12. විභාග අපේක්ෂක /අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළ දී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහාම විභාග ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතු ය. ඒ සඳහා පහත දැක්වෙන කවර ලියවිල්ලක් හෝ භාර ගනු ලැබේ.

I. ජාතික හැඳුනුම්පත,
II. වලංගු විදේශ ගමන් බලපත්‍රය,
III. වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය.

එමෙන්ම විභාග අපේක්ෂකයින් අනන්‍යතාව තහවුරු කර ගත හැකි වන පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතුය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් විභාග බලධාරීන්ට අයදුම්කරු හඳුනා ගත හැකි පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතු ය.

13. මෙම විභාගයට අයදුම්කරන අපේක්ෂකයින්ගෙන් පහත සඳහන් පදනම මත විභාග ගාස්තු අය කිරීමට තීරණය කර ඇත.

(අ) පළමු වතාවට සම්පූර්ණ විභාගය හෝ කොටසක් සඳහා ගාස්තු අය නොකෙරේ.
(ආ) ඉන්පසු එක් එක් වතාව සඳහා

| | රු. ශත |
|---|---|
| සම්පූර්ණ විභාගය සඳහා | 1200.00 |
| එක් විෂයයකට | 300.00 |

මෙම විභාගයට මීට පෙර අයදුම් කරන ලද හෝ දැනටමත් පෙනී සිට ඇති හෝ අපේක්ෂකයන්ට ඉහත දැක්වෙන පරිදි අදාළ ගාස්තු ගෙවීමට නියම වේ. එම විභාග ගාස්තුව සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරයා නමින් 2003-99-00 යන දෙපාර්තමේන්තු ශීර්ෂයට බැරවන සේ දෙපාර්තමේන්තුවේ සරප් අංශය වෙත ගෙවා ලබා ගන්නා ලදුපත හෝ සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල්වරයා නමින් පේරාදෙණිය මහජන බැංකුවේ පවත්වාගෙන යනු ලබන අංක 057100179027275 දරන ගිණුමට දිවයිනේ ඕනෑම මහජන බැංකුවකින් මුදල් බැර කිරීමෙන් ලබා ගන්නා ලදුපත අයදුම් පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ එක් දාරයකින් ඇලවිය යුතුය. තවද එහි ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ද ප්‍රයෝජනවත් විය හැක. කිසිදු හේතුවක් නිසා මෙම ගාස්තුව ආපසු ගෙවනු නොලැබේ.

14. අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය.

15. මෙහි සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා මාධ්‍යවලින් පළවන නිවේදනයන්හි භාෂා පාඨ අතර කිසියම් නොගැළපීමක් හෝ අනනුකූලතාවක් හෝ ඇත්නම් එහිදී සිංහල නිවේදනය බලාත්මක වේ.

වෛද්‍ය **බී.එස්.එස්. පෙරේරා,**
අධ්‍යක්ෂ ජනරාල් (*වැ.බ.*).

2026 මැයි මස 19 දින,
සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව.

*ආදර්ශ අයදුම්පත*

කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය
සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව.

*ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ නිලධාරීන් සඳහා වන*
*පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2026 (II)*

**The First Efficiency Bar Examination for Officers in**
**Sri lanka Animal Production and Health Service –2026 (ii)**

(විභාගයේ නම ලිපි කවරයේ වම් පස ඉහළ කෙළවරේ සඳහන් කළ යුතු ය)
නිලධාරියා විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය : සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4 (අදාළ අංකය කොටුව තුළ ලියන්න)

01. (i) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) : . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .
(උදා: HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA)

(ii) අගට යෙදෙන නම මුලින් ද අනෙකුත් නම්වල මුලකුරු පසුව ද යොදා නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) : . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .
(උදා: GUNAWARDHANA H.M.S.K.)

(iii) සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) : . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

02. (i) ලිපිනය (ප්‍රවේශ පත්‍ර එවීම සඳහා) : . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
(ii) කාර්යාලීය ලිපිනය : . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

03. ස්ත්‍රී/පුරුෂ භාවය :
ස්ත්‍රී - 1
පුරුෂ - 0
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

04. ජාතික හැඳුනුම්පත් අංකය:

05. ජංගම දුරකථන අංකය:

06. නිවේදනයේ 04 ඡේදයේ දක්වා ඇති, විෂය අංක සහිතව පෙනී සිටීමට අපේක්ෂිත විෂයන් (පැහැදිලිව සඳහන් කළ යුතු ය.)

| *විෂයය* | *විෂය අංකය* |
|---|---|
| | |
| | |
| | |
| | |

07. මීට ප්‍රථම මෙම විභාගයට මුළුමනින්ම හෝ කොටසක් වශයෙන් හෝ පෙනී සිට ඇත්දැයි සඳහන් කරන්න. එසේ නම් විෂයයන් ද වර්ෂය හා මාසය ද සඳහන් කරන්න.

.................................................................................................................................................

08. උපන්දිනය:

| | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| **වර්ෂය :** | | | | | **මාසය :** | | | **දිනය :** | | |

09. පදවි නාමය : . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

දෙපාර්තමේන්තුවේ නම : . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

10. ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවාවට පත් කරන ලද දිනය : . . . . . . . . . . . . . . . . . . . .

ඉහත දැක්වෙන විස්තර නිවැරදි බවත්, ඉල්ලුම්පත්‍රයේ ඉහළින් දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් මෙම විභාගයට පෙනී සිටීමට හිමිකම් ඇති බවත් ප්‍රකාශ කරමි.

තවද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පනවනු ලබන නීතිරීතිවලට හා විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් පවත්වනු ලබන ජාතික මට්ටමේ විභාග සඳහා අදාළවන සියළුම නීති රීතිවලට මම යටත් වන බවද ප්‍රකාශ කරමි.

ගෙවන ලද විභාග ගාස්තුව : රු......................................

ගෙවන ලද කාර්යාලය : ........................................ ලදුපත් අංකය : ........................................

ලදුපත ඇලවීම සඳහා
(ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගන්න)

දිනය : .................................... අපේක්ෂකයාගේ අත්සන : .................................

............................................. මගින්,
අධ්‍යක්ෂ ජනරාල්, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව.

මෙම අයදුම්පත්‍රය ඉදිරිපත් කරන . . . . . . . . . . . . . . . . . . . . . . . . . . මයා/මිය/මෙය මෙම අමාත්‍යාංශයේ /දෙපාර්තමේන්තුවේ/ ආයතනයේ . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .ලෙස සේවය කරන අතර, ඔහුගේ/ඇයගේ අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි. මෙම විස්තර දැක්වෙන අපේක්ෂකයාට/අපේක්ෂිකාවට මෙම විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ඇති බවත්, ඔහු/ඇය විසින් දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් මෙම විභාගයට පෙනී සිටීමට ඔහුට/ඇයට සුදුසුකම් ඇති බවත් මම සහතික කරමි.

******අපේක්ෂකයා/අපේක්ෂිකාව නියමිත විභාග ගාස්තුව ගෙවා ලබාගත් ලදුපත අලවා ඇති බව ද සහතික කරමි.

අපේක්ෂකයාගේ අත්සන සහතික කරමි.

.......................................
*ආයතන ප්‍රධානියාගේ අත්සන
හා පදවි නාමය,
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න.)

දිනය ........................................

(** ගාස්තුව නොගෙවන විට දී කපා දැමිය යුතු ය)

**(* අත්සන සහතික කිරීම - අයදුම්කරු අනුයුක්ත අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ /පළාත් සභාවේ / නගර සභාවේ / අංශයේ ප්‍රධානියා විසින් කළ යුතු ය.)**

05 - 440

**කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය.**

සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව.

**ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ නිලධාරීන් සඳහා වන**
**දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2026 (II).**

ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය **2026 ජූලි මස මහනුවර දී** පැවැත්වීමට අපේක්ෂා කරන බව මෙයින් දැනුම් දෙනු ලැබේ. මේ සඳහා ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ II ශ්‍රේණියට උසස්වීම් ලද නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. විෂය නිර්දේශය: II කාර්යක්ෂමතා කඩඉම සඳහා අදාළ විෂය නිර්දේශ හා අනෙකුත් විධිවිධාන 2013.12.13 දිනැති අංක 1840/51 දරන *අති විශේෂ ගැසට්* පත්‍රයේ පළ කරන ලද ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ නව සේවා ව්‍යවස්ථාවේ සඳහන් කර ඇත.

කාර්යක්ෂමතා කඩඉම් විභාගවල විෂයන් සඳහා පෙනී සිටීමේ දී එක් වරක දී හෝ වාර කිහිපයක දී හෝ පෙනී සිටිය හැක.

03. මෙම සේවාවේ නිලධාරීන් II කාර්යක්ෂමතා කඩඉම් සඳහා පෙනී සිටිය යුතු විෂයන් මෙසේ ය.

| *ප්‍රශ්න පත්‍රය* | *විෂය අංකය* | *විෂය / විෂය නිර්දේශයේ කොටස් (සේවා ව්‍යවස්ථාවේ 4 පරිශිෂ්ටයේ අංක 5 හි දක්වා ඇති පරිදි )* | *කාලය* | *මුළු ලකුණු* | *සමත් ලකුණු* |
|---|---|---|---|---|---|
| 1 කොටස | 01 | විෂය නිර්දේශයේ 2:1, 2:2, 4:1, 4:2, 5:2, 5:8, 6:5, 7:2:1, 8:2, 8:2:2, 8:2:3, 8:3:1, 9:2, 9:4, 9:6, 9:7 කොටස් | පැය 03 | 100 | 40 |
| | | *හෝ* | | | |
| 2 කොටස | 02 | විෂය නිර්දේශයේ 1:1:1, 1:1:4, 1:2:1, 3:2, 3:1:1, 3:1:2, 3:2:1, 10:1:1, 10:1:2, 10:1:3, 10:1:4, 10:1:6, 10:2:1, 10:2:8 හා 10:4:1 කොටස් | පැය 03 | 100 | 40 |
| | | *සහ* | | | |
| **3 කොටස** | | **3 කොටසින් පත්‍ර දෙකකට පිළිතුරු සැපයිය යුතු වේ** | | | |
| 1 පත්‍රය | 03 - 1 | ව්‍යාධි විද්‍යාව | පැය 03 | 100 | 40 |
| 2 පත්‍රය | 03 - 2 | පශු සම්පත් ආර්ථික විද්‍යාව | පැය 03 | 100 | 40 |
| 3 පත්‍රය | 03 - 3 | පශු මහජන සෞඛ්‍ය | පැය 03 | 100 | 40 |
| 4 පත්‍රය | 03 - 4 | කෘෂි ව්‍යාප්තිය | පැය 03 | 100 | 40 |
| 5 පත්‍රය | 03 - 5 | ජාන විද්‍යාව හා අභිජනනය | පැය 03 | 100 | 40 |
| 6 පත්‍රය | 03 - 6 | සත්ත්ව කායික විද්‍යාව හා ප්‍රජනනය | පැය 03 | 100 | 40 |

| ප්‍රශ්න පත්‍රය | විෂය අංකය | විෂය / විෂය නිර්දේශයේ කොටස් (සේවා ව්‍යවස්ථාවේ 4 පරිශිෂ්ටයේ අංක 5 හි දක්වා ඇති පරිදි ) | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|---|---|
| 7 පත්‍රය | 03 - 7 | සත්ත්ව නිවාසකරණය හා කළමනාකරණය | පැය 03 | 100 | 40 |
| 8 පත්‍රය | 03 - 8 | සත්ත්ව පෝෂණය | පැය 03 | 100 | 40 |
| 9 පත්‍රය | 03 - 9 | තෘණ හා ගෝචර තෘණ | පැය 03 | 100 | 40 |
| 10 පත්‍රය | 03 -10 | ව්‍යවහාරික පශු ක්ෂුද්‍රජීවී විද්‍යාව හා ප්‍රතිශක්තිකරණ විද්‍යාව | පැය 03 | 100 | 40 |
| 11 පත්‍රය | 03 -11 | ව්‍යවහාරික , වෛද්‍ය විද්‍යාව, ව්‍යාධිවේදය හා පරපෝෂිතවේදය | පැය 03 | 100 | 40 |

04. විභාගය සඳහා විෂයය නිර්දේශය :

2013.12.13 දිනැති අංක 1840/51 දරන *අති විශෙෂ ගැසට්* පත්‍රයේ පළකරන ලද ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ නව සේවා ව්‍යවස්ථාවේ හතරවන පරිශිෂ්ඨයෙහි අංක 05 යටතේ වන විෂයය නිර්දේශය මේ සඳහා අදාළ වේ.

05. මෙම විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් මහනුවර දී පිහිටුවනු ලබන විභාග මධ්‍යස්ථානවලදී පමණක් පවත්වනු ලැබේ. අයදුම් කරන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

06. අයදුම් පත්‍ර අමුණා ඇති ආකෘතියට අනුව A4 ප්‍රමාණයේ කඩදාසියක දෙපසම භාවිතා කරමින් සකස් කොට ඉදිරිපත් කළ යුතු ය. ශීර්ෂ අංක 01 සිට 06 තෙක් පළමුවන පිටුවටද ඉතිරිය දෙවන පිටුවටද වන ලෙස සකස් කළ යුතු වේ. අයදුම්පත්‍රය සම්පූර්ණ කිරීම තම අත් අකුරින්ම පැහැදිලිව කළ යුතු වේ. එම අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. තව ද සම්පූර්ණ කරනු ලබන අයදුම්පත්‍රය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පතට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු විසින්ම පරීක්ෂා කොට තහවුරු කර ගත යුතු ය. ආදර්ශ අයදුම්පතට අනුකූල නොවන හෝ අසම්පූර්ණ හෝ අයදුම්පත් කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත්‍රය පිළියෙල කර ගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්‍ර වල සිංහල භාෂාවට අමතරව ඉංග්‍රීසි භාෂාවෙන් ද දෙමළ අයදුම්පත්‍රවල දෙමළ භාෂාවට අමතරව ඉංග්‍රීසි භාෂාවෙන් ද සටහන් කළ යුතු ය.

07. අංක 2422/49 හා 2025.02.07 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට්* පත්‍රයෙන් ප්‍රකාශිත ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ සංශෝධන අංක 04 ප්‍රකාරව විභාගය පවත්වනු ලබන බලධාරියා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරයා වන බැවින්, විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරුන් විසින් පනවනු ලබන නීති රීති වලට විභාග අපේක්ෂකයින් යටත් වන අතර, විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් පවත්වනු ලබන ජාතික මට්ටමේ විභාග සඳහා අදාළ වන සියලුම නීති රීති මෙම විභාගය සඳහා ද අදාළ වේ. එම නීති රීති උල්ලංඝනය කළහොත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පනවනු ලබන ඕනෑම දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

08. අයදුම් පත්‍ර **2026.06.30** දිනට හෝ ඊට ප්‍රථම අධ්‍යක්ෂ ජනරාල්, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව වෙත ලැබෙන පරිදි දෙපාර්තමේන්තු ප්‍රධානින්ගේ මාර්ගයෙන් ලියාපදිංචි තැපෑලෙන් පහත සඳහන් ලිපිනයට එවිය යුතුය. එදිනට පසුව ලැබෙන ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අධ්‍යක්ෂ ජනරාල්,
සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව,
තැ.පෙ. 13,
ගැටඹේ,
පේරාදෙණිය.

09. විභාග ගාස්තු ගෙවීම අදාළ වේ නම් විභාග අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පෙර එම මුදල ගෙවා ඊට අදාළ ලදුපත ද සමග විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍ය සඳහන් කොට අයදුම්කරුගේ අත්සන හා

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය ද සහිතව නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමු කළ යුතු ය. *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත, අයදුම්පත් යොමු කර ඇති අයදුම්කරුවන් වෙත සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත.

10. අයදුම්කරුවන් වෙත විභාග ප්‍රවේශපත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් නිවේදනයක් දෙපාර්තමේන්තු නිල වෙබ් අඩවියේ ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව මඟින් පළකරනු ඇත. නිවේදනය පළ වී දින තුනක් ගත වූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණු අපේක්ෂකයෙක් වේ නම් දැන්වීමේ සඳහන් ආකාරයට අයදුම්කරුගේ නම, ලිපිනය, ජාතික හැඳුනුම්පත් අංකය හා ෆැක්ස් අංකය හෝ ඊ මේල් ලිපිනය සඳහන් කර ඒ පිළිබඳව සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව වෙත වහාම දන්වා සිටිය යුතු ය. අවශ්‍ය වුවහොත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් ඉල්ලා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා ඔබ ළඟ තබාගත් සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රයේ ඡායා පිටපත හා විභාග ගාස්තු ගෙවීම අදාළ නම් එම ලදුපතෙහි ඡායා පිටපත සහ ඉල්ලුම්පත්‍රය තැපැල් කිරීමේ දී ලියාපදිංචි කරන ලද කුවිතාන්සිය ද සූදානමින් තබා ගැනීම වඩාත් ඵලදායි වනු ඇත.

11. ඉහත 10 ඡේදයේ සඳහන් කර ඇති අවශ්‍යතාවන් සපුරාලීමට අපොහොසත්වන අපේක්ෂකයින් විසින් පසුව ඉදිරිපත් කෙරෙන කිසිදු ලියවිල්ලක් සලකා බලනු නොලැබේ.

12. විභාග අපේක්ෂක /අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළ දී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහාම විභාග ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාවය සනාථ කළ යුතු ය. ඒ සඳහා පහත දැක්වෙන කවර ලියවිල්ලක් හෝ භාර ගනු ලැබේ :

I. ජාතික හැඳුනුම්පත,
II. වලංගු විදේශ ගමන් බලපත්‍රය,
III. වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය.

එමෙන්ම විභාග අපේක්ෂකයින් අනන්‍යතාව තහවුරු කර ගත හැකි වන පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතු ය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් විභාග බලධාරීන්ට අයදුම්කරු හඳුනා ගත හැකි පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතු ය.

13. මෙම විභාගයට අයදුම්කරන අපේක්ෂකයින්ගෙන් පහත සඳහන් පදනම මත විභාග ගාස්තු අය කිරීමට තීරණයකර ඇත.

(*අ*) ප්‍රථම වතාවට සම්පූර්ණ විභාගය හෝ කොටසක් සඳහා ගාස්තු අය නොකෙරේ.
(*ආ*) ඉන්පසු එක් එක් වතාව සඳහා

| | *රු.* | *ශත* |
|---|---|---|
| සම්පූර්ණ විභාගය සඳහා | 1200 | . 00 |
| එක් විෂයයකට | 400 | .00 |

මෙම විභාගයට මීට පෙර අයදුම් කරන ලද හෝ දැනටමත් පෙනී සිට ඇති හෝ අපේක්ෂකයින්ට ඉහත දැක්වෙන පරිදි අදාළ ගාස්තු ගෙවීමට නියම වේ. එම විභාග ගාස්තුව සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරයා නමින් 2003-99-00 යන දෙපාර්තමේන්තු ශීර්ෂයට බැරවන සේ දෙපාර්තමේන්තුවේ සරප් අංශය වෙත ගෙවා ලබා ගන්නා ලදුපත හෝ සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල්වරයා නමින් පේරාදෙණිය මහජන බැංකුවේ පවත්වාගෙන යනු ලබන අංක 057100179027275 දරණ ගිණුමට දිවයිනේ ඕනෑම මහජන බැංකුවකින් මුදල් බැර කිරීමෙන් ලබා ගන්නා ලදුපත අයදුම් පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ එක් දාරයකින් ඇලවිය යුතු ය. තවද එහි ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ද ප්‍රයෝජනවත් විය හැක. කිසිදු හේතුවක් නිසා මෙම ගාස්තුව ආපසු ගෙවනු නොලැබේ.

14. අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතු ය.

15. මෙහි සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා මාධ්‍යයන්ගෙන් පළවන නිවේදනයන්හි භාෂා පාඨ අතර කිසියම් නොගැළපීමක් හෝ අනනුකූලතාවක් ඇත්නම් එවැනි විටක දී සිංහල මාධ්‍ය නිවේදනය බලාත්මක වේ.

වෛද්‍ය **බී. එස්. එස්. පෙරේරා,**
අධ්‍යක්ෂ ජනරාල් (*වැ.බ.*).

2026 මැයි මස 19 දින,
සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව.
තැ. පෙ. 13, ගැටඹේ, පේරාදෙණිය.

**ආදර්ශ අයදුම්පත**

**කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය**

**සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව**

**ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ නිලධාරින් සඳහා**
**දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2026 (II)**

**THE SECOND EFFICIENCY BAR EXAMINATION FOR OFFICERS IN SRI LANKA ANIMAL PRODUCTION AND HEALTH SERVICE – 2026 (II)**

(විභාගයේ නම ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ සඳහන් කළ යුතු ය)

නිලධාරියා විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය : සිංහල - 2 ☐
දෙමළ - 3
ඉංග්‍රීසි - 4 (අදාළ අංකය කොටුව තුළ ලියන්න)

01. (i) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්): ..........................................................................................
..........................................................................................
(උදා: HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA)

(ii) අගට යෙදෙන නම මුලින් ද අනෙකුත් නම්වල මුලකුරු පසුව ද යොදා නම:
(ඉංග්‍රීසි කැපිටල්අකුරෙන්) ..........................................................................................
(උදා: GUNAWARDHANA H.M.S.K.)

(iii) සම්පූර්ණ නම (සිංහලෙන් /දෙමළෙන්) : ..........................................................................................

02. (i) ලිපිනය (ප්‍රවේශ පත්‍ර එවීම සඳහා): ..........................................................................................
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

(ii) කාර්යාලීය ලිපිනය :..........................................................................................

03. ස්ත්‍රී/පුරුෂ භාවය :

ස්ත්‍රී - 1 ☐
පුරුෂ - 0
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

04. ජාතික හැඳුනුම්පත් අංකය :

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | |

**05.** ජංගම දුරකථන අංකය :

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |

06. නිවේදනයේ 04 ඡේදයේ දක්වා ඇති, විෂය අංක සහිතව පෙනී සිටීමට අපේක්ෂිත විෂයයන් (පැහැදිලිව සඳහන් කළ යුතු ය)

| ***විෂයය*** | ***විෂය අංකය*** |
|---|---|
| | |
| | |
| | |
| | |

07. මීට ප්‍රථම මෙම විභාගයට මුළුමනින්ම හෝ කොටසක් වශයෙන් හෝ පෙනී සිට ඇත්දැයි සඳහන් කරන්න. එසේ නම් විෂයන් ද වර්ෂය හා මාසය ද සඳහන් කරන්න.
.......................................................................................................................................................

| 08. උපන් දිනය : | වර්ෂය : | | | | | මාසය : | | | දිනය : | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|

09. පදවි නාමය: ……........................................................ (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

දෙපාර්තමේන්තුවේ නම : .............................................. (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

10. ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවාවට පත් කරන ලද දිනය : . . . . . . . . . . . . . . .

11. ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ II ශ්‍රේණියට උසස් කරන ලද දිනය හා එම ලිපියේ අංකය : ……………………………………………………………………….

ඉහත දැක්වෙන විස්තර නිවැරදි බවත්, ඉල්ලුම්පත්‍රයේ ඉහළින් දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් මෙම විභාගයට පෙනී සිටීමට හිමිකම් ඇති බවත් ප්‍රකාශ කරමි.

තවද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් විසින් පනවනු ලබන නීතිරීති වලට හා විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන ජාතික මට්ටමේ විභාග සඳහා අදාළ වන සියළුම නීති රීති වලට මම යටත් වන බවද ප්‍රකාශ කරමි.

ගෙවන ලද විභාග ගාස්තුව : රු. ……………………………
ගෙවන ලද කාර්යාලය : ..................................... ලදුපත් අංකය : ...........................................

| ලදුපත ඇලවීම සඳහා<br>(ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගන්න) |
|---|

දිනය : ................................. අපේක්ෂකයාගේ අත්සන : .......................

.................................................. මගින්,
අධ්‍යක්ෂ ජනරාල්, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව.

මෙම අයදුම්පත්‍රය ඉදිරිපත් කරන . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . මයා/මිය/මෙය මෙම අමාත්‍යාංශයේ /දෙපාර්තමේන්තුවේ/ ආයතනයේ . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .ලෙස සේවය කරන අතර, ඔහුගේ/ඇයගේ අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි. මෙම විස්තර දැක්වෙන අපේක්ෂකයාට/අපේක්ෂිකාවට මෙම විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ඇති බවත්, ඔහු/ඇය විසින් දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් මෙම විභාගයට පෙනී සිටීමට ඔහුට/ඇයට සුදුසුකම් ඇති බවත් මම සහතික කරමි.

**අපේක්ෂකයා/අපේක්ෂිකාව නියමිත විභාග ගාස්තුව ගෙවා ලබාගත් ලදුපත අලවා ඇති බව ද සහතික කරමි.

අපේක්ෂකයාගේ අත්සන සහතික කරමි.

දිනය ........................................

(**ගාස්තුව නොගෙවන විට දී කපා දැමිය යුතුය)

* දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන
හා පදවි නාමය,
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න.)

**(* අත්සන සහතික කිරීම :- අයදුම්කරු අනුයුක්ත අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/පළාත් සභාවේ/නගර සභාවේ/අංශයේ ප්‍රධානියා විසින් කළ යුතු ය.)**

05 - 441

**කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය.**

සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව.

**ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ නිලධාරින් සඳහා තුන්වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2026 (II)**

ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ නිලධාරින් I ශ්‍රේණියට උසස් වී වසර 05ක් ගතවීමට පෙර සමත් විය යුතු තුන්වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය **2026 ජූලි මස මහනුවර** දී පැවැත්වීමට අපේක්ෂා කරන බව මෙයින් දැනුම් දෙනු ලැබේ. මේ සඳහා ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ පළමු ශ්‍රේණියට උසස් වී ඇති නිලධාරින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. විභාග පිළිබඳ විස්තරය - 2013.12.13 දිනැති අංක 1840/51 දරන අති විශෙෂ *ගැසට්* පත්‍රයේ පළ කරන ලද ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ සේවා ව්‍යවස්ථාවේ 08 ඡේදයේ විධිවිධාන අනුව එහි 05 පරිශිෂ්ටයෙහි සඳහන් ආකාරයට විභාගය පිළිබඳ විස්තරය පහත දැක්වේ.

**විභාගය පිළිබඳ විස්තර :**

| *ප්‍රශ්න පත්‍රය* | *කාලය* | *මුළු ලකුණු* | *සමත් ලකුණු* |
|---|---|---|---|
| කළමනාකරණය | පැය 03 | 100 | 40 |

03. විභාගය සඳහා වන විෂය නිර්දේශය :

| *ප්‍රශ්න පත්‍රයේ නම* | *විෂය නිර්දේශය* |
|---|---|
| කළමනාකරණය | 01 කළමනාකරණ මූලධර්ම<br>02 කළමනාකරණ ශ්‍රිතයන්<br>03 කළමනාකරණ පරිසරය<br>04 සහභාගිත්ව කළමනාකරණය<br>05 මහජන සම්බන්ධතා<br>06 යහ පාලනය<br>07 ආචාර ධර්ම |

04. මෙම විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පමණක් පවත්වනු ලැබේ. අයදුම් කිරීමේදී ඉල්ලුම් කරන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

05. අයදුම් පත්‍ර අමුණා ඇති ආකෘතියට අනුව A4 ප්‍රමාණයේ කඩදාසියක දෙපසම භාවිතා කරමින් සකස් කොට ඉදිරිපත් කළ යුතු ය. ශීර්ෂ අංක 01 සිට 06 තෙක් පළමුවන පිටුවට ද ඉතිරිය දෙවන පිටුවට ද වන ලෙස සකස් කළ යුතු වේ. අයදුම්පත්‍රය සම්පූර්ණ කිරීම තම අත් අකුරින්ම පැහැදිලිව කළ යුතු වේ.

06. එම අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. තව ද සම්පූර්ණ කරනු ලබන අයදුම්පත්‍රය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පතට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු විසින්ම පරීක්ෂා කොට තහවුරු කර ගත යුතු ය. ආදර්ශ අයදුම්පතට අනුකූල නොවන හෝ අසම්පූර්ණ හෝ අයදුම්පත් කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත්‍රය පිළියෙල කර ගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්‍රවල සිංහල භාෂාවට අමතරව ඉංග්‍රීසි භාෂාවෙන් ද දෙමළ අයදුම්පත්‍රවල දෙමළ භාෂාවට අමතරව ඉංග්‍රීසි භාෂාවෙන් ද සටහන් කළ යුතු ය.

07. ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ සේවා ව්‍යවස්ථාවට අනුව උක්ත සඳහන් විභාගය පවත්වනු ලබන බලධාරියා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරයා වන බැවින්, විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පනවනු ලබන නීති රීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වන අතර, විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් පවත්වනු ලබන ජාතික මට්ටමේ විභාග සඳහා අදාළ වන සියළුම නීති රීති මෙම විභාගය සඳහා ද අදාළ වේ. එම නීති රීති උල්ලංඝනය කළහොත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පනවනු ලබන ඕනෑම දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

08. ඉල්ලුම් පත්‍ර **2026.06.30** දිනට හෝ ඊට ප්‍රථම අධ්‍යක්ෂ ජනරාල්, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව වෙත ලැබෙන පරිදි පහත සඳහන් ලිපිනයට දෙපාර්තමේන්තු ප්‍රධානි මාර්ගයෙන් ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. එදිනට පසුව ලැබෙන ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ:

අධ්‍යක්ෂ ජනරාල්
සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව,
තැ.පෙ. 13,
ගැටඹේ,
පේරාදෙණිය.

09. පළමුවන වරට මෙම විභාගයට පෙනී සිටින නිලධාරින් සඳහා කිසිදු විභාග ගාස්තුවක් අය නොකෙරේ. එතකුදු වුව ද දෙවන වර හෝ ඊට වැඩි වාර ගණනක් පෙනී සිටින නිලධාරින් විසින් විභාග ගාස්තු ලෙස රු. 600/= ක් ගෙවිය යුතු වේ. එම විභාග ගාස්තුව සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරයා නමින් 2003-99-00 යන දෙපාර්තමේන්තු ශීර්ෂයට බැරවන සේ දෙපාර්තමේන්තුවේ සරප් අංශය වෙත ගෙවා ලබා ගන්නා ලදුපත හෝ සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල්වරයා නමින් පේරාදෙණිය මහජන බැංකුවේ පවත්වාගෙන යනු ලබන අංක 057100179027275 දරන ගිණුමට දිවයිනේ ඕනෑම මහජන බැංකුවකින් මුදල් බැර කිරීමෙන් ලබා ගන්නා ලදුපත අයදුම් පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ එක් දාරයකින් ඇලවිය යුතු ය. තව ද එහි ඡායා පිටපතක් ළග තබා ගැනීමද ප්‍රයෝජනවත් විය හැක. කිසිදු හේතුවක් නිසා මෙම ගාස්තුව ආපසු ගෙවනු නොලැබේ.

10. විභාග ගාස්තු ගෙවීම අදාළ වේ නම් විභාග අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පෙර එම මුදල ගෙවා ඊට අදාළ ලදුපත ද සමඟ විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍ය සඳහන් කොට අයදුම්කරුගේ අත්සන හා දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය ද සහිතව නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමු කළ යුතු ය. *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත, අයදුම්පත් යොමු කර ඇති අයදුම්කරුවන් වෙත සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත.

11. අයදුම්කරුවන් වෙත විභාග ප්‍රවේශපත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් නිවේදනයක් දෙපාර්තමේන්තු නිල වෙබ් අඩවියේ ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව මඟින් පළ කරනු ඇත. නිවේදනය පළවී දින තුනක් ගත වූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණු අපේක්ෂකයෙක් වේ නම් දැන්වීමේ සඳහන් ආකාරයට අයදුම්කරුගේ නම, ලිපිනය, ජාතික හැඳුනුම්පත් අංකය හා ෆැක්ස් අංකය හෝ ඊ මේල් ලිපිනය සඳහන් කර ඒ පිළිබඳව සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව වෙත වහාම දන්වා සිටිය යුතු ය. අවශ්‍ය වුවහොත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් ඉල්ලා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා ඔබ ළඟ තබාගත් සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් හා විභාග ගාස්තු ගෙවීම අදාළ නම් එම ලදුපතෙහි ඡායා පිටපතක් සහ අයදුම්පත්‍රය තැපැල් කිරීමේ දී ලියාපදිංචි කරන ලද කුවිතාන්සිය ද සූදානමින් තබා ගැනීම වඩාත් ඵලදායි වනු ඇත.

12. ඉහත 11 ඡේදයේ සඳහන් කර ඇති අවශ්‍යතාවයන් සපුරාලීමට අපොහොසත්වන අපේක්ෂකයින් විසින් පසුව ඉදිරිපත් කෙරෙන කිසිදු ලියවිල්ලක් සලකා බලනු නොලැබේ.

13. ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන විභාගවල දී විභාග අපේක්ෂකයාගේ අනන්‍යතාව, විභාග ශාලාධිපති වෙත තහවුරු කිරීම සඳහා පිළිගනු ලබන්නේ ජාතික හැඳුනුම්පත හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රය හෝ වලංගු රියදුරු බලපත්‍රය හෝ පමණකි. ඉල්ලුම්පත්‍රයේද විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේ ද අයදුම්කරුගේ අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියෙකු ලවා සහතික කර තිබිය යුතු ය. අපේක්ෂකයකු තමාට නියම කර ඇති විභාග ශාලාවේ දී නියමිත විභාග අංකය යටතේ විභාගයට පෙනී සිටිය යුතු අතර විභාග දින තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය විභාග ශාලාධිපති වෙත භාර දිය යුතුය. තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අපේක්ෂකයකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

14. එමෙන්ම විභාග අපේක්ෂකයින් අනන්‍යතාව තහවුරු කර ගත හැකි වන පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතුය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් විභාග බලධාරීන්ට අයදුම්කරු හඳුනා ගත හැකි පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතු ය.

15. අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැළකිය යුතු ය.

16. මෙහි සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා මාධ්‍යයන්ගෙන් පළවන නිවේදනයන්හි භාෂා පාඨ අතර කිසියම් නොගැළපීමක් හෝ අනනුකූලතාවක් ඇත්නම් එවැනි විටක දී සිංහල මාධ්‍ය නිවේදනය බලාත්මක වේ.

වෛද්‍ය බී.එස්.එස්. පෙරේරා,
අධ්‍යක්ෂ ජනරාල් (වැ.බ.).

2026 මැයි මස 19 දින,
සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව.

**ආදර්ශ අයදුම්පත**

**කෘෂිකර්ම, පශු සම්පත්,ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය.**

**සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව**

**ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ නිලධාරීන් සඳහා**
**තුන්වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2026 (II)**

**THE THIRD EFFICIENCY BAR EXAMINATION FOR OFFICERS IN THE SRI LANKA ANIMAL PRODUCTION AND HEALTH SERVICE – 2026 (II)**

(විභාගයේ නම ලිපි කවරයේ වම් පස ඉහළ කෙළවරේ සඳහන් කළ යුතු ය)

නිලධාරියා විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය : සිංහල - 2 / දෙමළ - 3 / ඉංග්‍රීසි - 4 (අදාළ අංකය කොටුව තුළ ලියන්න) [ ]

01. (i) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :
..........................................................................................................................
(උදා: HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA)

(ii) අගට යෙදෙන නම මුලින්ද, අනෙකුත් නම්වල මුලකුරු පසුවද යොදා නම:
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) ..........................................................................................................................
(උදා: GUNAWARDHANA H.M.S.K.)

(iii) සම්පූර්ණ නම (සිංහලෙන් /දෙමළෙන්) : ..........................................................................................................

02. (i) ලිපිනය (ප්‍රවේශපත්‍ර එවීම සඳහා) : ……………………………………………
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
(ii) කාර්යාලීය ලිපිනය :........................................................

03. ස්ත්‍රී/පුරුෂ භාවය : (අදාළ අංකය කොටුව තුළ ලියන්න)
ස්ත්‍රී - 1
පුරුෂ - 0 [ ]

04. ජාතික හැඳුනුම්පත් අංකය :

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | |

05. ජංගම දුරකථන අංකය:

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |

06. මීට ප්‍රථම මෙම විභාගයට පෙනී සිට ඇත්දැයි සඳහන් කරන්න. එසේ නම් වර්ෂය හා මාසය ද සඳහන් කරන්න.
..........................................................................................................................

07. උපන්දිනය :

| **වර්ෂය :** | | | | | **මාසය :** | | | **දිනය :** | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|

08. පදවි නාමය : ................................................................................ (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

09. දෙපාර්තමේන්තුවේ නම : .................................................. (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

10. ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ 1 ශ්‍රේණියට උසස් කරන ලද දිනය හා එම ලිපියේ අංකය : ............................ ................................................................................................................

ඉහත දැක්වෙන විස්තර නිවැරදි බවත්, ඉල්ලුම්පත්‍රයේ ඉහළින් දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් මෙම විභාගයට පෙනී සිටීමට හිමිකම් ඇති බවත් ප්‍රකාශ කරමි.

තවද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට හා විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන ජාතික මට්ටමේ විභාග සඳහා අදාළ වන සියලුම නීති රීතිවලට මම යටත් වන බවද ප්‍රකාශ කරමි.

ගෙවන ලද විභාග ගාස්තුව : රු..............................
ගෙවන ලද කාර්යාලය ............................................ රිසිට්පත් අංකය : ...........................................

| ලදුපත ඇලවීම සඳහා<br>(ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගන්න) |
|---|

දිනය : .................................... අපේක්ෂකයාගේ අත්සන : .................................

---

..........................................................................මඟින්,

අධ්‍යක්ෂ ජනරාල්, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව.

මෙම අයදුම්පත්‍රය ඉදිරිපත් කරන . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . මයා/මිය/මෙය මෙම අමාත්‍යාංශයේ /දෙපාර්තමේන්තුවේ/ ආයතනයේ . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .ලෙස සේවය කරන අතර, ඔහුගේ/ඇයගේ අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි.

මෙම විස්තර දැක්වෙන අපේක්ෂකයාට/අපේක්ෂිකාවට මෙම විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ඇති බවත්, ඔහු/ඇය විසින් දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් මෙම විභාගයට පෙනී සිටීමට ඔහුට/ඇයට සුදුසුකම් ඇති බවත් මම සහතික කරමි.

**අපේක්ෂකයා/අපේක්ෂිකාව නියමිත විභාග ගාස්තුව ගෙවා ලබාගත් ලදුපත අලවා ඇති බව ද සහතික කරමි.

අපේක්ෂකයාගේ අත්සන සහතික කරමි.

දිනය ........................................ * ආයතන ප්‍රධානියාගේ අත්සන හා පදවි නාමය,

(** ගාස්තුව නොගෙවන විට දී කපා දැමිය යුතුය) (නිල මුද්‍රාවෙන් සහතික කරන්න.)

**(* අත්සන සහතික කිරීම - අයදුම්කරු අනුයුක්ත අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ /පළාත් සභාවේ / නගර සභාවේ / අංශයේ ප්‍රධානියා විසින් කළ යුතු ය.)**

05 - 442

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.